
කොවිඩ් ව්‍යාප්තිය



★ දිනමිණ

The Dinamina | 1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත | දිනමිණ






සදාකාලික පත්තර තාරුණ්‍යය අද පත්‍රය සමඟ



ශ්‍රී බුඩ වෂ් 2564ක් වූ අධි වප් පුර දියවක ලත් ශනි දින | කාණ්ඩය 111 | පත්‍රය 236 | පිටු 16 | මිල රු.30 | web: www.dinamina.lk | ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ පුවත් පතකි | 2020 සැප්තැම්බර් 19 සෙනසුරාදා


# Ceylon Tea නම පළුදු කරන්න එපා

## ජනපති තේ කර්මාන්තශාලා හිමියන්ට කියයි

දීර්ඝ කාලයක සිට ලොව සියලු රටවල් අතර ඉමහත් ආකර්ෂණයට ලක්ව ඇති Ceylon Tea නාමයට හානි වීමට ඉඩ නොදෙන්නැයි ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා තේ කර්මාන්තශාලා හිමියන්ගෙන් ඊයේ (18) ඉල්ලීමක් කළේය. පිට 06

## 2019 ඔක්. 26 ව්‍යවස්ථා අර්බුදයෙන් පසු

# රාජ්‍ය බුද්ධි අංශය දේශපාලන ඔත්තු සේවාවක් වුණා

## හිටපු ආරක්ෂක ලේකම් හේමසිරි පාස්කු කොමිසමට කියයි

සුභාෂිණී සේනානායක

ඉකුත් 2019 වසරේ ඔක්තෝබර් මස 26 වැනි දා ඇති වූ ව්‍යවස්ථා අර්බුදයෙන් පසු මෙරට රාජ්‍ය බුද්ධි සේවාව දේශපාලන ඔත්තු බලන සේවාවක් බවට පත් වී තිබූ බව හිටපු ආරක්ෂක ලේකම් හේමසිරි ප්‍රනාන්දු මහතා පාස්කු දා ප්‍රහාරය පිළිබඳ සොයා බැලීමට පත් කළ ජනාධිපති කොමිසම හමුවේ ඊයේ (18) කියා සිටියේය. පිට 06

## ආනවිළුන්දාව පරිසර විනාශය

# ආරච්චිකට්ටුව හිටපු සභාපති ගැන විමර්ශනය කර වරෙන්තු ලබා ගන්න

## අධිකරණයෙන් පොලීසියට නියෝග

ආරච්චිකට්ටුව සමූහ

ආනවිළුන්දාව කරුලු අභය භූමියේ කඩොලාන පද්ධතිය විනාශ කිරීමේ සිද්ධියට ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාවේ හිටපු සභාපති ජගත් සමන්ත මහතා සම්බන්ධ දැයි විමර්ශනය කරන ලෙසත්, ඔහු එම පරිසර විනාශයට සම්බන්ධ බවට කරුණු ආනාවරණය වුව හොත් අධිකරණයට දන්වා වරෙන්තුවක් ලබා ගන්නා ලෙසත් හලාවත මහේස්ත්‍රාත් හා දිසා විනිසුරු මංජුල රත්නායක මහතා ඊයේ (18) පොලීසියට නියෝග කළේය. පිට 06

# වෙන්නප්පුව සභාපති දංකොටුවේ රජයේ ඉඩමක ගස් කපලා

- ගම්මුන්ගේ දැඩි විරෝධය
- ගස් කපන තෙක් ප්‍රා. ලේකම් දැනගෙන නෑ
- ප්‍රවාහනය නවතී
- ගස් ග්‍රාමනිලධාරී යටතට



ප්‍රසාද් පූර්ණමාල් - පුත්තලම දිසා සමූහ

රජයට අයත්, දංකොටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ඉඩමක ගස් කිපයක් වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගේ නියෝගයෙන් කපා ප්‍රවාහනය කිරීමට සූදානම් වූ අවස්ථාවේ ගම් වැසියන් පිරිසක් ඊට විරෝධය පළ කිරීම හේතුවෙන් අතරමග නතර කිරීමට සිදු වී තිබේ. පිට 06



ශ්‍රී ලංකා පොත් ප්‍රකාශකයන්ගේ සංගමය, සාහිත්‍ය මාසය නිමිත්තෙන් වාර්ෂිකව සංවිධාන කරන කොළඹ අන්තර්ජාතික පොත් ප්‍රදර්ශනය බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයේදී ඊයේ (18) ආරම්භ විය. අඛණ්ඩව 22 වැනි වරටත් පැවැත්වෙන මෙම ප්‍රදර්ශනය මේ මස 27 දින දක්වා පැවැත්වේ.
*ඡායාරූපය - රංජිත් අසංක*

# අගමැති මෝදිගේ උපන්දිනයට ජනපති-අගමැති සුබ පතති



මහින්ද අලුත්ගෙදර

ඉන්දීය අගමැති නරේන්ද්‍ර මෝදි මහතාගේ 70 වැනි ජන්ම දිනය වෙනුවෙන් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ සහ අගමැති මහින්ද රාජපක්ෂ මහත්වරුන් සිය සුබ පැතුම් එක් කර තිබේ. පිට 06

# වීදුරු බව හඟවා කෝටි 11ක කහ ගෙන්නලා

## ලොරිවලට පටවමින් සිටි දහයක් අත්අඩංගුවට

අසේල ලියනගේ

ඩුබායිහි සිට වීදුරු ආනයනය කරන මුවාවෙන් රුපියල් කෝටි 11කට අධික වටිනාකමක් ඇති කහ තොගයක් කන්ටේනර් තුනක සඟවා මෙරටට ආනයනය කර තිබේ. පිට 06

# පොලීසියට පහර දුන් සැක හතරක් 22 දා තෙක් රිමාන්ඩ්

## සැඟව සිටීමට උදවු කළ පිය-පුතු දෙපළත් රක්ෂිතයට

බළන්ගොඩ විශේෂ - සම්පත් ප්‍රියනන්දන

බණ්ඩාරගම අටුළුගම ප්‍රදේශයේදී පොලීසියට පහර දිමේ සිද්ධියට බළන්ගොඩ ප්‍රදේශයේදී අත්අඩංගුවට ගත් සිව්දෙනකු ලබන 22 වැනි දා දක්වා රක්ෂිත බන්ධනාගාර ගත කරන ලෙස බළන්ගොඩ මහෙස්ත්‍රාත් ජයරුවන් දිසානායක මහතා ඊයේ (18) නියෝග කළේය. පිට 06

පිට 06 ▶

## කෝප්-කෝපා 22-23 රැස් වෙයි

## කාලගුණයෙන් රතු නිවේදනයක්

## ඉංජිනේරු පීඨවලට සිසුන් 405ක් වැඩිපුර ගනී

## ආණ්ඩුවේ පිරිස් පරිසරය විනාශ කර, එය සාධාරණීකරණය කරනවා

මන්ත්‍රී විජිත හේරත්

# තමිල්නාඩුවට පැන්න

## සීසීඩී කොස්තාපල් කොයිම්බතූර් අපරාධ කොට්ඨාසයට

මහින්ද අලුත්ගෙදර

මත්ද්‍රව්‍ය ජාවාරම සම්බන්ධයෙන් සොයමින් සිටියදී තමිල්නාඩුවට පලා ගිය කොළඹ අපරාධ කොට්ඨාසයට අනුයුක්තව සේවය කළ පොලිස් කොස්තාපල්වරයා වැඩිදුර පරීක්ෂණ සඳහා කොයිම්බතූර් අපරාධ පරීක්ෂණ කොට්ඨාසයට බාර දී තිබේ. පිට 06

# දෙමටගොඩ චමින්දගේ මවට

## කුඩු ගන්න උදවු දුන් නියාමකවරිය ගැන විමර්ශන

බුද්ධිකා ඉඹුලාන

වැලිකඩ කාන්තා බන්ධනාගාරයේ රඳවා සිටින, දෙමටගොඩ චමින්දගේ මවට මත්ද්‍රව්‍ය තොගයක් ලබා දීමට පහසුකම් සැපයුවේ යැයි කියන බන්ධනාගාර නියාමකවරියකට එරෙහිව බන්ධනාගාර බුද්ධි අංශය පරීක්ෂණයක් ආරම්භ කර තිබේ. පිට 06

# විස්සට එරෙහිව සජබය මේ මස අගදී අධිකරණට

ශිවන්ති ප්‍රනාන්දු

විසි වැනි ව්‍යවස්ථා සංශෝධනයට එරෙහි අධිකරණ ක්‍රියාමාර්ග වෙත මේ මස අවසන් වීමට ප්‍රථමයෙන් යොමු වීමට සමගි ජන බලවේගය සැලසුම් කර තිබේ. පිට 06

## තිළිණගේ ආරක්ෂකයාට වරෙන්තු පිට 06

# මෝල් හිමියන් සහල් හිඟයක් මවා මිල වැඩි කරන්න හදනවා

## ඇමැති බන්දුල ගුණවර්ධන

මානෙල් පුෂ්ප කුමාරි

සහල් හිඟයක් ඇති බව මවාපාමින් මෝල් හිමියන් සහල් මිල ඉහළ නංවා ගැනීමට බලාපොරොත්තු වන බව වෙළෙඳ ඇමැති ආචාර්ය බන්දුල ගුණවර්ධන මහතා පැවසීය. පිට 06




# විශ්‍රාමික මේජර් ප්‍රසන්නගේ ඇප පෙත්සම ඉවතට

නෙල්කා මැදගෙදර

කොටුව මහේස්ත්‍රාත් අධිකරණය හමුවෙහි විභාග වන නඩුවක සාක්කිකරුවන්ට සහ වින්දිතයන්ට බලපෑම් කිරීමේ චෝදනාව මත කොළඹ මහේස්ත්‍රාත් අධිකරණය රක්ෂිත බන්ධනාගාරගත කර සිටින පිට 06

# කුඩු වෙනුවට වේදනා නාශක පෙති විකිණූ යුවළ දැලේ

සිගිරිය විශේෂ

මත් කුඩුවලට ඇබ්බැහි වූවන්ට කුඩු වෙනුවට වේදනා නාශක පෙති අලෙවි කළ ජාවාරමක නිරත වූ කාන්තාවක සහ තරුණයකු දඹුල්ල නගරයේ පෙරේදා (17) අත්අඩංගුවට ගෙන ඇත.

ඔවුන් සතුව තිබී වර්ග හයකින් යුත් පෙති අටසිය විසි තුනක් වැටලීමේදී සොයා ගත් බව පොලීසිය පැවසීය. පිට 06

## යහපාලනය ජනතාවට දුන් සහනයක් නෑ

# වත්මන් ආණ්ඩුව ගේන අයවැයෙන් ජනතාවට සහන රැසක් ලැබෙනවා

### රාජ්‍ය ඇමැති ෂෙහාන් සේමසිංහ

**නොච්චියාගම - ගුණරත්න පෙරේරා**

නොවැම්බර් මාසයේ පාර්ලිමේන්තුවට ගෙන එන වත්මන් රජයේ නව අය-වැය මගින් ජනතාවට සහනදායි හා සුබදායි අයවැයක් ඉදිරිපත් කිරීමට කටයුතු කරනවා. යහපාලනය විසින් දිගින් දිගටම ජනතාවට බදු ගහල ගත්ත මුදල් ඒ අයගේ සුඛවිහරණයට යොදා ගත්තා මිස ජනතාවට ලැබුණු සහනයක් නැහැ. මහින්ද රාජපක්ෂ මහත්තයා ආණ්ඩුව භාර දෙනකොට තිබුණු විදේශ ණය සියයට පනහකින් ඉහළ ගියා. දේශිය ණය ඉහළ ගියා. නමුත් මේ ණය අරගෙන ජනතාවට කරපු දෙයක් නැහැ. මොන තරම් ආර්ථික අපහසුතා තිබුණත් ජනාධිපති හා අගමැතිගේ උපදෙස් මත අනිවාර්යයෙන් ජනතාවට නොවැම්බර් මාසයේ එන අයවැයෙන් සහන ලබාදන්න කටයුතු කරනවායැයි සමෘද්ධි ,ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය කටයුතු පිළිබඳ රාජ්‍ය ඇමැති ෂෙහාන් සේමසිංහ මහතා පැවසීය.

රාජ්‍ය ඇමැතිවරයා මේ බව සඳහන් කළේ පසුගියදා උතුරු මැද පළාත් සභා ශ්‍රවණාගාරයේ පැවති අනුරාධපුර දිස්ත්‍රික් සංවර්ධන කමිටු රැස්වීමෙන් අනතුරුව මාධ්‍යවේදීන් හමු වූ අවස්ථාවේදීය.

එහිදී තවදුරටත් රාජ්‍ය ඇමැතිවරයා මෙසේ ද පැවසීය. මෙවර ඉදිරිපත් කරන අයවැයෙන් ජනාධිපති- අගමැතිගේ මුළු රාජ්‍ය පාලන කාලයේ ක්‍රියාත්මක කෙරෙන ජනතාව ඉලක්ක කරගත් සංවර්ධන ව්‍යාපෘති රැසක් ක්‍රියාවට නැංවීමට අවශ්‍ය මූලික අඩිතාලම වැටෙනවා.

2015 පසු බලයට ආ යහපාලන රජය එදා මහින්ද රාජපක්ෂ රජය විසින් ආරම්භ කළ සියලු ව්‍යාපෘති නතර කිරීමත් ඇතැම් ව්‍යාපෘති දේශපාලන ඕනෑ එපාකම් මත වෙනස් කිරීමත් නිසා සිදු වී තිබෙන විනාශය සුළු පටු එකක් නොවෙයි. අනුරාධපුර දිස්ත්‍රික් සංවර්ධන කමිටුවේදී හෙළි වුණ කරුණු අනුව රාජ්‍ය නිලධාරීන් පවා මොනතරම් අපහසුතාවට පත් වෙලාද කියා හැමකෙනෙක්ම දැක්කා. මේක අනුරාධපුර පමණක් නොවෙයි රටේ හැමතැනම සිද්ධ වෙලා තියෙන්නේ ඒකයි.

වසර පහක් පුරා සංවර්ධනය නැවතිලා තිබුණා. මේ වන විට ගොවිතැනට අවශ්‍ය ජලය හිඟයකින් තොරව ලබාදීම හා ලංකාව පුරා සියලු දෙනාට පිරිසුදු පානීය ජලය ලබාදීමේ අභියෝගය ජනාධිපති ගෝඨාභය රාජ පක්ෂ මහතා භාරගෙන තිබෙනවා.

එදා මහින්ද රාජපක්ෂ මහතාගේ රජය යටතේ සියලු ව්‍යාපෘති ක්‍රියාත්මක වුණේ ප්‍රායෝගික හා තාක්ෂණික දැනුම මත සැලසුම් කරලයි. ඒ පිළිබඳ කිසිම දැනුමක් නැතිව මහින්ද මහත්තයාගෙන් පළිගන්න ඒ ව්‍යාපෘති නතර කළා. හිතුමතේ ඒ සැලසුම් වෙනස් කළා. මේ රටට සිදු වූ විනාශය සුළුපටු නැහැ. ඒවා නිවැරදි කරමින් සංවර්ධනය නැවතුණු තැනින් යළි පටන් ගන්න මේ රජයට සිදු වෙලා තියෙනවායැයිද පැවසීය.

## කොළඹ කොටස් වෙළෙඳපොළේ

# ලැයිස්තුගත සමාගම් සංඛ්‍යාව ඉහළ නංවාගැනීමට හැකි වේවි

### රාජ්‍ය ඇමැති අජිත් නිවාඩ් කබ්රාල්



**මහින්ද අලුත්ගෙදර**

කොළඹ කොටස් වෙළෙඳපොළේ ලැයිස්තුගත සමාගම් සංඛ්‍යාව ඉදිරි වසර පහේදී 500ක් දක්වා ඉහළ නංවා ගැනීමට කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුවට හැකියාව ඇති බව මුදල්, ප්‍රාග්ධන වෙළෙඳපොළ සහ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය ඇමැති අජිත් නිවාඩ් කබ්රාල් මහතා පවසයි.

ආර්ථික තත්ත්වයට රටේ ඉදිරි ගමන වෙනුවෙන් වත්මන් රජය විසින් දැවැන්ත වැඩ කොටසක් අපේක්ෂා කරන බව පවසන ඒ මහතා ඒ වෙනුවෙන් සැලසුම් සකස් කර තිබෙන බව ද රටේ ආර්ථිකය ඉදිරියට ගෙනයාම වෙනුවෙන් කොටස් වෙළෙඳපොළෙන් ලැබෙන දායකත්වය ඉතා විශාල බවද පෙන්වා දෙයි.

කොළඹ කොටස් වෙළෙඳපොළ ගනුදෙනු පරිශ්‍රයේ දී පැවති කොටස් වෙළෙඳපොළ ඩිජිටල්කරණ ක්‍රමවේදය ජනගත කිරීමේ උත්සවයට එක්වෙමින් රාජ්‍ය ඇමැතිවරයා මේ බව කියා සිටියේය.

වසර ගණනාවක් පුරා කොළඹ කොටස් වෙළෙඳපොළේ ඇති සමාගම් ප්‍රමාණය එකම මට්ටමක තිබෙන බව පෙන්වා දෙන රාජ්‍ය ඇමැතිවරයා පසුගිය වසර 30 තුළ කොටස් වෙළෙඳපොළේ සමාගම් කොපමණ තිබෙනවාදැයි අසන හැම අවස්ථාවකම දෙසිය ගණනක ඉලක්කමක් ප්‍රකාශ කරන නමුත් ඊළඟ වසර 5දී පන්සිය ගණනක ඉලක්කමක් කතා කරන්න හැකි වෙතැයි විශ්වාසය පළ කළේය.

මේ ඉලක්කය කරා ගමන් කිරීමේ හැකියාව තිබෙන බව සඳහන් කළ ඒ මහතා 2014 වසර අවසාන වනවිට කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුවේ වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය ඩොලර් බිලියන 25ක් බවද 2019 වසර අවසානය වනවිට එම අගය එයින් භාගයක මට්ටමට පැමිණි බවද සිහිපත් කළේය.

ඒ අනුව එම අගය ඩොලර් බිලියන 12.5ක් වූ බව පෙන්වා දුන් රාජ්‍ය ඇමැති අජිත් නිවාඩ් කබ්රාල් මහතා එය දැවැන්ත කඩාවැටීමක් බවද පෙන්වා දුන්නේය.

## වෙළෙඳ ප්‍රදර්ශනයක් හා ජංගම සේවයක් 26, 27

# දෙබරවැව ජාතික පාසලේදී

හම්බන්තොට දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය පරිපාලනයට අයත් වන සේවා තවදුරටත් මහජනතාවට සමීප කිරීමේ අරමුණින් ප්‍රාදේශීය ජංගම සේවා වැඩසටහනක් සහ වෙළෙඳ හා කර්මාන්ත ප්‍රදර්ශනයක් මේ මස 26,27 දෙදින පුරා දෙබරවැව ජාතික පාසලේදී පැවැත්වේ. මේ වැඩසටහන යටතේ ප්‍රදේශයේ පුද්ගලයන් 4000කට පමණ එක් දිනකින් සේවා සැපයීමට බලාපොරොත්තු වන බවද දකුණු පළාත් ආණ්ඩුකාර විලී ගමගේ මහතා පවසයි.

## 'ඊළාම් මිථ්‍යාව හෙළිදරව් කිරීම'

# කෘතිය එළිදැක්වීම 22දා




නීතිඥ එල්.කේ.එන්. පෙරේරා මහතා විසින් රචනා කරන ලද 'ඊළාම් මිථ්‍යාව හෙළිදරව් කිරීම' (EELAM EXPOSED) කෘතිය එළි දැක්වීමේ උත්සවය මේ මස 22 වැනි දින ප.ව. 3.00ට කොළඹ මහජන පුස්තකාල ශ්‍රවණාගාරයේදී පැවැත්වේ. ඊළාම් අරගලය එහි මිථ්‍යාව සහ සිංහලයන්ට ලංකාවට ඇති අයිතිය පිළිබඳ විශ්ලේෂණාත්මක අධ්‍යයනයක් වන මේ කෘතිය එළිදැක්වීමේ උලෙළේ ප්‍රධාන ආරාධිතයා සේරුවිල රාජමහා විහාරාධිපති මුංහේනේ මෙත්තාරාම නාහිමියෝය.

## නාවලපිටියේ සරණජෝති හිමියන්ට

# සංඝනායක පදවි සන්නස් පත්‍ර ප්‍රදානෝත්සවය අද

අමරපුර අරියවංශ සද්ධම්ම යුක්තික පාර්ශ්වයේ කාරක සංඝ සභික නාවලපිටියේ සරණජෝති තිස්සාභිධාන හිමියන් වෙත ශ්‍රී ලංකා අමරපුර මහා නිකායේ අරියවංශ සද්ධම්ම යුක්තික පාර්ශ්වයේ සිරි සුමනජෝති මහා කාරක සභාව විසින් ප්‍රදානය කළ 'රතනජෝති පේමානන්ද ජිනරතන වංශාලංකාර ජිනශාසන කීර්ති ශ්‍රී ප්‍රවචන විශාරද සද්ධම්ම වාගීශ්වරාචාර්ය ගෞරව නාමෝපාධි සහිත මධ්‍යම පළාතේ ප්‍රධාන සංඝනායක පදවිය' පිළිබඳ ශ්‍රී සන්නස් පත්‍ර ප්‍රදානෝත්සවය අද (19) ප.ව. 2.30ට පැවැත්වීමට කටයුතු යොදා තිබේ.

කුරුඳුවත්ත නව නගරය, යටපාන ශ්‍රී ජිනේන්ද්‍රාරාමස්ථ ධර්ම මන්දිරයේදී පැවැත්වෙන මේ මහෝත්සවයට ගන්තුනේ අස්සජි සහ එගොඩමුල්ලේ අමරමෝලි මහනාහිමිවරුන්ද, මධ්‍යම පළාත් ආණ්ඩුකාර



නීතිඥ ලලිත් ගමගේ, ශ්‍රී දළදා මාළිගාවේ දියවඩන නිලමේ ප්‍රදීප් නිලංග දැල බණ්ඩාර මහත්වරු ද සහභාගිවීමට නියමිතය.

## මාධ්‍යවේදී චන්ද්‍රසේකරගෙන් භාෂා පරිවර්තන කාර්යාලයක්

බදුල්ල දිස්ත්‍රික්කයට අඩුපාඩුවක්ව තිබූ දිවුරුම් දුන් භාෂා පරිවර්තන සේවා කාර්යාලයක් ප්‍රවීණ මාධ්‍යවේදී ටී.චන්ද්‍රසේකර මහතා විසින් බදුල්ල වෙලේකඩේ නව වෙළෙඳ සංකීර්ණයේ ආරම්භ කර තිබේ.

දිනමිණ පුවත්පතේ හිටපු ප්‍රවෘත්ති කර්තෘවරයෙක් වූ ටී.චන්ද්‍රසේකර මහතා සිංහල දෙමළ ඉංග්‍රීසි භාෂා පරිවර්තකයෙක් ලෙස දිවුරුම් දී ඇත්තේ 2002 වසරේදීය.

බදුල්ල වෙලේකඩේ නව වෙළෙඳ සංකීර්ණයේ ආරම්භ කරන ලද මේ භාෂා පරිවර්තන කාර්යාලය මගින් එම සේවාවට අමතරව ලිපි ලේඛන සකසාදීම, නීතිඥවරුන් සඳහා අවශ්‍ය ලේඛන , ග්‍රන්ථ ලබාදීම ඇතුළු සේවා රැසක් සැලසේ.

## වන අලි ගම්වැදීම වැළැක්වීමට ජෛව වැටක් ඉදි කිරීමට හා විදුලි වැට දීර්ඝ කිරීමට ක්‍රියා කරන්න

### ඇමැති ජොන්ස්ටන්ගෙන් නිලධාරීන්ට උපදෙස්

**සුභාෂිණී සේනානායක**

වන අලි ගම්වැදීම වැළැක්වීමට ජෛව වැටක් ඉදිකිරීම හා විදුලි වැට දීර්ඝ කිරීමට කටයුතු කරන ලෙස මහාමාර්ග ඇමැති ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා නිලධාරීන්ට උපදෙස් දී තිබේ.

පසුගියදා කුරුණෑගල දිස්ත්‍රික් සංවර්ධන කමිටු රැස්වීමේදි ඇමැතිවරයා විසින් නිලධාරින්ට මේ උපදෙස් දී ඇත. පසුගිය මාස දෙකක කාලයක සිට වන අලින්ගේ ප්‍රහාර හේතුවෙන් තිදෙනෙක් නිකවැරටිය, පොල්පිතිගම ආශ්‍රිතව මියගොස් ඇති අතර තවත් වන අලි 300ක් පමණ නිකවැරටිය, කොටවෙහෙර සියඹලාන්ගමුව, රාජාංගණය, පොල්පිතිගම ආදි ගම්මානවලට පැමිණ වගාබිම් හා නිවාසවලට දැඩි හානි කර ඇත.

මෙහිදී වන අලි එක් ගම්මානයක පොල්ගස් 1000ක් පමණද විනාශ කර ඇත. ජනතාව මෙහිදී වන අලින්ගෙන් එල්ල වන තර්ජනයට කඩිනමින් විසඳුම් ලබාදෙන ලෙස රජයෙන් ඉල්ලා ඇත.

විදුලි වැට දීර්ඝ කිරීම, අගල් කැපීම හා විශේෂයෙන්ම දෙහි වැනි ශාක යොදාගෙන ජෛව වැටක් ඉදිකිරීමට මෙහිදී සාකච්ඡා කෙරිණි. එමෙන්ම වන අලි ගම්වැදීමට හේතු වී ඇත්තේ සියඹලන්ගමුව ඉගිනිමිටිය ජලාශ ආශ්‍රිතව අනවසර වගා කිරීමත් ඒ නිසා වන අලින්ට ආහාර හා ජලය නැතිකම හා අනවසර වගාකරුවන් අලින්ට වෙඩි තැබීම හා හිංසා කිරීමත් නිසාය. වහාම අනවසර වගාකරුවන් පිළිබඳ කඩිනමින් තීරණයක් ගෙන ඒ ගැන සොයා බලන ලෙසද ඇමැතිවරයා නිලධාරීන්ට දැනුම් දුන්නේය. තවද අනවසරයෙන් කැලෑ එළිකරන පුද්ගලයන් සොයා බලා ඔවුන්ට නීතිය ක්‍රියාත්මක කරන ලෙසද ඇමැතිවරයා වැඩිදුරටත් පැවසීයත.

ජනතාවගේ ආරක්ෂාවට ප්‍රමුඛස්ථානය දෙමින් වන අලි තර්ජනයෙන් ජනතාව මුදා ගැනීමට කඩිනමින් හා ස්ථිර විසඳුම් ලබාදීමට ක්‍රියාමාර්ග ගන්නා ලෙසද ඇමැතිවරයා නිලධාරින්ට වැඩිදුරටත් උපදෙස් දුන්නේය.

## පිළියන්දල කලාපයේ හිටපු නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ

# පියදාස පිටිගල ලියනගේ අභාවප්‍රාප්ත වෙයි



පිළියන්දල නැගෙනහිර මාම්පේ පී.එස්.පෙරේරා මාවතේ අංක 192/2 නිවෙසේ පදිංචිව සිටි පිළියන්දල කලාපයේ හිටපු නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ පියදාස පිටිගල ලියනගේ මහතා අභාවප්‍රාප්ත විය.

කැස්බෑව-පිළියන්දල විශ්ව කලාව ප්‍රදේශයේ ප්‍රකට සමාජ සේවකයකු වූ ඒ මහතා ප්‍රදේශයේ සමාජ සේවා සංවිධාන සමිති සංගම් රැසක නිලතල හොබවා ඇත. ග්‍රන්ථ ගණනාවක් රචනා කර ඇති ඒ මහතා මිය යන විට 81 වැනි වියේ පසුවිය. අමරා ලියනගේ මහත්මියගේ දයාබර ස්වාමිපුරුෂයා වූ ඒ මහතා දූ දරුවන් තිදෙනකුගේ දයාබර පියාණන්ය.

දේහය පිළියන්දල විශ්ව කලාව පී.එස්. පෙරේරා මාවතේ අංක 192/2 නිවෙසේ තැන්පත් කර ඇති අතර හෙට (20) දහවල් 12.00ට කොළඹ වෛද්‍ය විද්‍යාලයට දේහය භාරදීමට නියමිතය.


සළුසල
சலுசல
SALU SALA

සී/ස ලංකා සළුසල
Lanka Salusala Limited
லங்கா ஸலூ சலா லிமிட்டெட்

**සළුසල සමග රෙදිපිළි නිශ්පාදනය සඳහා කෙරෙන ආරාධනය.**

සීමාසහිත ලංකා සළුසල, ශ්‍රී ලංකා රජය සතු ආයතනයක් වන අතර එය රජයේ සියලුම ආයතන හා පෞද්ගලික අංශයේ ඇඟළුම් නිශ්පාදනය සඳහා 1991 වසරේ ආරම්භ කරන ලද්දකි.

ශ්‍රී ලංකාවේ ඇඟළුම් හා රෙදිපිළි අවශ්‍යතා සපුරාලීමේ අරමුණින් ඉදිරියේදී මෙම ආයතනය බතික්, අත්යන්ත්‍ර හා දේශීය ඇඟළුම් නිශ්පාදන රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වීමට නියමිතය.

ඒ අනුව ගරු රාජ්‍ය අමාත්‍යවරයාගේ අනුමැතිය පරිදි අනාගත ආයෝජකයින්/නිශ්පාදකයින් සමග හවුල් ව්‍යාපාරයකට එළඹීමට අදහස් කරනු ලැබේ.ඒ සඳහා උනන්දුවක් දක්වන පාර්ශවයන් ඔබගේ එකඟතාවය පළකරන ලද **EOI** ලිපි, ලියාපදිංචි තැපෑලෙන් හෝ සභාපති, අංක 93, ජාවත්ත පාර, කොළඹ 05 ලිපිනයට 2020 සැප්තැම්බර් මස 30දා පෙ:ව: 10.30ට හෝ ඊට පෙර පෙ:ව: 9.00 ත් ප:ව: 3ත් අතර සතියේ වැඩ කරන දිනක ගෙනැවිත් බාරදිය යුතුය. අද (සැප්.19) සිට දින 21ක් ඇතුළත මේ සඳහා අයදුම් කිරීමට හැකිය.

ලිපි කවරයේ ඉහළ වම් කෙළවරෙහි **"සළුසල සමග රෙදිපිළි නිශ්පාදනය සඳහා කොන්දේසි"** (**TOR**) යනුවෙන් සඳහන් කළ යුතුය. මේ පිළිබඳ උනන්දුවක් දක්වනවා නම් වැඩිදුර තොරතුරු

සභාපති,
සළුසල,
අංක 93, ජාවත්ත පාර, කොළඹ 05
ලිපිනයෙන් හෝ
දුරකථන අංක-011 2586732
මගින් සතියේ දිනවල
පෙ:ව: 9.00 සිට ප:ව: 3.00 දක්වා
ලබාගැනීමේ පහසුකම් සලසා ඇත.
E-mail: lankasalusalalimited@gmail.com



ජාතික ලොතරැයි මණ්ඩලය
தேசிய லொத்தர் சபை
National Lotteries Board

**මුදල් අමාත්‍යාංශය**

**ජාතික ලොතරැයි මණ්ඩලය**

**වසරක කාලයක් සඳහා ජාතික ලොතරැයි මණ්ඩලය වෙත පරිගණකාශ්‍රිත දිනුම් ඇදීම සඳහා (ගොවිසෙත, සුපිරි වාසනා, වාසනා සම්පත, ජාතික සම්පත, මෙගා පවර්, ධන නිධානය, සෙවණ (දිනුම් අදිනු ලබන) නීරෝගා සහ දරුදිරි සම්පත) ලොතරැයිපත් මුද්‍රණය, සැපයීම හා ගෙනවිත් භාර දීම සඳහා වන ප්‍රසම්පාදනය**

උක්ත ප්‍රසම්පාදනයට අදාළව 2020.09.21 දින ප.ව 1.30 ට ජාතික ලොතරැයි මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලයේදී පැවැත්වීමට නියමිතව තිබූ පූර්ව ලංසු රැස්වීම නොවැළැක්විය හැකි හේතුවක් මත එදිනට නොපැවැත්වෙන අතර, එම පූර්ව ලංසු රැස්වීම 2020.09.22 දින ප.ව 1.30 ජාතික ලොතරැයි මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලයේදී පැවැත්වෙන බව දන්වා සිටිමි.

මේ පිළිබඳව ඔබට සිදුවන අපහසුතාවයන් පිළිබඳව අපගේ කනගාටුව ප්‍රකාශ කර සිටිමු.

**සභාපති,**
**අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව,**
**ජාතික ලොතරැයි මණ්ඩලය,**
**නො.32, දේශමාන්‍ය එන්.ඩබ්.ජේ. මුදලිගේ මාවත,**
**කොළඹ 01.**

**දුරකථන - 0114607019**


## ඉහළ වැටුප් හිමි විදෙස් රැකියාවලට

# ශ්‍රමිකයන් යොමු කිරීමට ජාතික වැඩපිළිවෙළක්

### කම්කරු ඇමැති නිමල් සිරිපාල ද සිල්වා

**අනුර ප්‍රේමලාල්**

කාන්තාවන් ගෘහසේවිකාවන් ලෙස රැකියාවලට විදේශගත කිරීමට පෞද්ගලිකව තමා විරුද්ධ බවත්, ඔවුන්ට ගෞරවාන්විත රැකියා ලබා දීම රජයේ අරමුණ බවත්, කම්කරු ඇමැති නිමල් සිරිපාල ද සිල්වා මහතා ප්‍රකාශ කරයි.

ඒ අනුව, ඉහළ වැටුප් සහිත රැකියා සඳහා කාන්තාවන් මෙන්ම පිරිමි ශ්‍රමිකයන් යොමු කිරීමට ජාතික වැඩපිළිවෙළක් සකස් කරන බව හෙතෙම සඳහන් කළේය.

ඒ මහතා මේ බව සඳහන් කළේ, ඊයේ (13) ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ හාලිඇළ පිහිටි ජපන් රැකියා පුහුණු මධ්‍යස්ථානයේ නිරීක්ෂණ චාරිකාවකට එක්වෙමිනි. මේ අවස්ථාවට ජපන් රැකියා වැඩසටහනේ සම්බන්ධීකරණ කටයුතු සිදු කරන IM Japan ආයතනයේ ශ්‍රී ලංකාවේ සාමාන්‍යාධිකාරී හිරොතකා කවහාර (HIROTAKA KAWAHARA) මහතා ද එක් විය.



ඇමැති නිමල් සිරිපාල ද සිල්වා මහතා පුහුණුව ලබන පිරිසක් සමඟ කතා කළ අයුරු

එහිදී වැඩිදුටත් ඇමැතිවරයා මෙසේද කීය. අද සමහරු සැප විදින්නේ ගෘහ සේවිකාවන් ලෙස සේවය කර අප රටට එවන මුදලින්. ඒ නිසා විදෙස් රැකියා සඳහා යන කාන්තාවන් ගෞරවාන්විත රැකියා සඳහා යොමු කිරීමේදී අනෙක් රටවල විදේශ රැකියා සඳහා පිටත් කරන කාන්තාවන්ට ලබාදෙන පුහුණුවට වඩා හොඳ භාෂා හා ප්‍රායෝගික පුහුණුවක් අප ලබාදිය යුතුයි.

## සාහිත්‍ය කලා සම්මන්ත්‍රණයක් සහ වැඩමුළුවක් 26 දා මාතලේදී

නවක නිර්මාණ ශිල්පීන්ට සිය කුසලතා වර්ධනය කිරීම සහ අත්දැකීම් ජ්‍යෙෂ්ඨයන් සමඟ හුවමාරු කිරීමේ අරමුණින් පහන්ටැඹ සාමූහිකය සංවිධාන කරන එක්දින සාහිත්‍ය කලා සම්මන්ත්‍රණයක් සහ වැඩමුළුවක් මේ මස 26 වැනි දින මාතලේ මහත්මා ගාන්ධි අන්තර්ජාතික අනුස්මරණ ශාලාවේදී පැවැත්වේ.

ජ්‍යෙෂ්ඨ කිවියර රත්න ශ්‍රී විජේසිංහ මහතා විසින් කවිය හා ගීත රචනය පිළිබඳ විචාරාත්මක දේශනයක් පවත්වනු ලබයි. කෙටිකතා, චිත්‍ර, ළමා කතා, කෙටි චිත්‍රපට පිළිබඳ දැනුම්වත් කිරීමක් කපිල කුමාර කාලිංග, පුෂ්පා රම්ලානි, වසන්ත දුක්ගන්නාරාළ, ඉන්ද්‍රනාත තේනුවර ප්‍රමුඛ ප්‍රවීණ කලාකරුවන් රැසකගේ දායකත්වයෙන් එදින සිදු කෙරේ.



# ජලභීතිකා නරි මිල්ලනියට භීතිය ගෙනෙති

**මානෙල් පුෂ්ප කුමාරි**

කළුතර දිස්ත්‍රික්කයේ මිල්ලනිය ආසන්න ප්‍රදේශවල ළඳු කැලෑවල සහ කුඹුරු යාය ආශ්‍රිතව ජලභීතිකාව වැලඳුණ නරි ගැවසෙන බැවින් එම ප්‍රදේශවල දරුවන් තනිව පාසල් යැවීමෙන් වළකින ලෙස, වනජීවී සෞඛ්‍ය අධ්‍යක්ෂ, පශු වෛද්‍ය තාරක ප්‍රසාද් මහතා පවසයි. මේ නරි උදේ 10.00 වනතුරු ඒ අවට ප්‍රදේශවල ගැවසෙන බවද පැවසිණි.

තාරක ප්‍රසාද් මහතා ඒ ගැන තවදුරටත් කතා කරමින් මෙසේ කීවේය.

"මේ වන විට සියලු අංශ මේ පිළිබඳ සූදානමින් සිටිනවා. මේ රෝගය හේතුවෙන් අහිංසක සතුන්ගේ ජීවිතවලට හානි කිරීම තේරුමක් නැහැ. ඒ අවට ප්‍රදේශවල ජනතාවට රාත්‍රියට ගමන් යෑමෙන් වළකින්න. ගෘහස්ත සතුන් කරා මෙම රෝගය පැතිර යාම එන්නත් කිරීම තුළින් වළක්වා ගන්න පුළුවන්. රෝගය මිනිසුන් අතර පැතුරුණොත් ඒක භයානක තත්ත්වයක් බවට පරිවර්තනය වෙනවා. සුනඛයන් සපා කෑමෙනුත් මේ රෝගය වැලඳෙනවා.

ජලභීතිකාව හැදුන නරියකුගේ චර්යාව මිනිස්සු හඳුනා ගෙන නැහැ. ජලභීතිකාව හැදුන නරි තමයි බොහෝ විට ඉදිරියට දුවගෙන එන්නේ. එවැනි නරි දුටුවොත් වහාම එතැනින් දුවන්න ඕනේ. කුඩා දරුවකු මෙවැනි නරියකු සපා කාලා තියෙනවා. නමුත් මවුපියන් හිතලා තියෙන්නේ බයිසිකලයෙන් වැටුණා කියලයි. දෙවැනි පුද්ගලයා මැරිලා තියෙන්නේ ජලභීතිකාව මාරාන්තික රෝගයක් කියා දැනුවත් නොවීමෙන්. රෝගී නරියෙක් සිටියොත් ඒ නරියාව පරිසරයෙන් ඉවත් කරන්න කටයුතු කරනවා. දුරකතන අංක 1992 ඒ ප්‍රදේශවල අපි පාවිච්චි කරනවා. නරි සම්බන්ධයෙන් තොරතුරු අපි උදේ වන විට "වට්ස් ඇප්" මාර්ගයෙන් එකතු කරනවා. මිය ගිය සතකු ඉන්නවා නම් ඒ සතා පශු වෛද්‍ය පරීක්ෂණවලට යොමු කරනවා. ඒ නිසා තොරතුරක් තිබුණොත් ඉහත නොම්බරයට දැනුම් දෙන්න. ඒ වගේම මේ සතුන්ගෙන් පරිස්සම් වෙන්න."

## මුතු වෙරළෙන් කහ මතුවේ





**ප්‍රසාද් පූර්ණමාල්**
**පුත්තලම දිසා සමූහ**

රුපියල් ලක්ෂ හතළිහක් වටිනා කහ කිලෝ ග්‍රෑම් දහසකට අධික ප්‍රමාණයක් අත්අඩංගුවට ගැනීමට, ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ, හලාවත පිරික්සුම් ඒකකයේ නිලධාරීහු සමත් වූහ.

හලාවත මෝය හරහා ගොඩබිමට රැගෙන ඒමට උත්සාහ කළ මේ කහ තොගය වටලා ඇත්තේ, බුද්ධි අංශයෙන් ලද තොරතුරක් මතය. ඊයේ (18) අලුයම මේ වැටලීම කළ නමුත් කහ තොගය රැගෙන ආ සැකකරුවන් දෙදෙනා බෝට්ටුව අතැර පැන ගොස් තිබේ.

මේ ධීවර යාත්‍රාව හලාවත ප්‍රදේශයේ ධීවරයකුට අයත් බව හඳුනා ගෙන ඇති අතර, ඔහු හා අනෙක් සැකකරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නිලධාරීන් හලාවත පොලිසිය හා එක්ව විශේෂ පරීක්ෂණයක් ආරම්භ කර ඇත.

## "ධර්මෙ පය පැකිලී වැටුණා අලියා ධර්මෙ පාගාගෙන දිව ගියා"

### වන අලියකුට පෑගී මිය ගිය වනජීවී නියාමකවරයාගේ මරණ පරීක්ෂණය:

**ඩී.එස්. ගුණතිලක**
**ඌව වෙල්ලස්ස විශේෂ**

"අලියා ගිය අඩිපාර දිගේ අපි දෙගල් ආර කන්ද මැදින් යන විට එකවරම වම් පැත්තෙන් අලියෙක් ආවා. අලියා සිටියේ අපිට මීටර් දහයක් පමණ දුරින්. අලියා දැක්ක ගමන් අපි බේරෙන්න දුවගෙන ගොස් ගල්වලට මුවා වුණා. ධර්ම කුමාර දුවගෙන යන විට පය පැටලී වැටුණා. අලියා ධර්ම කුමාරව පාගා ගෙන ඉදිරියට ගියා." යැයි වන අලියකුට පෑගීමෙන් මිය ගිය දමන, වන අඩවි කාර්යාලයේ වනජීවී නියාමකවරයාගේ මරණ පරීක්ෂණයේදී සාක්ෂි දුන් වනජීවී නියාමක ටී. එස්. මධුසංක මහතා පැවසීය.

දමන වන අඩවි කාර්යාලයේ වනජීවී නියාමකවරයකු ලෙස සේවය කළ අම්පාර, වඩිනාගල, අංක 1/39 පදිංචි ධර්මදාස නොයෙල් ධර්ම කුමාර (44) නමැති දෙදරු පියාගේ මරණ පරීක්ෂණය මොනරාගල දිස්ත්‍රික් මහ රෝහලේදී පැවැත්විණි. සියඹලාණ්ඩුව වැඩ බලන මහේස්ත්‍රාත් ඩී. එම්. රත්නපාල මහතා විසින් මහේස්ත්‍රාත් පරීක්ෂණය පවත්වන ලදී.



සාක්ෂිකරු වැඩිදුරටත් මෙසේද කීය.

"බ්‍රහස්පතින්දා උදේ හය හමාරට විතර, වන අලියෙකු කඩා වැදී ඇති බව සියඹලාණ්ඩුව රුහුණු දනව්ව ප්‍රදේශයේ ගම්වැසියකු දුරකතන ඇමතුමකින් අපේ කාර්යාලයට දැනුම් දුන්නා. ඒ අනුව වනජීවී නියාමකවරුන් වන පී. ඩබ්ලිව්. ටී. ප්‍රියංකරයි, එස්. එම්. පී. පත්මලාලුයි, මිය ගිය ඩී.එන්. ධර්ම කුමාරයි, මමයි කාර්යාලයේ කැබ් රථයෙන් රුහුණු දනව්ව ප්‍රදේශයට ගියා. ගමට ගිය අපි ගම්වාසීන් කිහිප දෙනකු සමඟ අලියා ගිය අඩි පාරේ ඉදිරියට ගියා-අලියා සිටී නම් කැලෑව එළවා දැමීමටයි අපි එහෙම ගියේ. දෙගල්ආර කන්දට එහා පැත්තේ අලියා ඉන්නා බවට තොරතුරු ලැබුණා. අපි දෙගල්ආර කන්ද මැදින් ඒ පැත්තට ගියා. එසේ යන විට එකවරම වම් පැත්තෙන් අපිට මීටර් දහයක් පමණ ඉදිරියෙන් අලියකු මතු වුණා. අපි අලියාගෙන් බේරෙන්න දිව්වා. එසේ දුවන විට ධර්ම කුමාර පය පැටලී බිම වැටුණා. අලියා ධර්ම කුමාරව පාගාගෙන ඉදිරියට ගියා. ටික වේලාවකින් අපි ඇවිත් බලන විට ධර්ම කුමාර බිම වැතිරී සිටියා. ඔහුගේ හිසෙන් ලේ ගලාගෙන ගියා. ඔහු කිසිවක් කතා කළේ නැහැ. අපි ධර්ම කුමාරව සියඹලාණ්ඩුව රෝහලට රැගෙන ගියා. රෝහලේ වෛද්‍යවරු පරීක්ෂා කර බලා පැවසුවා ඔහු මියගොස් ඇති බව."

මොනරාගල දිස්ත්‍රික් මහ රෝහලේ අධිකරණ වෛද්‍ය නිලධාරී හසිත් රංගික යාපා මහතා විසින් පශ්චාත් මරණ පරීක්ෂණය පවත්වන ලදී. හිසට බරපතළ හානි සිදු වීමෙන් මරණය සිදු වී ඇති බවට අධිකරණ වෛද්‍යවරයා නිගමනය කළේය. සියඹලාණ්ඩුව පොලිස් ස්ථානාධිපති ප්‍රියන්ත බණ්ඩාර මහතාගේ උපදෙස් පිට පොලිස් සැරයන් 43954 මංගල ගුණසේකර මහතා සාක්ෂි මෙහෙයවීය.

## බිම්බෝම්බ ඉඩම් මාස් කන්නයට

**උතුරු පළාත් විශේෂ**
**රසුල දිල්හාර ගමගේ**



මුලතිව් පළාතේ බිම් බෝම්බ ඉවත් කිරීමේ මානුෂීය මෙහෙයුමක නිරත ෂාප් (SHARP) නමැති දේශීය සංවිධානය, 2016 වසරේ සිට මේ දක්වා බිම් බෝම්බ 24065ක් ඉවත් කොට ඇති බව එහි ව්‍යාපෘති කළමනාකාරවරයා පැවසීය.

ෂාප් සංවිධානයේ ව්‍යාපෘති කළමනාකරු වන කපිතාන් ප්‍රභාත් නාරම්පනාව මහතා කියා සිටියේ පච්චිලෙයිපල්ලි හා ඔට්ටිසුඩාන් යන පළාත්වලින් පමණක් මේ බිම්බෝම්බ ප්‍රමාණය ඉවත් කළ බවයි. මීට අමතරව කිලිනොච්චියේ පලෙයි අම්බගාමම් ඇතුළු තවත් පළාත් ගණනාවක බිම් බෝම්බ ඉවත් කිරීමේ කටයුතු මේ කාලය තුළ ඉතා සාර්ථකව ඉටු කොට ඇති බවද ඔහු සඳහන් කළේය.

උතුරේ බිම් බෝම්බ ඉවත් කරන ලද අක්කර 360ක පමණ භූමි ප්‍රමාණයක් රාජ්‍ය නිලධාරීන්ට බාරදීමෙන් පසුව මෙවර මාස් කන්නයේ ගොවිතැන් කටයුතු සඳහා ගොවීන්ට බාර දීමට එම නිලධාරීන් පියවර ගෙන තිබේ.

## 'කුරුලු' සහෝදරයා කුඩුත් සමඟ කූඩු වේ

**ගාල්ල දිසා සමූහ**

කුරුල්ලා යන අන්වර්ත නාමයෙන් හඳුන් වන මත්කුඩු ජාවාරම්කරුගේ සහෝදරයකු, හෙරොයින් මත්කුඩු සමඟ අත්අඩංගුවට ගත් බැව් ගාල්ල පොලිසියේ දූෂණ මර්දන අංශය පවසයි.

සැකකරු දඩැල්ල, කුඩුවහන්දිය යන ප්‍රදේශයේදී අත්අඩංගුවට ගෙන ඇත. සැකකාර පුද්ගලයා 29 හැවිරිදි වියේ පසුවන අයෙකි. සැකකරු දැඩි ලෙස මත්කුඩුවලට ඇබ්බැහි වී සිටින අතර, මත්කුඩු ජාවාරම් කිරීම සම්බන්ධයෙන් මොහුට එරෙහිව මහාධිකරණයේ නඩුවක්ද විභාගවෙමින් පවතින බව පොලිසිය පවසයි.

පසුගියදා සැකකරුගේ වැඩිමල් සහෝදරයා පොල්ගෙඩිවල මත්කුඩු දමා රැගෙන එමින් සිටියදී පොලිසිය මගින් අත්අඩංගුවට ගෙන තිබිණි. ඔහු රක්ෂිත බන්ධනාගාරගත වීමත් සමඟ සහෝදරයා මත්කුඩු ජාවාරම කරගෙන යාමට පටන්ගෙන ඇති බව පොලිස් පරීක්ෂණවලදී අනාවරණය වි ඇත. සැකකරු ඊයේ (18) අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට නියමිතව තිබිණි.

ගාල්ල මූලස්ථාන පොලිස් පරීක්ෂක කපිල සේනාපති ද සිල්වා, දූෂණ මර්දන අංශයේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ධම්මික නාගහවත්ත, උ. පො. ප. වික්‍රමනායක, පො. සැ. 42504 අබේතුංග, පො. සැ. 3391 තුෂාර, පො. සැ. 10529 ප්‍රියන්ත, පො. සැ. 59045 ලලිත් යන නිලධාරීන් විසින් සැකකරු අත්අඩංගුවට ගනු ලැබිණි.

## වෙළෙඳ නගරයට සීතල බස්

**නිමල් රාජපක්ෂ**

ඔක්තෝබර් මාසයේ මැද වන විට වායු සමනය කළ බස් රථ කොළඹ නගරයේ ධාවනය කිරීමට ලංකා ගමනා ගමන මණ්ඩලය කටයුතු යොදා ඇත. ඒ අනුව වායු සමනය කළ, පත්ල පහත්, බස් රථ විස්සක් කාර්යාල බලා යන මගීන් ගේ ගමන් පහසුව සඳහා ප්‍රථම අදියරේදී යොදවන බව ලංකා ගමනාගමන මණ්ඩලයේ සභාපති කිංස්ලි රණවක මහතා පවසයි.

විශේෂයෙන් මෝටර් රථවලින් කොළඹට පැමිණෙන ජනතාවගේ ගමන් පහසුව සඳහා මේ බස් රථ සේවාව ආරම්භ කිරීමට නියමිතය. බස් රථ ගාස්තුව මඳක් වැඩි වුවත් මේ මගින් කොළඹ නගරයේ වාහන තදබදයට විසඳුමක් ලබා දීම මණ්ඩලයේ අරමුණ වෙයි. ප්‍රවාහන අමාත්‍යාංශය, ජාතික ගමනාගමන කොමිසන් සභාව හා එක්ව මේ වැඩසටහන ක්‍රියාත්මක කරන බවද ලංගම සභාපතිවරයා පැවසුවේය.





## යාපනය සරසවියේ ජ්‍යෙෂ්ඨ මාෆියාව

**උතුරු පළාත් විශේෂ**
**රසුල දිල්හාර ගමගේ**



යාපනය විශ්වවිද්‍යාලයේ මේ දිනවල සිදුවන නවක වධයේ අමානුෂික පහර දීම් කීපයක් පිළිබඳ 17දා තොරතුරු වාර්තා වී තිබේ. කෲර ලෙස නවක වධය දුන් අවස්ථාවක පළමු වසර ශිෂ්‍යාවක තුවාල ලබා සිහිසුන්ව ඇද වැටී තිබේ. පළමු වසර ශිෂ්‍යාවන් පිරිසක් ඇයව ආරක්ෂිත ස්ථානයකට රැගෙන ගොස් ප්‍රථමාධාර ලබා දී ඇති අතර, එසේ ප්‍රතිකාර දුන් ශිෂ්‍යාවන්ට ජ්‍යෙෂ්ඨ සිසුන්ගෙන් දැඩි බලපෑම් එල්ල වී තිබේ.

යාපනය විශ්වවිද්‍යාලයේ අමානුෂික මෙන්ම අසභ්‍ය ලෙස නවක වධය ලබා දීමේදී වැඩි වශයෙන්ම ඊට දායක වී සිටින්නේ සිංහල සිසුන් බවට තොරතුරු හෙළි වී තිබේ. මෙම නවක වධයේදී ලබාගත් ඡායාරූප ජනමාධ්‍යයට ද ලැබී ඇත. ඉහත දැක්වෙන්නේ එම ඡායාරූප දෙකකි.

## ළමා පරපුර රැක ගැනීමට පොලීසිය පෙරමුණට

**චන්ද්‍රිකා පෙරේරා**

විවිධ අපරාධ, මත්ද්‍රව්‍ය උවදුර සහ ළමා අපචාර ඇතුළු නීති විරෝධී ක්‍රියා වළක්වා ගැනීම පිළිබඳ ළමා පරපුර දැනුවත් කිරීමේ දේශන මාලාවක් පොලිස් මහජන සම්බන්ධතා කොට්ඨාසය රට පුරා පවත්වයි. වර්තමාන දරු පරපුර අනාගතයේදී එවැනි නීති විරෝධී ක්‍රියාවලට සම්බන්ධවීම වළක්වා ගැනීම අරමුණු කරගනිමින් මේ වැඩසටහන් මාලාව පැවැත්වේ.

මේ අනුව යහපත් සමාජයක් ගොඩනැංවීමට පොලිසියේ දායකත්ව සැපයීම අපේක්ෂාවය. වැඩ බලන පොලිස්පති සී.ඩී. වික්‍රමරත්න මහතාගේ උපදෙස් මත, පොලිස් මහජන සම්බන්ධතා භාර නියෝජ්‍ය පොලිස්පති ලාල් සෙනෙවිරත්න සහ එම කොට්ඨාසයේ අධ්‍යක්ෂ හා පොලිස් මාධ්‍ය ප්‍රකාශක ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි ජාලිය සේනාරත්න මහත්වරු මේ වැඩසටහන් මාලාව ක්‍රියාත්මක කරති.

ඒ අනුව ඉකුත් 13 දා කොළොන්නාව රාජමහා විහාරස්ථානයේ දහම් පාසල් දරු දැරියන් දහසකට ආසන්න පිරිසකගේ සහ ආචාර්ය මණ්ඩලයේ සහභාගීත්වයෙන් කොළොන්නාව මූලක කරගනිමින් දේශනයක් පැවැත්විණි.

පොලිස් මහජන සම්බන්ධතා කොට්ඨාසයේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක අනිල් ප්‍රියන්ත ළමා හා කාන්තා කාර්යාංශයේ ප්‍රධාන පොලිස් පරීක්ෂක මනෝජ් සමරසේකර යන මහත්වරුන් මේ අවස්ථාවට එක්වූ අතර එම දහම් පාසලේ ප්‍රධානාචාර්ය ප්‍රවීණ මාධ්‍යවේදී රංගන සිල්වා වැඩසටහන සංවිධානය කර තිබිණි.

## ශ්‍රීකාන්තගේ ප්‍රිය දූපත




## ඇ නැ ත්ත

හෙළ බොදු දිවයිනක් ලෙස නම් දැරූව රට
හෙළ බොදු රජවරුන් රජකම් කෙරූව රට
හෙළ බොදුනුවන් ජීවත් වී මැරෙන රට
හෙළ බොදු කමට නොහොබින උන් සිටින රට

සම්බුදු ගුණ සුවඳ විහිදෙන බෝමළුවෙන්
පරදේසින් පවා පිළිගත් බළ මුළුවෙන්
මේ හෙළ බොදු රටට ගරහන ඉඳ හෙළුවෙන්
පවු කාරයෝ වෙති මෙහි අට එන සළුවෙන්

රටේමුල්ලේ මුදන්නායක

## ගිනි කාෂ්ඨ

අසැබි දසුන් රූගත වෙයි නවක වදේ
අඳුරු අනාගතයක පෙර ලකුණු ඇඳේ
නසන කළ මිනිස්කම මේ තරුණ මදේ
සොඳුරු රටක කළු පැල්ලම් තදට වැදේ



The Dinamina
1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත

35, ඩී. ආර්. විජයවර්ධන මාවත,
ලේක්හවුස්, කොළඹ.
දුරකතන - 2429429, 2331181, 2421181
ෆැක්ස් - 2429240
(කර්තෘ මණ්ඩලයට පමණයි)
2449069 (පොදු)
ඊ මේල් - editor.dinamina@lakehouse.lk
දැන්වීම් කළමනාකරු - 2429341

2020 සැප්තැම්බර් 19 සෙනසුරාදා

# අභියෝගවලට භය වෙනවා ද?

වෙනසකට මුල පිරීම කළ යුත්තෝ නායකයෝය. නායකයන් ගත් මග අනුව යෑමට සෙස්සෝ පෙලඹෙති. මේ අනුව නායකයන් සමාජගත කරන අදහස් ඉතා වැදගත්ය. රටක ඉදිරි ගමනට හෝ රටේ ඇදවැටීමට හෝ ඒවා බලපායි. ජනාධිපතිවරයා මීට දින දෙකකට ඉහතදී කියා සිටියේ සමාජයේ ආකල්පමය වෙනසක් ඇති කිරීමට අප උත්සුක විය යුතු බවය. ආකල්පමය වෙනස ඇති කළ යුත්තේ සාධනීය පැත්තටය; නැත හොත් හොඳ පැත්තටය. අගමැතිවරයා පෙරේදා කොළඹ වරාය පරිශ්‍රයේදී කියා සිටියේ අනාගත ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආදායම් මාර්ගය 'පෝට් සිටි' ව්‍යාපෘතිය බවය. ඉහත අදහස් දෙකම අපේ ඉදිරි ගමනට අදාළය.

ඉදිරි වසර කිහිපය අභියෝගාත්මක කාල පරිච්ඡේදයක් ලෙස හැඳින්විය හැකිය. අන්තර්ජාතික වෙළෙඳ කටයුතු මන්දගාමී වී ඇත. සංචාරක කර්මාන්තය ඇදවැටී ඇත. අපනයන ක්ෂේත්‍රය පල්ලම් බැස තිබේ. විදේශ රැකියා ක්ෂේත්‍රය හැකිළී තිබේ. මේ අනුව නව ආර්ථික උපාය මාර්ග ඔස්සේ ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීමට සිදු වෙයි. ඒ සඳහා අලුතින් සිතන මතන නිර්මාණශීලි පිරිසක අවශ්‍ය වන අතර, අනෙක් අතින් සාමූහිකත්වය ගොඩනැගිය යුතුව තිබේ. පාලකයන්, ආයතන පමණක් නොව, පොදුවේ මහජනයා ද තම වගකීම් හා යුතුකම් හඳුනාගෙන ක්‍රියා කරන පිරිසක බවට පත් විය යුතුය.

හම්බන්තොට වරාය විවෘත වන්නේ 2010 නොවැම්බර් 18 දා ය. එහෙත් මේ වරාය ඉදි කිරීම සඳහා සැලැසුම් ඉදිරිපත් කළ දා පටන් ම එය නොකෙරෙන තැනට වැඩ සිද්ධ කරන්නට පිරිසක් සිටියහ. හම්බන්තොට වරායක් ඉදි කිරීම සම්බන්ධයෙන් සිංගප්පූරුව මෙන්ම ඉන්දියාව ද කනස්සල්ල පළ කර තිබිණි. හේතුව එම වරාය රටවල් දෙකටම ආර්ථික බලපෑමක් කිරීමට සමත් නිසාය. එහෙත් අපේ රටේ ඇතැම් දේශපාලකයන් මෙහි වැදගත්කම වටහාගත්තේ නැත. ඒ අනුව වරාය කටයුතු හාස්‍යයට ලක් කෙරිණි. එය නිකම්ම පිහිනුම් තටාකයක් බව ද, නැව් නො එන වරායක් බව ද සමහරු හැඳින්වූහ. අද වන විට එම වරාය චීනයට පවරා තිබේ. චීන සමාගම් හම්බන්තොට වරායේ වටිනාකම හොඳින් හඳුනයි.

ජනාධිපතිවරයා මෑතකදී පෙන්වා දුන්නේ ශ්‍රී ලංකාවේ භූගෝලීය පිහිටීමේ වැදගත්කමෙන් අප තවම නිසි ප්‍රතිඵල නෙළාගෙන නැති බවය. එය සම්පූර්ණ ඇත්තකි. ගෝඨාභය මහතා අදාළ අංශවලට උපදෙස් දී ඇත්තේ වරාය නාවික කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා වහාම පියවර ගන්නා හැටියටය. නායකයන් ශ්‍රී ලංකාවේ පිහිටීම කෙරෙහි අවධානය යොමු කිරීම ඉතා වැදගත්ය. ඉන්දීය සාගරයේ කේන්ද්‍රය අපට හිමි වී ඇත. එහි අදහස වන්නේ මේ සාගර කලාපයේ වරාය, නාවික හා ධීවර යන ක්ෂේත්‍රයන්හි ප්‍රමුඛයා වීමට අවශ්‍ය පසුබිම අප සතු වන බවය. අතීත රජවරු මේ තත්ත්වය වටහාගෙන අපේ රට වටා වෙරළ තීරයේ වරාය රැසක් ඉදි කළහ; ඒ වරාය ගොඩබිම හා අගනුවර සමඟ සම්බන්ධ කරන මාර්ග පද්ධතියක් ද ඉදි කළහ.

සිංගප්පූරුව ගොඩනැගූ ලී ක්වාන් යූ මහතා එරට වරාය ඉදි කිරීම ආරම්භ කළේ 1972 දීය. එය ඉතා කෙටි කාලයක් තුළ ලෝකයේ ප්‍රධාන වරායක් බවට පත් විය. ඉන්දියාව වල්ලපඩම් වරාය ඉදි කළේ 2011 දීය. එහෙත් වසර කිහිපයක් යන තුරු එම වරායට නැව් පැමිණියේ නැත. ඇතැම් වරායක් ක්ෂණිකව දියුණු වන අතර, තවත් වරායක් දියුණු වීමට කාලයක් ගත වෙයි. ශ්‍රී ලංකාව වැනි රටක වරායක් අසාර්ථක වීමට හේතුවක් නැත. හම්බන්තොට වරායේ සම්පූර්ණ ඉදි කිරීම් තවම අවසන් නැත. එම ඉදි කිරීම් අවසන් කොට බහලුම් මෙහෙයුම් ආරම්භ කළ හොත් හම්බන්තොට වරාය ඉන්දීය සාගරයේ ප්‍රධාන වරායක් බවට පත් කළ හැකි බව විශේෂඥයන්ගේ මතය වෙයි.

විවේචන හා අපවාද සංවර්ධන ව්‍යාපෘතිවලට බලපාන පොදු සාධකයක් ලෙස සැලැකිය හැකිය. ශ්‍රී ලංකාව වැනි රටවල නොගැඹුරු දේශපාලනයත් මීට හේතුවකි. ජනතා විමුක්ති පෙරමුණ හම්බන්තොට වරාය දිගින් දිගටම විවේචනය කළ අතර, එය චීනයට පවරන්න ගිය විට පමණක් එහි අගය පෙන්වා දෙන්නට පටන් ගත්තේය. ජනතා විමුක්ති පෙරමුණ දේශපාලන වාසි සලකාගෙන සංවර්ධන ව්‍යාපෘති විවේචනය කිරීමට පෙලඹී ඇත. තවම අපේ දේශපාලකයන්ගේ හැඟීම් ප්‍රකාශනය අවංක නැත. ඒවා දේශපාලන ව්‍යාපාරවල වාසි අවාසි මත සිදු වන බව පෙනී යයි. රටට ආකල්පමය වෙනසක් අවශ්‍ය යැයි ජනාධිපතිවරයා පෙන්වා දෙන්නේ මේ සන්දර්භය තුළය.

අපේ ජනතාවගෙන් බහුතරයකට ඇත්තේ පසුගාමී අදහස්ය. ඇතැම් දේශපාලකයන් ජනතාවගේ පසුගාමී අදහස් පෝෂණය කරන බව ද සත්‍යයකි. රාජ්‍ය නිලධාරි තන්ත්‍රය මෙන්ම ආයතන ද බොහෝ සෙයින්ම පසුගාමිය; ඇතැම් විට සාම්ප්‍රදායිකය. කොරෝනා වසංගතය හමුවේ ඇදවැටුණු ව්‍යාපාර යළි ගොඩනැඟීම සඳහා සහන ණය යෝජනා ක්‍රමයක් සකස් කරන්නැ'යි ජනාධිපතිවරයා මහ බැංකුවට උපදෙස් දුන්න ද එය ක්ෂණිකව ඉටු වූයේ නැත. අවසන් ලෙස දැඩි තීන්දුවක් ගැනීමට රාජ්‍ය නායකයාට සිදු විය. නිලධාරීන් මෙන්ම ආයතන ද හුරු වී ඇත්තේ කල් මරමින් මන්දගාමීව වැඩ කිරීමටය. මේ අභියෝගාත්මක කාලය තුළ එබඳු සම්ප්‍රදායයන් ගැළපෙන්නේ නැත.

ජනාධිපතිවරයා මෙන්ම අගමැතිවරයා ද උත්සුක වන්නේ රට වේගවත් ඉදිරි පිම්මක් වෙත යොමු කිරීමටය. ඊට දේශපාලනික වශයෙන් මෙන්ම ආර්ථික වශයෙන් ද ඇති කළ යුතු ප්‍රතිසංස්කරණ තිබේ. එම ප්‍රතිසංස්කරණත් සමඟ රට ඉදිරියට යා යුතුය. මෙහිදී තීරණාත්මක සාධකයක් බවට පත් වන්නේ ජනතාවය. ජනතාව ඇතැම් විට තම වගකීම අකුරටම ඉටු කරන අතර, තවත් විටෙක පසුගාමීව බලා සිටිති. හොඳ දේවලට සහයෝගය දෙන්නට ජනතාව මැළි විය යුතු නැත.

### දිල්රුගෙ සිව්පද

| | |
|---|---|
| මං තීරුවේ නීතිය කෙරුවාට | පසක් |
| පෙනෙනා ලෙසට එහි ඇත අඩුපාඩු | රැසක් |
| දිගු කර කුමට අතැඟිලි හදනවා | මිසක් |
| නිවැරදි කළොත් යහපත් එහි තිබෙන | දොසක් |




# කොරෝනාවෙන් ලෝක ආර්ථිකය හෙල්ලුණේ කොහොම ද?

**විදෙස් විත්ති විග්‍රහය**

කොරෝනා වයිරසය මිනිසා ව්‍යාධියට ලක් කරමින් හා ජීවිත ද ගොදුරු කර ගනිමින් මිනිස් ජීවිතවලට සෘජුව ඇති කළ බලපෑමට අමතරව ලෝක ආර්ථික දේහය කරා ද ව්‍යාප්ත වෙමින් එය විනාශය කරා රැගෙන ගියේය. ලෝක ආර්ථික බලවතා තවමත් කොවිඩ් - 19 සතුරා සමඟ සටනක යෙදී සිටියදී එරට ආර්ථිකය පසුබා ඇත්තේ රැකියා වියුක්තිකයන් මිලියන ගණනක් ඇති කරමිනි. ලොව දෙවැනි ආර්ථික බලවතා මෙන්ම මුලින්ම කොරෝනා ව්‍යාප්තියේ කේන්ද්‍රය බවට ද පත් වූ චීනයේ ආර්ථිකය ටිකෙන් ටික හිස එසවීමට වෑයම් කරමින් සිටී.

ආර්ථික සහයෝගීතාව සහ සංවර්ධනය සඳහා වන සංවිධානය (OECD) පුරෝකථනය කරන පරිදි, කොරෝනා වසංගතය මඟින් මේ වසරේ ගෝලීය ආර්ථිකයට එල්ල කරනු ලබන බලපෑම හා සිදු කරන හානිය කලින් අපේක්ෂා කළ තරමට වඩා අඩු මට්ටමක තිබෙනු ඇත. කෙසේ වුව ද, මේ ගැන තවමත් නිශ්චිතව කිව නොහැකිය.

ඉකුත් ජූනි මාසයේදී ගණන් බලා තිබූ පරිදි කොරෝනා වසංගතය හේතුවෙන් ලෝක ආර්ථිකයට වන පසුබෑම 6%කි. එහෙත් එය 4.5%ක් විය හැකි බව OECDයේ මතයයි. ගෝලීය තත්ත්වය එසේ විය හැකි වුව ද බ්‍රිතාන්‍ය ආර්ථිකයේ නම් 10.1% ක බිඳවැටීමක් තිබෙනු ඇති බව එම සංවිධානයේ ගණන් බැලීමය. ජී-20 සෙසු සාමාජික රටවල තත්ත්වය එපමණටම දරුණු වන බවක් නොපෙනේ.

## බ්‍රිතාන්‍යයේ වෙනසක්

සංවිධානයේ ප්‍රධාන ආර්ථික විද්‍යාඥ ලොරෙන්ස් බූන් පවසන පරිදි, මෙම යථාර්ථය මත අයිසින් තට්ටුවක් තැවරීමට නොහැකිය. ඇය පෙන්වා දෙන අන්දමට කලින් සිතා සිටි තරමටම තත්ත්වය බරපතළ නැත. එහෙත්, මෙය හොඳ තත්ත්වයක් සේ ගෙන සැනසීමට හැකියාවක් ද නැත. OECD ගණන් බැලීම් අනුව බ්‍රිතාන්‍යය කලින් සිටියේ මීටත් වඩා බරපතළ අඩියකය. අලුත්ම දත්තවලට අනුව එය ඊට වඩා ඉහළටම එසැවී ඇත. කලින් දරුණුම තත්ත්වයක සිටියේ බ්‍රිතාන්‍යය වුව ද සංශෝධිත දත්ත අනුව ඉතාලිය, ඉන්දියාව සහ දකුණු අප්‍රිකාවේ තත්ත්වය බ්‍රිතාන්‍යයට වඩා දරුණුය.

ලොරෙන්ස් බූන් පවසන පරිදි, කොරෝනා ගෝලීය වසංගතය හේතුවෙන් වසර 2021 වන විට අහිමි වී තිබෙනු ඇති ආර්ථික ක්‍රියාකාරකම්වල වටිනාකම ප්‍රංශයේ හා ජර්මනියේ ඒකාබද්ධ වාර්ෂික දළ ජාතික නිෂ්පාදනයේ වටිනාකමට සමාන වේ. එම පසුබෑම දෙවන ලෝක සංග්‍රාමයට පසුව ලෝක ආර්ථිකයට එල්ල වූ විශාලම පසුබෑම විය හැකි බවට මත පළ වේ. කොරෝනා වැනි ගෝලීය වසංගතයක් නොපැමිණිය ද ලෝක ආර්ථිකය පහළ මට්ටමකම තිබෙන්නට ඉඩ තිබූ බවට මත පළ විය. වසංගතය එන්නට පෙර ලෝක ආර්ථිකය වර්ධනය වූයේ වාර්ෂිකව 3%කිනි. එය එම තත්ත්වයෙන්ම ඉදිරියට ගියේ නම්, ඇ. ඩොලර් ට්‍රිලියන 80ක් වන ගෝලීය ආර්ථිකය දැනට පුරෝකථනය වන මට්ටමට වඩා ඇ. ඩොලර් ට්‍රිලියන 7ක් ඉදිරියෙන් සිටින්නට ඉඩ තිබිණි. වෙනත් වචනවලින් කිව හොත් කොරෝනා වසංගතය හේතුවෙන් ගෝලීය ආර්ථිකයේ ඇති වූ පසුබෑම යුරෝපයේ ජර්මානු හා ප්‍රංශ ආර්ථිකයන්ගෙන් හරි අඩකට පමණ සමානය.

අවම වශයෙන් ඉදිරි වර්ෂයේදීවත් ගෝලීය ආර්ථිකය පූර්ව කොරෝනා අවධියේ තිබූ තත්ත්වය කරා ගමන් කරනු ඇතැයි අපේක්ෂා කළ නොහැකි බව ආර්ථික විශ්ලේෂකයන්ගේ අදහසය. නිසි ප්‍රතිශක්තිකරණ එන්නතක් හඳුන්වා දෙන තුරු මිනිසාට සිදුවනු ඇත්තේ මේ වයිරසයත් සමඟම ජීවත් වීමටයි. ඊට මුහුණ දෙමින් ආරක්ෂිතව ජය ගැනීම ඉන් අදහස් කෙරේ.

ආර්ථික විද්‍යාඥ ලොරන්ස් බූන් අවධාරණය කරන පරිදි රටවල් සිය මූල්‍ය ප්‍රතිපත්ති ඕනෑවටත් වඩා දැඩි කිරීමේ පිළිවෙතක පිහිටා නොසිටිය යුතු තත්ත්වයක් ලෙස ද මෙය හැඳින්විය හැකිය. පසුගිය මූල්‍ය අර්බුදය හමුවේ සිදු වූයේ එයයි. ආර්ථිකය යළි යථා තත්ත්වයට ගෙන ඒමේ සැලසුම් මෙන්ම, අර්බුදයට එරෙහිව එය කළමනාකරණය කළ හැකි අන්දමේ සහාය ද මෙහිදී වැදගත්ය. ආණ්ඩුවල සහාය නොලැබෙන්නේ නම්, විරැකියාව ඉහළ යාම, බංකොලොත්වීම් ආදිය අපේක්ෂා කළ හැකිය. මේ තත්ත්වය යටතේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සඳහා ඩිජිටල් තාක්ෂණ සහාය සහ විශේෂ අවධානයක් යොමු කිරීම මෙන්ම, හරිත යටිතල පහසුකම් නැංවීම, ප්‍රවාහන සේවා නිවාස ඉදිකිරීම් ක්ෂේත්‍ර හා හරිත ආර්ථිකයක් ගැන ලෝකය අවධානය යොමු කළ යුතු බව බූන් පෙන්වා දේ. ලොව පුරා සමස්ත කර්මාන්ත ක්ෂේත්‍රය ඇත්තේ අර්බුදයකය. වසරකට පෙර තිබූ තත්ත්වය සමඟ සසඳන විට සාමාන්‍ය ගුවන් ගමන් සංඛ්‍යාව ඉන් අඩකඩ පහත වැටී තිබේ. ගුවන් ගමන් කර්මාන්තය, සංචාරක කර්මාන්තය ගැඹුරු ලෙස අර්බුදයේ ගිලී සිටී.

ඉකුත් ජූනි මාසයේදී Global Economic Prospects හැඳින් වූ පරිදි වහාම සහ නුදුරු අනාගතයේදීම එළැඹෙනු ඇති තත්ව දෙස පළමුව අවධානය යොමුවිය යුතුය. එය සිදු වනු ඇත්තේ දිගු කාලීන හානිදායි බලපෑම්වල ප්‍රතිඵල වශයෙනි. GEPට අනුව 2020 දී ගෝලීය ආර්ථිකය දෙස යොමු වන විට දළ ජාතික නිෂ්පාදනය 5.2%කින් පමණ පසුබෑමට ලක් වන බව පෙනෙන්නට තිබේ.

කොරෝනා ගෝලීය වසංගතය හමුවේ, දශක ගණනාවකට පසු ලෝක ආර්ථිකයට දරුණුම බලපෑමක් එල්ල වී තිබේ. මේ තත්ත්වය හමුවේ ආණ්ඩුවලට අසාමාන්‍ය පියවර ගැනීමට සිදු වනු ඇත.

සංවර්ධනය වෙනුවට ධරණීය සංවර්ධනය ගැන ලෝකය කතා කරන්නේ කලෙක පටන්මය. මින් ඉදිරියට ද එය ඉදිරියටම ගෙන යෑමට සිදු වන මාතෘකාවකි. විරැකියාව, අධ්‍යාපනය, සෞඛ්‍යය ආදිය දැනටමත් සාකච්ඡාවට ලක් වෙමින් ඇති මාතෘකාය.

නව ලිබරල් ආර්ථික දැක්ම නිදහස් අධ්‍යාපනය, නිදහස් සෞඛ්‍ය සේවා ආදිය බැහැර කළ ද පශ්චාත් කොවිඩ් ගෝලීය තත්ත්වය හමුවේ කතා කිරීමට සිදුව ඇත්තේ ඒවා ශක්තිමත් කිරීම ගැනය. නිදහස් සෞඛ්‍යය විවේචනය කළ අයට හා එය බැහැර කළ රටවලට නිදහස් සෞඛ්‍ය සේවා ඇති රටවලින් පාඩම් ඉගෙනීමට සිදුව ඇත.

## ඒක පුද්ගල ආදායම

ඇතැම් පුරෝකථනවලට අනුව ගෝලීය වශයෙන් අවධානය යොමු කරන විට ඒක පුද්ගල ආදායම වර්ෂ 1870න් පසු වැඩිම පසුබෑම සටහන් කරන්නට ඉඩ තිබේ. එය 7%ක පමණ පසුබෑමක් විය හැකිය. ලෝකයේ රටවල් මේ වර්ෂයේ අපේක්ෂා කරන්නේ පසුබෑමකි.

ආර්ථික වර්ධනය සලකන විට නැගෙනහිර ආසියාතික හා අත්ලන්තික් කලාපයේ රටවල පසුබෑම 0.5%ක් පමණ විය හැකි අතර, දකුණු ආසියාවේ 2.7%ක් පමණ ද, උප සහරානු අප්‍රිකානු කලාපයේ 2.8%ක් ද, මැද පෙරදිග හා උතුරු අප්‍රිකාවේ 4.2%ක් ද, යුරෝපයේ හා මධ්‍යම ආසියාවේ 4.7%ක් ද, ලතින් අමෙරිකාවේ 7.2%ක් ද විය හැකි බව අනුමාන කෙරේ. සංවර්ධන ඉලක්ක වසර ගණනාවකින් ආපස්සට හැරවීමට මෙන්ම මිලියන ගණනාවක් මිනිසුන් වැඩියෙන් අන්ත දරිද්‍රතාවේ ගිල්වීමට මේ තත්ත්වය හේතු වනු ඇත. වෙළෙඳ සංචාරක ආදී ක්ෂේත්‍රවල පසුබෑම සෞඛ්‍ය සේවයටද බලපෑම් ඇති කරයි. මෙය සෞඛ්‍ය සේවා බලගැන්විය යුතු අවස්ථාවක් වන අතර, ඊට ප්‍රතිපාදන අවශ්‍යය.

## කෘෂිකාර්මික වෙළෙඳපොළ

කෙසේ වුවද ගෝලීය වශයෙන් කෘෂිකාර්මික වෙළෙඳපොළ තුළ සතුටුදායක වර්ධනයක් දිස් විය. කෘෂිකාර්මික රටවල් වසංගත තත්ත්වය හමුවේ වුවද මුළුමනින් එම නිෂ්පාදනය ඇනහිටීමට ඉඩ නොදෙමින් වගා කටයුතුවල නියැළීම ඊට ප්‍රබලව බලපෑ සාධකයයි. ගොවිතැන් කටයුතුවලට බාධා වීමට ඇති අවස්ථා අවම කෙරිණි. යළිත් වරක් නිෂ්පාදන ආර්ථිකයක් සඳහා දිරිගැන්වීමක් ඇති වී තිබේ. ආහාර සුරක්ෂිතතාව ගැන ද අවධානය යොමුව ඇත.

වසර 2021 දී ලෝක ආර්ථිකයේ වර්ධනය සමස්තයක් ලෙස 4.2%ක් පමණ වෙතැයි අපේක්ෂිතය. කෙසේ වුවද, එය නිශ්චය කිරීම අසීරුය. පවතින තත්ත්ව යටතේ එය ඉතා අයහපත් තත්ත්වයක් නොවන අතර, සැනසිලිදායක තත්ත්වයකි. එවැනි තත්ත්වයක් අපේක්ෂා කෙරෙනුයේ ගෙවී යන වර්ෂයේදී 8%ක පමණ හැකිළීමක් ආර්ථික වර්ධනයට අදාළව දිස් වන පසුබිමකය.


ලෝක ආර්ථිකයට ඇතිවී තිබෙන හානිය පියවා දැමීමේදී කෙටි, මධ්‍ය හා දිගු කාලීන ප්‍රවේශයක් වෙත එළැඹීම අපේක්ෂිතය. එහිදී අන්තර්ජාතික සහාය ද වැදගත් බව පෙන්වා දී ඇත. මහජන සෞඛ්‍ය ඉහළ නැංවීම වැනි අරමුණුවලට ප්‍රමුඛත්වයක් දීමට මෙම ආර්ථික වැඩපිළිවෙළවලදී සිදුව තිබේ. එය මෙතෙක් ලෝකයට නිර්දේශ කර තිබූ මෙන්ම අනුගත වීමට බල කළ නව ලිබරල් ආර්ථික රටාව ප්‍රශ්න කරන මෙන්ම එය ගමන් කර ඇති අර්බුදයේ තරම ප්‍රකට කරන අවස්ථාවකි.

**ධම්මික සෙනෙවිරත්න**

> අවම වශයෙන් ඉදිරි වර්ෂයේදීවත් ගෝලීය ආර්ථිකය පූර්ව කොරෝනා අවධියේ තිබූ තත්ත්වය කරා ගමන් කරනු ඇතැයි අපේක්ෂා කළ නොහැකි බව ආර්ථික විශ්ලේෂකයන්ගේ අදහසය. නිසි ප්‍රතිශක්තිකරණ එන්නතක් හඳුන්වා දෙන තුරු මිනිසාට සිදු වනු ඇත්තේ මේ වයිරසයත් සමඟම ජීවත් වීමටයි.



ඒජාප නව නායකයා දෙසැම්බරයේ කරළියට - පුවතක්



| ලොතරැයිය | දිනය | දිනුම් වාරය | ජයග්‍රාහී අංක | අමතර |
|---|---|---|---|---|
| ගොවිසෙත | 2020 - 09 - 18 | දිනුම් වාරය - 2544 | 12 30 39 77 | අක්ෂරය P |
| සුපිරි වාසනා | 2020 - 09 - 14 | දිනුම් වාරය - 1535 | 05 06 09 10 | සුපිරි අංකය -04 |
| ලග්න වාසනාව | 2020 - 09 - 08 | දිනුම් වාරය - 2916 | 21 37 45 59 | ලග්නය-මිතුන විශේෂිත අංක රු 500 ත්‍යාග සඳහා-9609 |
| කෝටිපති කප්රුක | 2020 - 09 - 06 | දිනුම් වාරය - 621 | 05 15 40 45 | ඉංග්‍රීසි අක්ෂරය- Q |
| සංවර්ධන වාසනාව | 2020 - 07 - 31 | දිනුම් වාරය - 354 | 22 23 40 | දෛව අංකය - 02 අක්ෂරය- L |
| ජයෝදා | 2020 - 09- 09 | දිනුම් වාරය - 1688 | 07 31 35 43 | අක්ෂරය-A |
| ශනිදා වාසනාව | 2020 - 09 - 09 | දිනුම් වාරය - 3366 | 31 34 60 64 | අක්ෂරය - D |
| සුපර් බෝල් | 2020 - 09- 07 | දිනුම් වාරය - 1208 | 25 43 48 66 | අක්ෂරය - U |
| ජාතික සම්පත | 2020 - 09-02 | දිනුම් වාරය - 1051 | 6 4 8 3 9 6 | අක්ෂරය -K |
| අද කෝටිපති | 2020 - 09 - 09 | දිනුම් වාරය - 1036 | 07 12 39 48 | අක්ෂරය - K රු 500 ත්‍යාග සඳහා-2169 රු 100 ත්‍යාග සඳහා-786 |
| වාසනා සම්පත | 2020 - 09 - 07 | දිනුම් වාරය - 1611 | 10 11 37 57 | අක්ෂරය - Z |
| දරු දිරි සම්පත | 2020 - 07 - 30 | දිනුම් වාරය - 013 | 04 12 33 63 | අක්ෂරය - U |

# කෝප් - කෝපා 22-23 රැස් වෙයි

**ස්වර්ණා විජේකෝන්**

නවවැනි පාර්ලිමේන්තුව සඳහා පත් කළ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව (කෝප්) හා රාජ්‍ය ගිණුම් කාරක සභාව (කෝපා) ලබන 22 හා 23 යන දිනවලදී පාර්ලිමේන්තුවේදී රැස්වීමට නියමිතය.

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව හෙවත් කෝප් කමිටු රැස්වීම 22 දා පස්වරු 2.30ට පාර්ලිමේන්තුවේදී රැස්වීමට නියමිත අතර රාජ්‍ය ගිණුම් කාරක සභාව 23 වැනිදා පස්වරු 2.30ට රැස් වේ. මෙම කාරක සභා සඳහා පත් කළ නියෝජිතයන්ගේ නාම ලේඛනය කතානායක මහින්ද යාපා අබේවර්ධන මහතා පාර්ලිමේන්තුවට දැනුම් දුන්නේය.

අදාළ කාරක සභා දෙක රැස්වීමෙන් පසුව කාරක සභා සඳහා සභාපතිවරුන් පත් කරගැනීමට නියමිත වේ.

# කාලගුණයෙන් රතු නිවේදනයක්

**උපාලි කරුණාරත්න සහ අනුර ප්‍රේමලාල්**

දිවයිනේ ගොඩබිම් ප්‍රදේශ සඳහා වැසි තත්ත්වය අද (19) දිනයේ වැඩිවීම පිළිබඳ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව රතු නිවේදනයක් නිකුත් කර තිබේ.

නිරිත දිග මෝසම් තත්ත්වය දිවයින හරහා සක්‍රියව පවතින බැවින් දිවයිනේ නිරිත දිග කොටසේ සහ වයඹ පළාතේ වැසි තත්ත්වයේ තාවකාලික වැඩිවීමක් බලාපොරොත්තු වන බව දෙපාර්තමේන්තුව පැවසීය. ඒ අනුව අද (19) සබරගමුව, මධ්‍යම සහ බස්නාහිර පළාත්වලත් ගාල්ල සහ මාතර දිස්ත්‍රික්ක වලත්ඇතැම් ප්‍රදේශ වලට මි.මී 100-150ක පමණ තද වැසි ඇති විය හැකිය.

මධ්‍යම, ඊසාන හා නැගෙනහිර බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශවල ලබන 22 දින දක්වා තද සුළං, ඉතා තද ප්‍රහාරාත්මක සුළං (පැ.කි.මී 60-70 දක්වා), තද වැසි හා රළු හෝ ඉතා රළු මුහුදු ප්‍රදේශ ඇතිවිය හැකි බැවින් ධීවර හා නාවුක කටයුතු වලින් වැළකී සිටින ලෙස කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව ඉල්ලා සිටී.

# ආණ්ඩුවේ පිරිස් පරිසරය විනාශ කර එය සාධාරණීකරණය කරනවා

**මන්ත්‍රී විජිත හේරත්**

**නදී මාණික්කගේ**

ආණ්ඩුව පරිසරය විනාශ කරනවා පමණක් නොව ඒ විනාශය සාධාරණීකරණය කරන බව ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රචාරක ලේකම් පාර්ලිමේන්තු මන්ත්‍රී විජිත හේරත් මහතා පෙරේදා (17) පැළවත්ත පක්ෂ මූලස්ථානයේ තිබූ මාධ්‍ය හමුවකදී පැවසීය.

පාලකයන්ට කොල්ලකාරී ආර්ථික වුවමනාවන් ඉටුකර ගැනීමට අවශ්‍ය වූ විට, ඒ අයට පරිසරය හා ජන ජීවිතය වැදගත් නැති බවත්, ජයවර්ධන පාලනයෙහි සිදුවූයේ ද මෙය බවත් ඒ මහතා කීවේය.

පරිසරවේදීන් කියන දේ ගණන් නොගන්නා තත්ත්වයට ආණ්ඩුව වැටී ඇති බවත්, සංවර්ධනය යනු මානව සංවර්ධනය සහ පරිසරය සමග බැදුණු දෙයක් මිස භෞතික දෙයක් පමණක් නොවන බවත්, එක්සත් ජාතීන්ගේ සංවිධානයට අනුව තිරසාර සංවර්ධනය කියන්නේ එයට බවත් විජිත හේරත් මහතා පැවසීය.

ආනවිළුන්දාව, රිදීමාලියැද්ද ඇතුළුව රට පුරා සිදුවන පරිසර විනාශය පිටුපස සිටින්නේ ආණ්ඩුවේ පිරිස් බව පැවසූ ඒ මහතා මේ සියල්ල පිළිබඳ දැනුවත්ව ඒ විනාශයන්ට විරුද්ධ වෙන්නැයි ජනතාවගෙන් ඉල්ලා සිටින බව පැවසුවේය.

# ඉංජිනේරු පීඨවලට සිසුන් 405ක් වැඩිපුර ගනී

**සිතාරා සේනානි**

මෙරට ප්‍රධාන ඉංජිනේරු පීඨ 6 සඳහා මේ වසරේ සිසුන් 405ක් වැඩිපුර බඳවා ගැනීමට අධ්‍යාපන අමාත්‍යාංශය තීරණය කර තිබේ.

පේරාදෙණිය, ජයවර්ධනපුර, යාපනය, රුහුණ, මොරටුව සහ අග්නිදිග සඳහා විශ්වවිද්‍යාලය සඳහා මෙම සිසුන් 405 දෙනා ඇතුළත් කර ගැනීමට නියමිත ය.

කොළඹ වෝඩ් පෙදෙසේ උසස් අධ්‍යාපන අමාත්‍යංශ පරිශ්‍රයේ පැවති සාකච්ඡාවකදී අධ්‍යාපන ඇමැති මහාචාර්ය ජී. එල්. පීරිස් මහත මේ බව සඳහන් කළේය.

අධ්‍යාපන අමාත්‍යවරයා වශයෙන් තමන් හෝ රජය විශ්වවිද්‍යාල පරිපාලන කටයුතු සඳහා මැදිහත් වීමට බලාපොරොත්තු නොවන බවද, ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා ඉදිරිපත් කොට ඇති සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ඉලක්ක අනුව කටයුතු කිරීම අපේක්ෂාව බවද පැවැසීය. විශේෂයෙන් දැනට විශ්වවිද්‍යාල අධ්‍යාපනය සහ රැකියා වෙළෙඳපොළ අතර පවතින නොගැළපීමට පිළියම් සෙවීම සඳහා වෘත්තීය අභිමුඛ පාඨමාලාවක් වන ඉංජිනේරු පාඨමාලාව සඳහා මේ වසරේ නවක සිසුන් 405ක් ඇතුළත් කරගැනීම එහි ඉදිරි පියවරක් බවද සඳහන් කළේය.

අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් මහාචාර්ය කපිල පෙරේරා, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති මහාචාර්ය සම්පත් අමරතුංග, එහි ලේකම් ආචාර්ය ප්‍රියන්ත ප්‍රේමකුමාර මහත්වරු සහ අදාළ විශ්වවිද්‍යා හයේ උපකුලපතිවරු සහ පීඨාධිපතිවරු මේ අවස්ථාවට සහභාගී වූහ.

# අධිකරණ ඇමැති ජගත් සංවිධානයේ මෙරට ප්‍රධානි හමු වෙයි



**බුද්ධිකා ඉඹුලාන සහ රෝෂන් තුෂාර**

අධිකරණ ඇමැති ජනාධිපති නීතිඥ මොහොමඩ් අලි සබ්රි මහතා සහ සංක්‍රමණය සඳහා වූ අන්තර්ජාතික සංවිධානයේ ශ්‍රී ලංකා ප්‍රධානි Sarat Dash මහතා අතර හමුවක් පසුගිය දා අධිකරණ අමාත්‍යාංශයේ දී පැවැත්විණි.

මෙරට සංක්‍රමණික ගැටලු පිළිබඳ හා ඒ සම්බන්ධයෙන් පවතින නීතිමය කරුණු පිළිබඳ මෙහිදී සාකච්ඡා විය.

නීති විරෝධීව සිදු වන මිනිස් ජාවාරම වැළැක්වීමට ගත යුතු පියවර හා ඒ සම්බන්ධයෙන් පවතින නීතිමය තත්ත්වයන්, මිනිස් ජාවාරම හේතුවෙන් ඇතිව තිබෙන අහිතකර ප්‍රතිවිපාක පිළිබඳ මේ සාකච්ඡාවේදී අවධානය යොමු විය.

නීති විරෝධීව සිදු වන මිනිස් ජාවාරම වැළැක්වීමට ශ්‍රී ලංකා රජය උපරිම වශයෙන් කටයුතු කරන බව අධිකරණ ඇමැතිවරයා මෙහිදී සඳහන් කළේය.

සංක්‍රමණය සඳහා වූ අන්තර්ජාතික සංවිධානයේ සහාය ශ්‍රී ලංකා රජයට උපරිම වශයෙන් ලබාදීමට පියවර ගන්නා බව එහි ප්‍රධානී Sarat Dash මහතා පැවසීය.

1990 දී ශ්‍රී ලංකාව සංක්‍රමණය සඳහා වූ අන්තර්ජාතික සංවිධානයේ සාමාජිකත්වය ගෙන ඇති අතර, 2002 වසරේදී එම සංවිධානය මෙරට ස්ථාපිත කර තිබේ.

# තිළිණ ගමගේ ආරක්ෂකයාට වරෙන්තු

**කුමුදු හෙට්ටිආරච්චි**

නිසි බලපත්‍රයක් රහිතව අලි පැටවකු ළඟ තබා ගැනීම ඇතුළු චෝදනා මත හිටපු මහේස්ත්‍රාත් තිළිණ ගමගේ මහතා ඇතුළු විත්තිකරුවන් සිව්දෙනකුට එරෙහිව නීතිපතිවරයා පවරා ඇති නඩුවේ අධිකරණ සිතාසි මත ක්‍රියා නොකොට සාක්ෂි දීමට නොපැමිණි තිළිණ ගමගේ මහතාගේ හිටපු ආරක්ෂක නිලධාරි පොලිස් කොස්තාපල්වරයා අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කරන ලෙස කොළඹ මහාධිකරණ විනිසුරු ගිහාන් කුලතුංග මහතා ඊයේ (18) වරෙන්තු නිකුත් කළේය.

සක්කිදීමට අධිකරණයට පැමිණෙන ලෙසට සිතාසි නිකුත් කර තිබූ පොලිස් කොස්තාපල් දිසානායක නමැත්තා අත්අඩංගුවට ගැනීමය එසේ වරෙන්තු නිකුත් කෙරුණි. සාක්කිකරු පුත්තලම රෝහලට ප්‍රතිකාර සඳහා ඇතුළු වී ඇති බවට වාර්තා කර ඇතැයි නඩුව ඊයේ (18) කැඳවූ අවස්ථාවේ අධිකරණයට දන්වා සිටි නීතිපතිවරයා වෙනුවෙන් නඩුවේ පැමිණිල්ලට පෙනී සිටින නියෝජ්‍ය සොලිසිටර් ජෙනරාල් දිලීප පීරිස් මහතා ප්‍රධාන නඩුවල සාක්කිකරුවන් සාක්කිදීමට පෙර දින රෝහල් ගතවීමේ ප්‍රවනතාවක් පවතින බව සඳහන් කළේය.

තවද සාක්කිකරුගේ රෝගී තත්ත්වය පිළිබඳ අධිකරණයට වෛද්‍ය වාර්තාවක් කැඳවීමට නියෝගයක් නිකුත් කරන ලෙස ද නියෝජ්‍ය සොලිසිටර් ජෙනරාල්වරයා ඉල්ලා සිටියේය.

කරුණු සලකා බැලූ විනිසුරුවරයා දැනට පුත්තලම ප්‍රදේශයේ සේවයේ යෙදී සිටින බව කියන එම පොලිස් කොස්තාපල්වරයා අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කිරීමට වරෙන්තු නිකුත් කළේය.

## 01 වැනි පිටුවෙන්...

### 2019 ඔක්. 26...

එම කාලයේ දේශපාලන කැලඹිලි සහිත අවිචාරවත් සමයක් බව පෙන්වා දුන් ඒ මහතා එම කාලයේ රාජ්‍ය බුද්ධි සේවාව දේශපාලන ඔත්තු බැලීමේ කටයුතු සිදු කළ බව ද පෙන්වා දුන්නේය.

තමන් ආරක්ෂක ලේකම් ධුරය බාරගත් දිනයේ සිට අප්‍රේල් 8 වැනි දා දක්වා අන්තවාදී ප්‍රහාරයක් එල්ල විය හැකි බවට වන බුද්ධි වාර්තාවක් තමන් වෙත ලැබී නැති බව කියා සිටි ඒ මහතා, තමන් ප්‍රකාශ කරන දෙය පිළිගන්න නොහැකි නම් බුද්ධි විශ්ලේෂකයන් ගෙන් සමන්විත වන කමිටුවක් හරහා හෝ විමර්ශන කරන ලෙස කොමිසමෙන් ඉල්ලා සිටියේය.

ප්‍රහාරයක් සම්බන්ධයෙන් වන සෘජු පණිවිඩයක් තමාට ලැබී නැති බව කියා සිටි ඒ මහතා, සහරාන් හෂීම් සම්බන්ධයෙන් ලැබුණු වාර්තාවලට අනුව තමා දැන සිටියේ ද ඔහු අන්තවාදී ආගමික දේශකයකු ලෙස යැයි ද කොමිසමට කියා සිටියේය. ඒ මහතා මේ බව කියා සිටියේ පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් දැනුවත් වී සිටියේ ද යන්න විමසමින් කොමිසම යොමු කළ ප්‍රශ්නයකට පිළිතුරු ලබා දෙමිනි.

රාජ්‍ය බුද්ධි අධ්‍යක්ෂ නිලන්ත ජයවර්ධන මහතා සෘජුවම හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා සමග සම්බන්ධතා පැවැත් වූවා. මම පත්වීම ලබා දින දෙක තුනක් තුළ හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා හමුවෙන්න අස්සන් කිරීමට ඇති ලිපිගොනු අරගෙන ගියා. එහිදී මම බුද්ධි තොරතුරක් ගැන කතා කරන අවස්ථාවේ නිලන්ත මට ඒක ගන්න එපා කියා කිව්වා. ඒ වගේම තවත් අවස්ථාවක එලෙසම සිදු වුණා. මම නිලන්ත ජයවර්ධන මහතාට දුරකථනයෙන් කතා කර විමසුවාම ඒ මහතා කිව්වා ඔව් මම දැනුම් දෙනවා. හැමදාම සිදුවන්නේ එලෙසින් කියා. එහිදී මම කිව්වා බුද්ධි තොරතුරු මෛත්‍රීපාල සිරිසේන මහතාට සෘජුවම දෙන්න මට දෙන්න එපා කියා. ඒ වගේම මා මෛත්‍රීපාල සිරිසේන මහතාට කියන්න තිබූ කරුණු මට හමුවීමට නොහැකි වූ අවස්ථාවල නිලන්ත ලවා කියවා තිබෙනවා. ආරක්ෂාවට තර්ජනයක් වූ තොරතුරු තිබේ නම් නිලන්ත ජයවර්ධන මහතාට එය මෛත්‍රීපාල සිරිසේන මහතාට කියන්න බැරි කමක් නැහැ. මම හිතන්නේ නැහැ මෙම තොරතුර හිටපු ජනාධිපති වරයා දැන් නොසිටියා කියා. එහෙම ප්‍රශ්නයක් ඇති වුණා නම් නිලන්ත ජයවර්ධන මහතා මා හමු වී සාකච්ඡා කළ යුතුය. අප්‍රේල් 9 පැවැති ආරක්ෂක මණ්ඩලය රැස්වීමේදී ඔහු මේ ගැන කතා කළේ නැහැ. ජාතික බුද්ධි ප්‍රධානි සිසිර මෙන්ඩිස් මහතා ඔහුගෙන් මේ බව ඇහුවම කිව්වේ මම ටීම් එකක් ඇරලා තියෙන්නේ කියායි. පොලිස්පතිවරයාට වාර්තාවක් යවන්න සකස් කර තියෙන්නේ කීවා. සර්ට සවිස්තරාත්මක වාර්තාවක් දින දෙක තුනකින් දෙන්නම් කියා කිව්වා. නිලන්ත ජයවර්ධන මහතා එම රැස්වීමේ ඒ බව කතා නොකළේ ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී ත්‍රිවිධ හමුදා පතිවරුන් මේ බව දැන ගනීවී කියා යැයි මා හිතනවා.

මේ අවස්ථාව වන විට ජනාධිපතිවරයා හා මා අතර විරසකයක් තිබුණා. මම තනතුරෙන් ඉවත් වෙන්න හිටියේ. මම රැස්වීමක කතා කරපු දෙයක් නිසා මෛත්‍රීපාල සිරිසේන මහතා මාව හමුවන්න වත් කැමැත්තක් තිබුණේ නැහැ. මට යාළුවෝ කිව්වා මාස හයක්වත් ඉන්න කියා. රේඛිය ඇමැතිවරයා සහ ලේකම්වරයා අතර සම්බන්ධය නැතිව වැඩ කරන්න අමාරුයි. මැයි මාසයේ අස්වීමේ ලිපිය දෙන්නයි මම හිටියේ. ඊට පෙර අවාසනාවන්ත ලෙස ප්‍රහාරය සිදු වුණා.

### වෙන්නප්පුව සභාපති...

ඉකුත් 16 දා මෙම ගස් කැපිල්ල සිදු වී ඇති අතර, මෙලෙස කපා දමා ඇත්තේ තේක්ක ගස් කීපයකි. වසර තිහක් පමණ පැරණි මේ ගස් කපා දැමුවේ ප්‍රදේශයේ විහාරස්ථානයක අවශ්‍යතාව මත යැයි මීට මුල් වූ ප්‍රාදේශීය දේශපාලන නායකයකු පැවසීය. ඔහු වැඩි දුරටත් කියා සිටියේ ගස් කැපීම සඳහා වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ අනුමැතිය තමන්ට ලැබුණු

බවයි .

මේ පිළිබඳ කළ විමසීමේදී වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ සභාපති සුසන්ත පෙරේරා මහතා කියා සිටියේ මේ ගස් කැපීම සඳහා වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ අනුමැතිය ලැබුණු බවයි .

ඒ හේතුවෙන් තමන් මේ ගස් කැපීම සඳහා අදාළ පුද්ගලයනට ලිඛිත අවසරයක් ලබා දුන් බව ද පැවසීය . මේ ගස් තිබූ භූමිය දංකොටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් එකක් බව දන්නේ ද යන්න විමසූ විට ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ප්‍රකාශ කළේ වෙන්නපුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සියලු ක්‍රීඩාංගණ තම සභාව පාලනය කරන බැවින් මේ භූමිය තමන්ට අයත් භූමියක් ලෙස සැලකූ බවයි. මේ සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම් වරයාගෙන් අනුමැතිය ලබා ගත්තේ ද යන්න විමසූ විට සභාපතිවරයා කියා සිටියේ එසේ අවශ්‍ය නොවන බවයි .

මේ පිළිබඳ කළ විමසීමේදී වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ විපක්ෂ නායක ශිරෝන් ප්‍රනාන්දු මහතා කියා සිටියේ මේ සිදුවීම මුදල් කමිටුවට පැමිණි අවස්ථාවේ සභාපතිවරයා මේ භූමිය ප්‍රාදේශීය සභාවට අයත් භූමියක් බව ප්‍රකාශ කළ බවයි. ඒ හේතුවෙන් ඊට අනුමැතිය ලබා දුන් බව විපක්ෂ නායකවරයා පැවසීය .

දන්කොටුව ප්‍රාදේශීය ලේකම්වරයා මෙදින ප්‍රාදේශීය කාර්යාලයේ නොසිටි අතර, ඔහුගෙන් දුරකතනයෙන් කළ විමසීමේදී කියා සිටියේ මේ භූමිය රජයට අයත්

තම පාලනය යටතේ පවතින්නක් බවයි . මේ පිළිබඳ විධිමත් පරීක්ෂණයක් පවත්වන තෙක් කපා දැමූ ගස් ප්‍රවාහනය කිරීම තහනම් කර ග්‍රාම නිලධාරිනිය බාරයට ගත් බවද පැවසීය .

### කුඩු වෙනුවට ...

අත්අඩංගුවට ගත් තරුණයා ඔහුට අයිති බටහිර ඖෂධ අලෙවිසලක බලපත්‍රය උපයෝගී කරගෙන ආයතනවලින් මෙම ඖෂධ පෙති ලබාගෙන දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය ආසන්නයේ ලොතරැයි අලෙවි කරන කුටිවලට ලබාදී, කාන්තාව යොදාගෙන අලෙවි කර ඇතැයි ද පොලීසිය කීය.

ඊට අමතරව තරුණයා දුරකතනය හරහා ඉල්ලුම් කරන කැකිරාව, ගලේවෙල, අනුරාධපුර, පොලොන්නරුව, මින්නේරිය ආදී දුර බැහැර ප්‍රදේශවල සිට පැමිණෙන තරුණයන්ට පෙති අලෙවි කරන බව ද පොලීසිය අනාවරණය කරගෙන තිබිණි.

ඒ අනුව උපාය දූතයකු යොදා දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය ඉදිරිපිට ලොතරැයි කුඩුවක මෙම පෙති සඟවා අලෙවි කිරීමේ කටයුත්තේ යෙදී සිටි කාන්තාව ද ලොතරැයිපත් සමග අත්අඩංගුවට ගත් බව පොලීසිය ප්‍රකාශ කළේය.

ඉතාම අඩු වටිනාකමකින් යුතු වේදනා නාශක පෙති රුපියල් 300 සිට රුපියල් 500 දක්වා වූ මිල ගණන් යටතේ අලෙවි කිරීම සිදුකර ඇති බව සැකකරුවන්ගෙන් ප්‍රශ්න කිරීමේ දී හෙළි වී තිබේ.

මෙසේ අත්අඩංගුවට ගත් තරුණයා සහ කාන්තාව ඖෂධ පෙති දඹුල්ල මහේස්ත්‍රාත් අධිකරණයට 18 දින ඉදිරිපත් කිරීමට නියමිත බව පොලීසිය වැඩිදුරටත් සඳහන් කළේය.

දඹුල්ල මූලස්ථාන පොලිස් පරීක්ෂක එස්.පී. එදිරිසිංහ මහතාගේ උපදෙස් මත උප පොලිස් පරීක්ෂක වන්නිනායක, සැරයන් වරුන්වන රංගජීව, හේරත් , කොස්තාපල් වරුන් වන වරුණ, මංජුල, තෙන්නකෝන්, බණ්ඩාර කාන්තා පොලිස් සැරයන් වසන්තා යන නිලධාරීහු මෙම වැටලීමට එක්ව සිටියහ.

### දෙමටගොඩ චමින්දගේ...

ඉකුත් 12 වැනි දා සිරකරු දිනයේදී දෙමටගොඩ චමින්දගෙ මවට කාන්තා බන්ධනාගාරයට පිටතින් හෙරොයින් පැකට් කිහිපයක් විසිකර ඇති අතර,

එම හෙරොයින් ලබා ගැනීම සඳහා වාට්ටුවෙන් පිටතට යාමට ඇයට, මෙම බන්ධනාගාර නියාමකවරිය අවස්ථාව සලසා දී තිබෙන බවට තොරතුරු අනාවරණය වී ඇත. දෙමටගොඩ චමින්දගේ මව එම හෙරොයින් ලබාගෙන වැලිකඩ කාන්තා බන්ධනාගාරයේ රැඳවූවන්ට ඉහළ මුදලට අලෙවි කර ඇති බව ද බන්ධනාගාර බුද්ධි අංශ තෙරතුරු හෙළි කර ගෙන තිබේ. ඇයට සිරමැදිරියෙන් පිටතට යාමට පහසුකම් සැලසූ බන්ධනාගාර නියාමකවරියට ද මුදල්ත්‍යාග ලබාදී ඇති බව බන්ධනාගාර ආරංචි මාර්ග කියයි.

කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරයේ වළ දමා තිබූ මාංචු කුට්ටමක යතුරක් ද බන්ධනාගාර බුද්ධි අංශයේ නිලධාරීන් සොයාගෙන ඇත. මෙම යතුර බෝතලයක දමා විශේෂ අපරාධකරුවන් රඳවා සිටින G වාට්ටුව ඉදිරිපිට වළ දමා තිබී ඇත. නඩු කටයුත්තකට රැගෙන යන අවස්ථාවේදී පලා යාමට භාවිත කිරීම සඳහා කිසියම් රැඳවූවකු මෙම යතුර සඟවා තබන්නට ඇති බවට බන්ධනාගාර බුද්ධි අංශ සැක පළ කරයි.

මේ අතර කොහු ලණු බෝලයක ආකාරයට සකසා ඒ තුළට දැමූ දුම්කොළ තොගයක් දුම්බර බන්ධනාගාරයේ තාප්පයෙන් එම බන්ධනාගාරයට විසිකිරීමට තැත් කළ පුද්ගලයකු එම බන්ධනාගාර නිලධාරීන් අල්ලාගෙන පොලීසියට බාරදී ඇත.

### විශ්‍රාමික මේජර්...

නීතිඥ විශ්‍රාමික මේජර් අජිත් ප්‍රසන්න මහතා ඇප මත මුදාහරින ලෙස ඉල්ලා ගොනු කරතිබූ පෙත්සමක් අභියාචනාධිකරණය ප්‍රතික්ෂේප කරන ලදී.

පෙත්සම මඟින් ඉදිරිපත් කළ කරුණු ඇප දීමට තරම් සුවිශේෂී නොවන බවට තීරණය කළ අධිකරණය පෙත්සම ඉවත දැමීය.

අභියාචනාධිකරණ විනිසුරුවරුන් වන අචල වෙන්ගප්පුලි සහ ප්‍රියන්ත ප්‍රනාන්දු යන මහත්වරු හමුවෙහි පෙත්සම කැඳවන ලදී.

එහිදී පෙත්සම්කාර විශ්‍රාමික මේජර් අජිත් ප්‍රසන්න මහතා වෙනුවෙන් පෙනී සිටි ජනාධිපති නීතිඥ අනිල් සිල්වා මහතා සඳහන් කළේ සිය සේවාදායකයා දිගින් දිගටම බන්ධනාගාරගත කර සිටින නිසා ඔහුගේ දියණිය මානසික පීඩාවට ලක්ව සිටින බවය.

එය සුවිශේෂී කරුණක් ලෙස සලකා ඔහු ඇප මත මුදා හරින ලෙස හෙතෙම ඉල්ලා සිටියේය. එහෙත් එය සුවිශේෂී කරුණක් ලෙස පිළිගැනීම අධිකරණය ප්‍රතික්ෂේප කළේය.

තරුණයින් එකොළොස් දෙනකු අතුරුදන් කරවීම සම්බන්ධයෙන් පැවැත්වෙන නඩු විභාගයකට අදාළව මාධ්‍ය සාකච්ඡාවක් පවත්වා සාක්කිකරුවන්ට බලපෑම් කිරීම සම්බන්ධයෙන් විශ්‍රාමික මේජර් අජිත් ප්‍රසන්නට එරෙහිව චෝදනා නඟා තිබිණි.

එමඟින් වින්දිතයන් සහ සාක්කිකරුවන් සුරැකීමේ පනත යටතේ වරදක් කර ඇති බැවින් ඔහු රිමාන්ඩ්ගත කිරීමට මහේස්ත්‍රාත් අධිකරණය මීට පෙර නියම කළේය.

ඔහු සුදුසු ඇපයක් මත මුදාහරින ලෙස ඉල්ලා මෙම පෙත්සම ඉදිරිපත් කර තිබුණි.

### තමිල්නාඩුවට පැන්න...

ප්‍රදීප් කුමාර බණ්ඩාර නම් එම පොලිස් නිලධාරියාව රාමනාථපුරම් පොලීසිය අත්අඩංගුවට ගැනීමෙන් පසුව මෙලෙස කොයිම්බතූර් අපරාධ පරීක්ෂණ කොට්ඨාසයට බාර දී තිබෙන බව වාර්තා වෙයි.

මෙම සිද්ධිය සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත්වීම සඳහා ඉන්දියාවේ දී මිය ගිය බව පැවසෙන කොස්ගොඩ තාරක සම්බන්ධයෙන් පරීක්ෂණ මෙහෙය වූ පොලිස් නිලධාරියාව අනුයුක්ත කර තිබේ.

පසුගිය දා සපුගස්කන්ද ප්‍රදේශයේ දී සොයා ගත් හෙරොයින් කිලෝ ග්‍රෑම් 23 මොහු විසින් එම ස්ථානයට ගෙන ගොස් තිබෙන අතර, එම හෙරොයින් තොගය හමුවූයේ පොලිස් කොස්තාපල්වරයාගේ සොහොයුරාගේ ලී මඩුවක තිබී බව පොලීසිය පවසයි.

කොළඹ අපරාධ කොට්ඨාසයට අනුයුක්තව සිටි සිය සොහොයුරා හෙරොයින් ගෙනැවිත් සිය වඩු මඩුවේ සඟවා තබන බවට ඔහු පොලීසියට සඳහන් කර තිබේ.

## 01 වැනි පිටුවෙන්...

### අගමැති මෝදිගේ...

ඒ අනුව සුබ පැතුම් එක්කිරීම සම්බන්ධයෙන් ඉන්දීය අගමැතිවරයා ට්විටර් පණිවුඩයක් මගින් ජනාධිපතිවරයා වෙත සිය ස්තුතිය පළ කර ඇත.

මේ අතර ඉන්දීය අගමැතිවරයාගේ ජන්ම දිනයට අගමැති මහින්ද රාජපක්ෂ මහතා ද දුරකතනය ඔස්සේ සුබ පැතුම් එක් කළේය.

උපන්දින සුබ පැතුම් එක් කිරීම සම්බන්ධයෙන් ස්තුති කළ ඉන්දීය අගමැති නරේන්ද්‍ර මෝදි මහතා, අගමැති මහින්ද රාජපක්ෂ මහතා සමග සුහද කතාබහක නිරත වෙමින්, මව්-පිය පදවි ලැබූ ක්‍රීඩා ඇමැති නාමල් රාජපක්ෂ මහතාට සහ ඔහුගේ බිරිය ලිමිණි රාජපක්ෂ මහත්මියට සුබපැතුම් එක් කළේය.

### විස්සට එරෙහිව...

එළඹෙන 22 වැනි දා 20 වැනි සංශෝධනය ආණ්ඩුව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබීමෙන් අනතුරුව සතියක් තුළදී සමගි ජන බලවේගය අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව එම පක්ෂයේ මහ ලේකම් රංජිත් මද්දුමබණ්ඩාර මහතා විපක්ෂ නායක කාර්යාලයේ දී ඊයේ (18) පැවැති මාධ්‍ය හමුවේ දී ප්‍රකාශ කළේය.

මේ වන විට නීති විශාරදයන්ගේ උපදෙස් පරිදි ඒ සඳහා සූදානම් වන බව මහ ලේකම්වරයා පැවසීය.

### ආරච්චිකට්ටුව...

මෙම පරිසර පද්ධතිය ඩෝසර් යන්ත්‍රයක් මගින් විනාශ කර එහි ඉස්සන් පොකුණක් ඉදිකිරීමට කටයුතු කළේ යැයි සැක පිට අත්අඩංගුවට ගෙන රක්ෂිත බන්ධනාගාර ගත කර සිටින සැකකරුවන් දෙදෙනා ඇප මත මුදා හරිමින් ඊයේ (18) මහේස්ත්‍රාත්වරයා මේ බව කියා සිටියේය.

මෙම සැකකරුවන් දෙදෙනාට වෙන් වෙන්ව රුපියල් ලක්ෂය බැගින් ශරීර ඇප නියම කර ඇප මත මුදා හැරුණු අතර, නැවත නඩු විභාගය ලබන වසරේ මාර්තු 26 වැනි දාට නියම කළේය.

මෙසේ ඇප නියම වුයේ ඩෝසර් යන්ත්‍ර ක්‍රියාකරු වන බත්තුළුඔය කීරියන්කල්ලිය පදිංචි පෝරුතොටගේ සුජිත් කුමාර ප්‍රනාන්දු සහ බැකෝ යන්ත්‍ර ක්‍රියාකරුට එම කාර්යය පවරා ඇති ව්‍යාපාරිකයකු වන බත්තුළුඔය පිංකට්ටිය පදිංචි වර්ණකුලසූරිය නිශාන්ත ප්‍රනාන්දු යන සැකකරුවන්ටය.

සැකකරුවන් වෙනුවෙන් තරංග දිසානායක, රුවන් ප්‍රනාන්දු හා සම්පත් කරුණාසේකර යන නීතිඥවරු පෙනී සිටියහ.

### Ceylon Tea නම...

සීනි, ග්ලූකෝස් වර්ග සහ සෝඩියම් බයිකාබනේට්, පෙරස් සල්ෆේට් වැනි ද්‍රව්‍ය මිශ්‍රණයෙන් කෙරෙන තේ නිෂ්පාදන ගැන මෑතක සිට මාධ්‍ය මගින් වාර්තා වන බවත් එවැනි තේ ලෝක වෙළෙඳ පොළේ දී ප්‍රතික්ෂේප වීමෙන් තේ කර්මාන්තය දැවැන්ත පසුබැසීමකට ගොදුරු වී තිබෙන බවත් පැවැසූ ජනාධිපති රාජපක්ෂ මහතා, රටේ කීර්තිනාමයට මෙන්ම ලෝක වෙළෙඳපොළේ Ceylon Tea සඳහා ඇති ඉල්ලුමට හානියක් වීමට මින් ඉදිරියට කිසිසේත් ඉඩදිය නොහැකි බව අවධාරණය කළේය. ගම්මිරිස් වෙළෙඳපොළට සිදු වූ හානිය තේ කර්මාන්තය ගොදුරුවීමට ඉඩ නොතබන බවත්, ඒ මහතා පැවැසීය.

ගුණාත්මක තේ නිෂ්පාදනය පිළිබඳ සුළු හා මධ්‍ය පරිමාණ තේ කම්හල් හිමියන් සහ අපනයනකරුවන් සමග ඊයේ (18) ජනාධිපති කාර්යාලයේ පැවති සාකච්ඡාවේදී ජනාධිපතිවරයා මේ බව පැවසීය.

ලෝක වෙළෙඳ පොළේ තේ සඳහා ඉල්ලුම 65% සිට 45% දක්වා පහළ වැටීමට තේ නිෂ්පාදනයේ ගුණාත්මක පරිහානිය බලපා තිබේ. මෙරට තේ කර්මාන්ත ශාලා සංඛ්‍යාව 705කි. කර්මාන්ත ශාලා 45කින් අයථා ක්‍රියාකාරකම් වාර්තා වී ඇති අතර, පරීක්ෂණවලින් පසු 18ක නිෂ්පාදන නතර කළ බව තේ මණ්ඩලයේ සභාපති ජයම්පති මොල්ලිගොඩ මහතා පැවසීය. රටට ලැබෙන ආදායමට හෝ තේ කර්මාරටට ලැබෙන ආදායමට හෝ තේ කර්මාන්තයට හෝ බාල තේ නිෂ්පාදනයෙන් බාධාවක් වීමට ඉඩ නොතැබිය යුතුය. ඉහළ ගුණාත්මක බවින් යුතු තේ ලෝක වෙළෙඳපොළට සැපයීමට තේ කර්මාන්තශාලා හිමියන් මෙන්ම අපනයනකරුවන් වගබලා ගත යුතුය. බාල තේ නිෂ්පාදනයට ඉඩ නොදෙන අතර එය නොතකා ක්‍රියා කරන කර්මාන්තශාලා වසා දමන්නැයි ජනාධිපති නිලධාරීන්ට උපදෙස් දුන්නේය.

රාජ්‍ය අමාත්‍ය කනක හේරත්, ජනාධිපති ප්‍රධාන උපදේශක ලලිත් වීරතුංග, කැබිනට් හා රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරු, වැඩබලන පොලිස්පති, බුද්ධි අංශ ප්‍රධානීන් ඇතුළු නිලධාරින් සහ තේ කර්මාන්තශාලා හිමියන් සහ අපනයනකරුවන් මෙම සාකච්ඡාවට එක්ව සිටියහ.

### පොලීසියට පහර දුන්...

බණ්ඩාරගම අටළුගම ප්‍රදේශයේ පදිංචි පුද්ගලයන් හතරදෙනකු මෙලෙස රක්ෂිත බන්ධනාගාර ගත කෙරිණි.

මේ අතර එම පුද්ගලයන් වෙත නවාතැන් පහසුකම් ලබා දී සැඟව සිටීමට ආධාර අනුබල දුන් බලන්ගොඩ කුරගල ප්‍රදේශයේ පදිංචි පියකු සහ පුතෙකු ද 22 වැනි දා දක්වා රක්ෂිත බන්ධනාගාර ගත කරන ලෙස පෙරේදා (17) දා බලන්ගොඩ මහේස්ත්‍රාත් වරයා නියෝග කළේය .

බණ්ඩාරගම අටළුගම ප්‍රදේශයේ නිවෙසක පවත්වාගෙන ගිය ගංජා ජාවාරමක් වැටලීමට ගිය බණ්ඩාරගම පොලීසියේ නිලධාරීන් කණ්ඩායමකට ඉකුත් 9 වැනි දා පහර දී තිබුණි. එම සිද්ධියට සම්බන්ධ යැයි කියන මොවුන් බලන්ගොඩ කල්තොට කුරගල ප්‍රදේශයේ නිවසක සැඟව සිටිය දී කල්තොට පොලීසියට ලද තොරතුරකට අනුව පෙරේදා (17) අලුයම අත්අඩංගුවට ගැනිණි.

### මෝල් හිමියන්...

මේ අනුව ආණ්ඩුවක් වශයෙන් ජනතාව අපහසුතාවට පත් කරමින් සහල්වලට පනවා ඇති උපරිම සිල්ලර මිල වෙනස් කිරීමට කිසිදු අදහස් නැති බව ද බන්ධුල ගුණවර්ධන අමාත්‍යවරයා ප්‍රකාශ කළේය. අමාත්‍යවරයා මේ බව අවධාරණය කළේ ඊයේ (18) කොළඹ, වොක්ෂෝල් වීදියේ පිහිටි වෙළෙඳ අමාත්‍යාංශ ශ්‍රවණාගාරයේ පැවැති මාධ්‍ය හමුවට සහභාගී වෙමිනි.

තොග වෙළඳ පොළට සහල් නිකුත් නොකරන විශාල පිරිසක් මෙහි සිටින බව කියා සිටි අමාත්‍යවරයා මෙයට පිළියම් වශයෙන් කැබිනට් අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව සහල් මෙට්‍රික් ටොන් ලක්ෂයක් ආනයනය කිරීමට බලාපොරොත්තු වන බවද ඇමැතිවරයා කීවේය.

### වීදුරු බව හඟවා...

මෙම කහ තොගය බ්ලූමැන්ඩල් ප්‍රදේශයේ වාහන අංගනයකදී ලොරිවලට පටවමින් සිටි පුද්ගලයන් 10 දෙනකු පොලීසිය අත්අඩංගුවට ගෙන ඇත. ඒම සැකකරුවන් සමඟ කහ කිලෝ 33,000ක් සහ උදු පිටි කිලෝ 3,000ක් ද පොලිස් බාරයට ගෙන තිබේ.

පෞද්ගලික ඔත්තුකරුවකුගෙන් පෙරේදා (17) ලැබුණු තොරතුරක් මත මෙම සැකකරුවන් අත්අඩංගුවට ගත් බව බ්ලූමැන්ඩල් පොලිසීයේ පොලිස් නිලධාරියකු දිනමිණ ට පැවැසීය.

මෙම කහ තොගය ව්‍යාජ ලෙස මෙරටට ආනයනය කර ඇත්තේ මට්ටක්කුලිය ප්‍රදේශයේ පදිංචි මොහොමඩ් ශෙරික් මොහොමඩ් රිස්වි නම් පුද්ගලයකු බවත්, ඔහු ඇතුළු තවත් සැක 9 දෙනෙකු අලුත්කඩේ මහේස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කළ බවත් හෙතෙම පැවසීය.

## මරණ දැන්වීම්

**බෝලවලාන ශා. ඇග්නස් කන්‍යාරාමයේ ගරු මේරි යෝලන්ඩ් ප්‍රනාන්දු කන්‍යා සොයුරිය ස්වර්ගස්ථ වූවාය. ඇයගේ මෘත දේහය බෝලවලාන යහපත් එඬේරා කන්‍යාරාමයේ තැන්පත් කර තිබෙන අතර, 19 වැනි සෙනසුරාදා පෙ.ව. 10.30 ට පැවැත්වෙන දිව්‍ය පූජා යාගයෙන් අනතුරුව භූමදානය සිදු කෙරේ.** *056771*

# රජයේ ඉඩම්වල කළුගල් කැණීම් සොයා බැලීමේ කමිටුවේ වාර්තාව අගමැතිට



රජයේ ඉඩම්වල සිදු කරන කළුගල් කැණීම් කර්මාන්තය පිළිබඳ සොයා බැලීමට පත් කළ කමිටුවේ වාර්තාව අගමැති මහින්ද රාජපක්ෂ මහතාට බාරදීම අරලියගහ මන්දිරයේදී ඊයේ (18) සිදු කෙරිණි.

ඉඩම් කොමසාරිස් ජනරාල් ආර්. එම්. සී. එම් හේරත් මහත්මියගේ සහභාගිත්වයෙන් යුතු එම කමිටුව සාමාජිකයන් 12 දෙනෙකුගෙන් සමන්විත වන අතර කමිටු වාර්තාව භාරදීමෙන් අනතුරුව අගමැතිවරයා කමිටුවේ නිර්දේශ සහ යෝජනාව පිළිබඳ විමසා බැලීය.

කළුගල් කර්මාන්තයේ යෙදෙන ව්‍යාපාරිකයන්ට ප්‍රායෝගිකව මුහුණපාන ගැටලු අවම කිරීම සඳහා පරිහරණ හා කැණීම් ගාස්තු එකම ක්‍රමවේදයක් යටතේ ක්‍රියාත්මක වන පරිදි සංශෝධනය කරන ලෙස අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමා අදාළ නිලධාරීන්ට මෙහිදී උපදෙස් දුන්නේය.

ඒ අනුව කළුගල් කැණීම් කර්මාන්තයේ නියැළෙන ව්‍යාපාරිකයන්ගේ හිඟ බදු මුදල් සහනදායී ක්‍රමවේදයක් යටතේ ගෙවීමට හැකි වන පරිදි සංශෝධන ක්‍රියාත්මක කරන්නැයි ද අගමැතිවරයා දැනුම් දුන්නේය.

මේ සංශෝධන ක්‍රියාත්මක වීමේදී නිවෙසක් තැනීමට කළුගල් මිලට ගන්නා පාරිභෝගික ජනතාවට බලපෑමක් නොවන පරිදි මිල ක්‍රියාත්මක විය යුතු බව අවධාරණය කළේය.

රජයේ ඉඩම්වල කළුගල් කැණීම් සඳහා බලපත් ලබා ගැනීමේදී ආයතන කිහිපයකට ගොස් නිර්දේශ ලිපි ලබා ගැනීමට සිදුව තිබෙන බව මේ හමුවට එක් වූ ජාතික කළුගල් නිෂ්පාදන සංගමයේ සාමාජිකයෝ පෙන්වා දුන්හ.

ඊට විසඳුමක් ලෙස අදාළ කැණීම් බලපත් නිකුත් කිරීමේදී පොදු එක් ක්‍රමවේදයකට යොමුවීමත්, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය පමණක් පාරිසරික හා පුරාවිද්‍යා නිර්දේශය ලබා ගැනීම හා පුරාවිද්‍යා නිර්දේශය එක් පාෂාණ නිස්සාරණ ව්‍යාපෘතියකට එක් වරක් පමණක් ලබාදීමටත් මෙහිදී තීරණය විය.

ඇමැතිවරුන් වන චමල් රාජපක්ෂ, මහින්ද අමරවීර, අගමැති ලේකම් ගාමිණී සෙනරත්, වාරිමාර්ග අමාත්‍යංශයේ ලේකම් අනුර දිසානායක, වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යංශයේ ලේකම් එම්. කේ. බී. හරිස්චන්ද්‍ර, ඉඩම් අමාත්‍යංශයේ ලේකම් ආර්. ඒ.ඒ.කේ. රණවක, පරිසර අමාත්‍යංශයේ ලේකම් අනිල් ජාසිංහ, අගමැති අතිරේක ලේකම්වරුන් වන චමින්ද කුලරත්න, ඇන්ටන් පෙරේරා, ඉඩම් කොමසාරිස් ජනරාල් ආර්. එම්. සී. එම්. හේරත්, වනජීවී සංරක්ෂක දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ඩබ්ලිව්.ඒ.සී වේරගොඩ, භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශය අධ්‍යක්ෂ ජනරාල් ඉංජිනේරු ඩී. සජ්ජන ද සිල්වා, මධ්‍යම පරිසර අධිකාරියේ සභාපති සිරිපාල අමරසිංහ, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සභාපති නීතිඥ නිලන්ත විජේසිංහ මහත්වරු ඇතුළු රාජ්‍ය ආයතන ප්‍රධානීන් සහ ජාතික කළුගල් නිෂ්පාදන සංගමයේ නියෝජිතයෝ පිරිසක් මේ අවස්ථාවට එක්ව සිටියහ.

## මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් 805කට යතුරුපැදි



කොවිඩ්-19 වසංගතය හමුවේ දැඩි ජීවිත අවදානමක් සහිතව සේවය කළ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ට යතුරුපැදි ලබාදීමට රජය පියවර ගනී. ඔවුන් වෙනුවෙන් සංකේතාත්මකව නිල යතුරුපැදි ලබාදීම ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් ජනාධිපති කාaර්යාලයේදී ඊයේ (18) සිදු කෙරිණි.

2015 වසරේ සිට කිසිදු මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයකුට යතුරුපැදි ලැබී නොතිබිණ. සේවා කාලයේ යතුරුපැදි නොලැබුණු, දිවයිනම ආවරණය වන පරිදි තෝරාගත් සෞඛ්‍ය වෛද්‍ය බල ප්‍රදේශ 26ක සේවය කරන මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු 749 දෙනෙක් හා ප්‍රමුඛතා පදනමින් තෝරාගත් තවත් මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් 56 දෙනෙකුට යතුරු පැදි බෙදා දෙනු ලැබීය.

මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් බඳවා ගැනීමේදී වසර 02ක පූර්ණ කාලීන පාඨමාලාවකට යොමු කෙරේ. පුහුණු කාලය දීර්ඝ කර උපාධියක් ගැනීමේ අවස්ථාව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම සමඟ සාකච්ඡා කර උදාකර දෙන බව ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා පැවැසීය.

සෞඛ්‍ය ඇමැතිනී පවිත්‍රා වන්නිආරච්චි සහ අමාත්‍යාංශ ලේකම් විශ්‍රාමික මේජර් ජනරාල් විශේෂඥ වෛද්‍ය සංජීව මුණසිංහ, කොවිඩ් හදිසි ප්‍රතිකාර සඳහා සෞඛ්‍ය පද්ධතිය පෙර සූදානම් කිරීමේ ව්‍යාපෘතියේ අධ්‍යක්ෂ වෛද්‍ය ජයසුන්දර බණ්ඩාර මහත්ම මහත්මීහුද මේ අවස්ථාවට එක් වූහ.



# අදට ගැළපෙන අයුරින් ඉඩම් ප්‍රතිසංස්කරණ පනත සකස් කිරීමට අවශ්‍යයි

## හෙක්ටර් කොබ්බෑකඩුව අනුස්මරණ උත්සවයේදී ඇමැති අනුරාධ ජයරත්න කියයි

**චන්දිමා කරුණාරත්න**

අදට ගැළපෙන ආකාරයට ඉඩම් ප්‍රතිසංස්කරණ පනත සකස් කරන්න අවශ්‍ය බව ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව්, ජලාශ හා වාරිමාර්ග සංවර්ධන ඇමැති අනුරාධ ජයරත්න මහතා පැවැසීය.

එහිදී අද සමාජයට ගැළපෙන ආකාරයේ සියලු කාරණා එකතු කළ යුතු බවත් වර්තමාන සමාජයට අනුව මේ පනත වෙනස් කළයුත්තේ කෙසේද යන්න පිළිබඳ අවධානය යොමු කළ යුතු බවත් ඒ වෙනුවෙන් සිදුකළ යුතු සියලු කටයුතු සඳහා සහාය ලබාදෙන බවත් ප්‍රකාශ කළේය.

ඒ මහතා මේ බව පැවැසුවේ හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේදී ඊයේ (18) හෙක්ටර් කොබ්බෑකඩුව මහතාගේ 37 වැනි අනුස්මරණ උත්සවයට සහභාගි වෙමිනි.

ගුණසැමරු උත්සවය අගමැති මහින්ද රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි. අගමැති මහින්ද රාජපක්ෂ මහතා හෙක්ටර් කොබ්බෑකඩුව මහතාගේ පිළිරුවට පුෂ්ප උපහාර දැක්වීමෙන් අනතුරුව වෙළෙඳ ඇමැති ආචාර්ය බන්දුල ගුණවර්ධන, වී හා ධාන්‍ය, කාබනික ආහාර, එළවළු, පලතුරු, මිරිස්, ලූනු හා අර්තාපල් වගා ප්‍රවර්ධන, බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණික කෘෂිකර්ම රාජ්‍ය ඇමැති ශෂීන්ද්‍ර රාජපක්ෂ, ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව්, ජලාශ හා වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය ඇමැති අනුරාධ ජයරත්න මහත්වරු පුෂ්පෝපහාර දැක්වූහ.

අනතුරුව හෙක්ටර් කොබ්බෑකඩුව මහතාගේ 37 වැනි අනුස්මරණ උත්සවය හා හෙක්ටර් කොබ්බෑකඩුව මහතාගේ කෘෂිකර්ම හා ඉඩම් ප්‍රතිපත්තිය නව රජයේ “සෞභාග්‍යයේ දැක්ම“ වැඩසටහන සමඟ අනුබද්ධ කරගත හැකි ආකාරය පිළිබඳ සම්මන්ත්‍රණයක් පැවැති අතර එහිදී වැඩිදුරටත් අනුරාධ ජයරත්න මහතා මෙසේද කීය.

## කොරෝනා වසංගතය හමුවේ ලොව ධනවත් රටවල පවා ආහාර අර්බුද ඇති වුණා: අප එයින් ගලවාගත්තේ හෙක්ටර් කොබ්බෑකඩුව ඇති කළ ආහාර ප්‍රතිපත්තියයි

හෙක්ටර් කොබ්බෑකඩුව මහතාගේ දර්ශනය හා චින්තනය අද අපේ සමාජයට විශාල වශයෙන් බලපානවා. එතුමා කෘෂිකර්ම ඇමැතිවරයාව සිටියදී ඉඩම් ප්‍රතිසංස්කරණ පනත ගෙන එමින් මේ රටේ ජනතාවගේ ඉඩම් පිළිබඳ ගැටලුව විසඳීමට කටයුතු කළා. නමුත් අපේ රටේ ජනතාවට රටේ සම්පත් සමඟ නැඟී සිටින්න අවස්ථාව තිබියදී ඒ අවස්ථා නැති කරගන්න කටයුතු කරන බව අපට දකින්න ලැබෙනවා. දේශීය චින්තනය සමඟ ගොඩනැඟී තිබෙන වැඩපිළිවෙළ නැති කරන්න හදන පිරිසක් සිටිනවා. බොහෝ දියුණු රටවල සිදුවූයේ එයයි. ඒවා අපේ රටවලටද ආදේශ කරගෙන අපේ වැඩපිළිවෙළ වරද්දවා ගත් අවස්ථා තිබෙනවා.



රටක් විදිහට අපට ආවේණික වූ දේවල් සැලසුම් කළ යුතුයි. එයට වටිනාකමක් දිය හැකි නායකයෙක් රටට පත් කරගෙන සිටිනවා. එතුමා හෙක්ටර් කොබ්බෑකඩුව මහතාගේ දර්ශනය මෙරට ක්‍රියාත්මක කළ හැකි රාජ්‍ය නායකයෙක්. අතීතයේදී අපේ රටේ මැණික් තිබූ ඉඩම් විදේශීය සමාගමක් විසින් අත්පත් කරගත්තා. ඒ නිසා අපේ සම්පත් අප රැකගන්න කටයුතු කරන්න අවශ්‍යයි.

ජනාධිපති මාධ්‍ය අධ්‍යක්ෂ ජෙනරල් මොහාන් සමරනායක මහතා-

හෙක්ටර් කොබ්බෑකඩුව මහතා වැඩිපුරම පදනම් කරගත්තේ සමාජවාදයයි. එමගින් ජනතාවට ජීවත්විය හැකි සමාජයක් නිර්මාණය කිරීම ගැන කතා කරනවා.සමාජවාදයේ පවා සඳහන් වෙන්නේ මිනිසා සතුටින් ජීවත්වීමට අවශ්‍ය පරිසරයක් තිබෙන්න අවශ්‍යයි යන්නයි. ඒ සඳහා මිනිසාට මූලික අවශ්‍යතා සපුරාලීමට ඇති හැකියාව ඉතාම වැදගත් වෙනවා. බුදුහාමුදුරුවෝ පවා සතුටින් ජීවත්වීමට ඇති පරිසරය පිළිබඳ හා නිර්ණායක දේශනා කර තිබෙනවා. ජීවත්වීමට තිබෙන අයිතිය,නිදහස හා සතුට සොයායෑම කියන අරමුණු පදනම් කරගනිමින් මිනිසුන් ජීවත් වෙනවා. ඒ සඳහා සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් , නිදහස් පාලන ක්‍රමයක් යටතේ ජීවත්වීමේ ක්‍රමයක්, සමාජ ආරක්ෂණ ක්‍රමයක් තිබිය යුතුයි. සාධාරණ සමාජයක් සඳහා ජනතාවක් කියන්නේ ඒ දෙයටයි. නමුත් 2015 දී එක කොටසක් සාධාරණ සමාජයක් ගැන කතා කළා. ඒ අයගේ සතුටු සොයන මාර්ගය වුණේ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමයි. ලෝකයේ තිබුණු ප්‍රධාන ප්‍රශ්නය ලෙස ඔවුන් දැක්කේ විධායක ජනාධිපති ක්‍රමයයි. 2015 සාධාරණ සමාජයක් ඇති කරන්න හදපු පිරිස දැක්කේ නෑ ගොවීන්ට වුවමනා වතුර ප්‍රමාණය, ගොවීන්ට පොහොර දෙන වෙලාව මතක නෑ. අප දන්නා සාධාරණ සමාජයේ මූලික ඉහත කී ජීවත්වීමට ඇති අයිතිය, නිදහස හා සතුට සොයා යෑමේ නිදහසයි.

යටත් විජිතවාදීන් මුලින්ම කළේ අපේ ඉඩම් පැහැරගත්ත එකයි. ඒවගේම අපේ රටේද කුඹුරු ඉඩම් ගොඩකරන්න කටයුතු කරන්න කියා අතීතයේ ප්‍රකාශ වී තිබෙනවා. කොරෝනා කාලය වන විට ඒ ප්‍රතිපත්තියම ක්‍රියාත්මක වුණානම් අද වන විට ලංකාවේ ජනතාව මිය යන්නේ වසංගතයෙන් නොවෙයි කුසගින්නෙන්.

කොබ්බෑකඩුව මහතා ඇති කළ ආහාර ප්‍රතිපත්තිය නිසා කොරෝනා අර්බුදයේදී ආහාර අර්බුදයකින් තොරව ඉදිරියට එන්න පුළුවන් වුණා. කොරෝනා අර්බුදය නිසා ලෝකයේ ධනවත් රටවල්වල පවා ආහාර අර්බුදයක් ඇති වුණා. අප එයින් ගළවා ගත්තේ හෙක්ටර් කොබ්බෑකඩුව මහතායි. ඒ වගේම රටේ හොඳ කෘෂිකාර්මික ප්‍රතිපත්තිය තිබුණු ඩී එස් සේනානායක, බණ්ඩාරනායක මහත්වරුන්ගේ කෘෂිකර්ම ප්‍රතිපත්තිත් මෙයට බලපා තිබෙනවා.

සෞභාග්‍යයේ දැක්ම සමඟ හෙක්ටර් කොබ්බෑකඩුව මහතාගේ ප්‍රතිපත්තිය ඉතා කිට්ටුවෙන් ගැළපෙනවා. බුදුහාමුදුරුවෝ පවා දේශනා කර තිබෙන්නේ සත්වයාගේ ප්‍රධාන පැවැත්මට ආහාර බලපාන බවයි. ලෝක ආහාර සමුළුවේදී පවා සත්වයාගේ පැවැත්වට ආහාරවල වැදගත්කම හා ආහාර සුරක්ෂිතතාවට පිළියම් ඇති කිරීම ලෝක නායකයන්ට බල කර තිබෙනවා. සෞභාග්‍යයේ දැක්මෙන් අපේක්ෂිත කෘෂිකාර්මික අරමුණු හා දේශීය ආර්ථිකයක්, ආහාර සුරක්ෂිතතාව පදනම් කරගෙන තිබෙනවා. සමහර සුළු භෝගවලට පවා රාජ්‍ය ඇමැතිවරුන් පත් කළේ මේ ආහාර නිෂ්පාදනය ඇති කිරීමටයි.

පරිසර ඇමැති මහින්ද අමරවීර, හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ අධ්‍යක්ෂ, ප්‍රධාන විධායක නිලධාරී ජ්‍යෙෂ්ඨ මහාචාර්ය රංජිත් ප්‍රේමලාල් ද සිල්වා මහතා ඇතුළු කාර්ය මණ්ඩලය හා හෙක්ටර් කොබ්බෑකඩුව මහතාගේ පවුලේ ඥාතීහු සහභාගි වූහ.

**ඡායාරූප - ගයාන් පුෂ්පික**

# වසර 2023 වන විට එල්එන්ජී බලාගාර 02ක් ජාතික විදුලි ජනන පද්ධතියට

**චමීර ඇල්ලදෙණිය සහ චන්දිමා කරුණාරත්න**

2023 වනවිට එල්එන්ජී බලාගාර 02ක් ජාතික විදුලි ජනන පද්ධතියට එකතු කිරීමට විදුලිබල අමාත්‍යංශය සැලසුම් කරයි. එල්එන්ජී බලාගාර ස්ථාපිත කිරීම හරහා ජාතික විදුලිබල පද්ධතියට සැලකිය යුතු දායකත්වයක් සැපයීමට බලාපොරොත්තු වන බව පසුගිය ආණ්ඩු සමයේදී විදුලිබල ක්ෂේත්‍රයේ සිදුවූ අදූරදර්ශී ක්‍රියාපිළිවෙළ නිසා ඉදිරියේදී ගැටලු රැසකට මුහුණදීමට සිදුවන බවත් විදුලිබල ඇමැති ඩලස් අලහප්පෙරුම මහතා පැවැසීය.

ඒ මහතා මේ අදහස් පළ කළේ ලංකා විදුලි පෞද්ගලික සමාගමේ නිරීක්ෂණයකට පසුගියදා එක්වෙමිනි.

එහිදී වැඩිදුරටත් ඇමැතිවරයා මෙසේද කීය.

රටක් වශයෙන් අප විදුලි අර්බුදයකට යන්නේ ඇයි? ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ සෞභාග්‍යයේ දැක්මට අනුව වසර 2030 වනවිට හරිත හා පුනර්ජනනීය බලශක්ති දායකත්වය 70% දක්වා වර්ධනය කළයුතු වනවා-සේම, මේ වනවිට 32% ක් වන ඩීසල් විදුලි දායකත්වය 5% දක්වා අවම කළ යුතුයි.

ඒ වෙනුවෙන් ජනන සැලසුම් ක්‍රියාත්මක කිරීමට තිබෙන බාධා ඉවත් කළ යුතුයි. විදුලිය පවුලේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයෙක් විදිහට ලෙකෝ ආයතනය ජනාධිපතිවරයා ප්‍රමුඛ රජයේ අරමුණු කරා ළඟාවීමට ශක්තියක් වේ කියා බලාපොරොත්තු වෙනවා.

මේ වනවිට පුනර්ජනනීය විදුලියෙන් ගන්න දායකත්වය මෙගාවොට් 900ක් පමණයි. 2023 වනවිට මේ තත්ත්වය දෙගුණයකින් වැඩි කරන්න අප බලාපොරෝතතු වෙනවා.

විශේෂයෙන් මෙතෙක් විදුලි පාරිභෝගිකයන්, විදුලි නිෂ්පාදකයන් කිරීමේ සැලසුම් ඉදිරි අයවැය යෝජනා සමඟ ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වෙනවා. ඒ තුළින් ඉදිරියේදි බලශක්තිය තවදුරටත් අර්බුදයක් නොවන තත්ත්වයට පත් කරනවා.

විදුලිය කියන්නේ අත්‍යාවශ්‍ය යටිතල පහසුකමක් වුවත්, විදුලිය සපයන ආයතන ජනතාවට බරක් කියන මතය ජනගත වී තිබෙනවා. නමුත් ලංකා විදුලි පෞද්ගලික සමාගම ඒ ආකාරයෙන් පුරවැසියන්ට කිසිම බරක් පටවන ආයතනයක් හැටියට මම දකින්නේ නැහැ. පාලක පක්ෂය වශයෙන් අප අධිපතිවාදී වියයතු නැහැ. සෑම දේශපාලන මතවාදයකටම ඇහුම්කන් දියයුතුයි. ඒ තුළින් නිවැරදි මතවාද ක්‍රියාවට නැංවීමට කටයුතු කළයුතුයි. ඒ න්‍යාය අනුව යමින් ජනාධිපතිවරයා පසුගියදා විදුලියට සම්බන්ධ රාජ්‍ය මෙන්ම පෞද්ගලික සෑම ආයතනයක්ම එකට රැස්කර විදුලියේ ඉදිරිය ගැන සාකච්ඡා කළා. මෙවැනි දෙයක් සිදුවුණේ ඉතිහාසයේ පළමු වතාවටයි.

දූරදර්ශී නායකත්වයෙන් යුත් වර්තමාන ආණ්ඩුවට එයට පිළියම් වශයෙන් දියහැකි සාක්ෂියයි. අප බලයට ආවේ ඉතිහාසයේ සිදුවූ අඩුපාඩු හොයලා ඉතිහාසයට ඇඟිලි දික්කරන්න නොවෙයි. අපෙන් වියයුතු යුතුකම් ඉටු කරනවද කියන කාරණය අප තීන්දු කළ යුතුයි.

# මිල කොච්චර ඉහළ ගියත් රටින් පොල් ගේන්නේ නෑ

## රාජ්‍ය ඇමැති අරුන්දික ප්‍රනාන්දු



**ප්‍රසාද් පූර්ණමාල් පුත්තලම දිසා සමූහ**

ශ්‍රී ලංකාවේ මේ වන විට පොල්මිල ඉහළ ගොස් ඇත්තේ ලෝක වෙළෙඳ පොළේ පොල් ආශ්‍රිත නිෂ්පාදන වලට ඇති ඉල්ලුම ඉහළ යාම නිසා බව පොල්, තල්, කිතුල් රාජ්‍ය ඇමැති අරුන්දික ප්‍රනාන්දු මහතා පැවසීය. අරුන්දික ප්‍රනාන්දු ඇමැතිවරයා මේ බව කියා සිටියේ දංකොටුවේ පිහිටි සිය වත්තේ පොල් ගසකට නැගී අතරතුරදීයි.පොල් ගසේ ගෙඩි කීපයක් කඩා දැමූ ඇමැතිවරයා අද වන විට පොල් ගෙඩියක මිල රුපියල් සියය දක්වා ඉහළ ගොස් ඇති අතර පොල් ගහකට නැග පොල් කඩන කම්කරුවකුටද රුපියල් සියයක් ලබාදිය යුතු බව පැවසීය.මෙහිදී ඇමැතිවරයා කියා සිටියේ පොල් කැඩීමට කම්කරුවන් සොයා ගැනීමේ අපහසුවක්ද මේ වන විට ඇති වී ඇති බවයි.

ඇමැතිවරයා මෙහිදී කියා සිටියේ පොල් මිල කෙතරම් ඉහළ ගියත් පොල් රටින් ගෙන්වීමට කටයුතු නොකරන බවයි. නගර බද ජීවත් වන ජනතාවට පොල් සහන මිලට ලබා දීමට ඉදිරි දින කීපයේ වැඩ පිළිවෙළක් සකස් කරන බවද මෙහිදී ඇමතිවරයා පැවසිය . ඇමැතිවරයා සිය ගෙවත්තේ පොල් ගසට නැග තිබුණේ වරකාපොළ ප්‍රදේශයේ පුද්ගලයකු විසින් නිෂ්පාදනය කළ යන්ත්‍රයක ආධාරයෙන් වන අතර මෙය ඉදිරියේදී රටට හඳුන්වා දීමට ක්‍රියා කරන බවද රාජ්‍ය ඇමැතිවරයා පැවසීය. මේ යන්ත්‍රය ආධාරයෙන් ඉතා වේගයෙන් පොල් ගසකට නැග ගත හැකි අතර මේ යන්ත්‍රය තල් හා කිතුල් ගස්වලට නැඟීමට ද යොදාගත හැකිය.

# විස්සෙ වගකීම බාරගන්නේ ජනපති සහ කැබිනට්ටුවයි

## වරාය හා නාවික ඇමැති රෝහිත අබේගුණවර්ධන

**සමන්මලී ප්‍රියශාන්ති**

විසිවැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ නිර්මාතෘ රටේ රාජ්‍ය නායකයා බවත් එහි වගකීම ජනාධිපතිවරයා සහ කැබිනට් මණ්ඩලය විසින් ගනු ලබන බවත් වරාය හා නාවික ඇමැති රෝහිත අබේගුණවර්ධන මහතා පෙරේදා (17) ප්‍රකාශ කළේය.

අධිකරණ ඇමැතිවරයාගේ ප්‍රකාශයක කොටසක් හුවා දක්වමින් විපක්ෂය 20 ගැන විකෘති මත පළ කරමින් සිටින බව ද හෙතෙම පැවැසීය.

බත්තරමුල්ල, නෙළුම් මාවතේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණු කාර්යාලයේදී පැවැති මාධ්‍ය හමුවට එක් වෙමින් අබේගුණවර්ධන මහතා මේ බව පැවැසීය.

නව ගමන් මාර්ගයකට රට ගෙන යෑමට රටේ රාජ්‍ය නායකයා කටයුතු කළ යුතු බවත් ගෝඨාභය රාජපක්ෂ මහතා එම නව විප්ලවීය වෙනස ඉටු කරමින් සිටින නායකයකු බව අද ඔප්පු වී තිබෙන බවත් කී ඒ මහතා, 20න් පසු රට හදන්න පුළුවන් නව ව්‍යවස්ථාවක් ගෙන ඒම රජයේ අරමුණ බවත් කීය.

එහිදී ඒ මහතා මෙසේ ද ප්‍රකාශ කළේය.

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා කෙරෙහි වගේම පොදුජන පෙරමුණු රජය කෙරෙහි මේ රටේ ජනතාව තැබූ විශ්වාසය නිසා තමයි අපට පසුගිය මැතිවරණය තුනෙන් දෙකක බහුතර බලයක් සහිතව ජයග්‍රහණය කරන්න අවස්ථාව ලැබුණේ. 19 වැනි ව්‍යවස්ථා සංශෝධනයේ අහිතකර තත්ත්වය අප මැතිවරණයේදී ජනතාවට කිව්වා. රනිල් වික්‍රමසිංහ සහ ඔහුගේ ගෝලයෝ 19 ගෙනාවේ රාජපක්ෂවරු දිහා වෛරයෙන් බලමින් මිස වෙනත් අවශ්‍යතාවක් මත නොවේ. ලෝකයේ දේශපාලන ව්‍යුහය තුළ පවුලක් ඉලක්ක කරගෙන මෙවැනි සංශෝධනයක් ගෙනාව වෙන අවස්ථාවක් අප මින් පෙර දැක නැහැ.

ව්‍යවස්ථාදායක සභාවට පත් කරන්න ඕනෑ විපක්ෂයේ එකඟතාව අනුව කියලා. මේ අය 19ට ඇතුළු කර ගත්තා. එදා විපක්ෂය වුණේ දෙමළ සන්ධානයයි. විපක්ෂ නායක වුණු සම්බන්ධන් හා දෙමළ සන්ධානයත් මේ රජයටම සහාය දුන්නා. ඒ නිසා එදා තිබුණේ ආණ්ඩුවම පත් කරගත් විපක්ෂයක් පමණයි. විපක්ෂ නායකවරයාවත් ඇතුළේ තියාගෙන තමයි මේ අය 19 හැදුවේ. මේ නිසාම මේ 19 රටට අහිතකර දෙයක් බව පේනවා. මේ නිසා අපේ රජය වැඩ කරගෙන යද්දි මේ 19 බාධක අපට ගැටලු මතු කරනවා. ඒ නිසා අප ඒවා ඉවත් කරන්න අවශ්‍යයි. ජනතාව අපට බලය දීලා තිබෙන්නේ යහපාලන ආණ්ඩුව කරපු දේවල් කරන්න නොවෙයි. පාතාලය තුරන් කරන්න, මත්කුඩු ජාවාරම් නැති කරන්න, රට සංවර්ධනය කරන්න අපට අවශ්‍යයි. මේ 19 න් රජයේ වගේම ජනාධිපතිවරයාගේත් අත් බැදලා තිබෙන්නේ. අද 19 නිසාම රනිල් වික්‍රමසිංහ පාර්ලිමේන්තුවෙත් නැහැ. නමුත් මේක හදන්න කටයුතු කළ සිවිල් මහත්වරු පාර්ලිමේන්තුවට ඇවිත් ඉන්නවා. මේක ගේන්න කටයුතු කළ මංගල, රනිල් අද හොයාගන්න නැහැ. තිර රචකයෝ හොයා ගන්න නැහැ. අප ගත්තු තීන්දු තීරණ ආපසු ගන්න රජයක් නොවන බව අප වගකීමෙන් කියන්න කැමැතියි. ජනතාවාදී තීන්දුවක් අප අරගෙන තිබෙනවා. 20 ගෙනාවට පස්සේ අප මේ රට හදන්න පුළුවන් නව ව්‍යවස්ථා සංශෝධනයක් අරගෙන එනවා. විපක්ෂයට අප අභියෝග කරනවා බොරුවට කෑ ගහන්නේ නැතිව තමන්ගේ බලය පෙන්නන්න කියලා.



> 20න් පසු රට හදන නව ව්‍යවස්ථාවක් ගේනවා

ජනාධිපති ජනතාවට ආදර්ශ ගණනාවක් දීලා තිබෙනවා. එතුමා දක්ෂ වැඩ කරන නායකයෙක්. දවස ගානේ අමාත්‍යාංශ නිලධාරීන් ගෙන්වලා ප්‍රගතිය බලනවා. ජනාධිපතිට ඉන්නේ එකම එක පෞද්ගලික ලේකම්වරයෙක් විතරයි. අපේ ජනාධිපති ගෙනයන දේශපාලන සංස්කෘතිය ව්‍යවස්ථාවේ තිබුණේ නැහැ. රටේ නායකයා දැන ගන්න ඕනෑ නව ගමන් මාර්ගයකට රට ගෙනයන්න. ගෝඨාභය රාජපක්ෂ ජනාධිපති ඒ නව විප්ලවීය වෙනස ඉටු කරන නායකයෙක් බව අද ඔප්පු වෙලා ඉවරයි. ඒ නිසා එතුමාට මේ ගමන යන්න මේ ව්‍යවස්ථා සංශෝධනයෙන් අවස්ථාව ලබාදිය යුතුයි. 20 වැනි සංශෝධනයෙන් කොමිසන් සභා හෝ තොරතුරු දැන ගැනීමේ පනත හෝ ඉවත් කර නැහැ. 19 තිබෙන අනිසි බලයෙන් අපට වැඩ කරන්න අමාරුයි. 19 හොරු අල්ලනවා කිව්වට හොරු වැඩ කරපු එකයි කළේ. 19 ගෙනත් හොරකම් කළ අයත් ඉන්නවා.

මේ 20 ගෙනාවේ, එහි නිර්මාතෘ රටේ රාජ්‍ය නායකයායි. කැබිනට් මණ්ඩලය ලෙස අප එය සාකච්ඡා කර අනුමත කළා. කෙටුම්පත් දෙපාර්තමේන්තුව කෙටුම්පත් කළා. මෙහි වගකීම ජනාධිපතිවරයා සහ කැබිනට් මණ්ඩලය ගන්නවා. මේ ගැන අධිකරණ ඇමැතිවරයාගේ කතාවේ කොටසක් පමණක් අරගෙන විපක්ෂය කරුණු විකෘති කරමින් ඉන්නවා.

පාර්ලිමේන්තුව නියෝජනය කරන්න නොයෙකුත් පක්ෂවලින් නියෝජිතයන් පත් වෙලා එනවා. ඒ අය 19 ගෙනා ආණ්ඩුව ගැනත් 19 ගැනත් ගැනත් හොඳට දන්නවා. රට හදන්න කැමැති ඕනෑම අයකුට පුළුවන් 19ට විරුද්ධ වෙලා 20ට සහාය දෙන්න. ඊට විරුද්ධ වෙන්නත් අයිතිය තිබෙනවා. ඒක ප්‍රජාතන්ත්‍රවාදී අයිතියක් වගේම පාර්ලිමේන්තුවේ තිබෙන ස්වාධීන අයිතියක්.

රනිල් මහත්තයයි ගෝලයෝ ටිකයි හොරු ඇල්ලුවේ නැති වුණාට දේශපාලන දඩයම් කළා. අපේ හැම අයෙකුටම නඩු දැම්මා. මේවා දේශපාලන දඩයම් පමණයි. සමහරු නඩුවලින් නිදොස් කොට නිදහස් කළා. මේවා කළේ රනිල්ගේ ආශිර්වාදය ඇතුවයි. 19 ගෙනත් විපක්ෂයේ කෑගහන අය හිරේ දාලා රට විකුණන්න උත්සාහ කළා. ඒකට ඉඩ තියන්නේ නැති බව රටේ ජනතාව පසුගිය පාර්ලිමේන්තු මැතිවරණයෙන් ඔප්පු කළා.

20න් පස්සේ ව්‍යවස්ථා සංශෝධනයක් එන්නේ, රටට ගැළපෙන, ජනතාවගේ අදහස්වලට ඇහුම්කන් දීලා, සියලු ජාතීන්ට නිදහසේ ජීවත් වෙන්න අයිතිය ඇතිවයි.රට ගොඩනගන්න පුළුවන් ව්‍යවස්ථාවක් ගෙන එන්න බලාපොරොත්තු වෙනවායැයි කීය.

මේ මාධ්‍ය හමුවේදී පාර්ලිමේන්තු මන්ත්‍රී ජගත් කුමාර මහතා ද අදහස් දැක්වීය.

# 20න් එක් තනතුරක් වටා බලය කේන්ද්‍රගත වෙනවා

## පාර්ලිමේන්තු මන්ත්‍රී රාජිත සේනාරත්න

**බුද්ධි කරුණාරත්න**



දහනව වැනි ව්‍යවස්ථා සංශෝධනයෙන් රටේ ප්‍රජාතන්ත්‍රවාදී ආයතන ශක්තිමත් කිරීමට පියවර ගත් බවත් 20 වැනි ව්‍යවස්ථා සංශෝධනයෙන් එක් තනතුරක් වටා බලය කේන්ද්‍රගත වන බවත් සමගි ජනබලවේගයේ පාර්ලිමේන්තු මන්ත්‍රී රාජිත සේනාරත්න මහතා පැවැසීය.

ඒ මහතා මේ බව ප්‍රකාශ කළේ 20 වැනි ව්‍යවස්ථා සංශෝධනය ගැන කොළඹ විපක්ෂ නායක කාර්යාලයේ පැවැති මාධ්‍ය සංවාදයකට සහභාගි වෙමිනි.

එහිදී වැඩිදුරටත් ඒ මහතා මෙසේද කීය.17 වැනි ව්‍යවස්ථා සංශෝධනයේ 18 වැනි ආණ්ඩුක්‍රම සංශෝධනයෙන් වෙනස් කළ බවත්, එහිදී එක් පුද්ගලයකු වටා බලය කේන්ද්‍රගත වීම 19 වැනි සංශෝධනයෙන් විවිධ ආයතනවලට පැවරූ බවත් 19 වැනි ව්‍යවස්ථා සංශෝධනයේ ඇති අඩුලුහුඬුකම් සකස් කර එය භාවිතයට ගත හැකිව ඇතැයි ද වැඩිදුරටත් පැවැසීය.

19 වැනි ව්‍යවස්ථාවෙන් විධායක ජනාධිපති සතුව පැවැති බලතල රැසක් කැබිනට් මණ්ඩලයට පැවරීමට පියවර ගත් බව ද කී ඒ මහතා මෙහි ඇති මූලික වැදගත්කම වන්නේ ආණ්ඩුව ගන්නා තීරණ ගැන වගකියන අගමැතිවරයෙක් පාර්ලිමේන්තුවේ සිටීම යැයි ද වැඩිදුරටත් කීය. 19 වැනි ව්‍යවස්ථාව ඇති කිරීමෙන් අනතුරුව විදේශ රටවල් අප රටට මිනිස් අයිතිවාසිකම් සුරකින ශිෂ්ට සම්පන්න රටක් ලෙස සැලකීමට පටන් ගත්තේ යැයි ද ඔහු වැඩිදුරටත් කීය. කෙසේ වෙතත් 19 ව්‍යවස්ථාවේ ඇත්තේ තාක්ෂණික අඩුපාඩු කිහිපයක් බවද එය නිවැරැදි කළයුතු යැයි තමන්ද පවසන බව ඔහු වැඩිදුරටත් කීය. 20 වැනි ව්‍යවස්ථා සංශෝධනයෙන් සිදුවන්නේ ජනතාවට පැවැරූ බලය ආපසු ලබා ගැනීමක් යැයි ද ඔහු මේ අවස්ථාවේ වැඩිදුරටත් කීවේය.

නීතිඥ සුරේන් ප්‍රනාන්දු මහතා -

ජනතාවට ඍජුව තීරණගත නොහැකි නිසා රටේ පරමාධිපත්‍ය බලය නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය හරහා අප ක්‍රියාත්මක කරනවා. මෙහිදී වැදගත් වන කාරණය තමයි ජනතාවගේ බලය ඔවුන් වෙනුවෙන් කවුරු කෙසේ භාවිත කළ යුතුද යන්න. ඉතිහාසයේ තිබෙන අත්දැකීම් අනුව බලය අනිසි ලෙස යොදාගත් අවස්ථා බහුලයි. මේ නිසා සියලුම බලතල එක් අයකුට නොපවරවා බලය ලබාදීම සුපරීක්ෂණයට යාන්ත්‍රණයක් පැවැතිය යුතුයි.

### ඉස්සර මිනිස්සු නීතියට බයයි: දැන් රාජ්‍ය සේවය වංචාවේ දූෂණයේ තෝතැන්නක්:

සමගි ජන බලවේගයේ
මහ ලේකම් රංජිත් මද්දුම බණ්ඩාර

**සමගි ජන බලවේගයේ මහ ලේකම් රංජිත් මද්දුම බණ්ඩාර මහතා-**

රට වැරැදි මාර්ගයේ ගමන් කරනවා නම් එය නිවැරැදි මාර්ගයට ගැනීම මාධ්‍යවේදීන්ගේ යුතුකමයි. මැලේසියාවේ පරිපාලන සේවය ස්ථාපිත කළේ එවකට අප රටේ පැවැති පරිපාලන ක්‍රමවේදය උදාහරණයකට අරගෙනයි. ඉස්සර මිනිස්සු නීතියට බියක් දැක්වූවා, ඒත් දැන් රාජ්‍ය සේවය වංචාවේ දූෂණයේ තෝතැන්නක්. මේ රට අගාධයට ගියේ 18 වැනි ව්‍යවස්ථා සංශෝධනයෙන් අනතුරුවයි. රටේ වැඩිම සොරකම් සිදු වුණේ ඉන් පසුවයැයි කීය.

මේ මාධ්‍ය සාකච්ඡාවට විපක්ෂ නායකයාගේ පෞද්ගලික ලේකම් රවී ජයවර්ධන මහතා ද සහභාගි විය.



# ආණ්ඩු පක්ෂයේ අය අද රූකඩ බවට පත් වෙලා

## ජවිපෙ ප්‍රචාරක ලේකම්, පාර්ලිමේන්තු මන්ත්‍රී විජිත හේරත්

**නදී මාණික්කගේ**

ආණ්ඩු පක්ෂයේ ඇමැතිවරුන් හා මන්ත්‍රීවරුන් අද වනවිට රූකඩ බවට පත්ව ඇති බවත් හෙට රටේ ඉරණම අද කැබිනට් මණ්ඩලයට සිදුව ඇති දෙයින් පැහැදිලි වන බවත් ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රචාරක ලේකම් පාර්ලිමේන්තු මන්ත්‍රී විජිත හේරත් මහතා පෙරේදා (17) ජනතා විමුක්ති පෙරමුණේ පක්ෂ මූලස්ථානයේ පැවති මාධ්‍ය හමුවේදී පැවසීය.

ඒ මහතා එහිදී වැඩිදුරටත් මෙසේද කීය.

"බළලාගේ ගෙජ්ජිය බැඳීමට කිසිම මීයෙක් ඉදිරිපත් වුණේ නෑ වගේ ඇමැති මණ්ඩලය අද අසරණ වී සිටිනවා. හෙට රටට ඇතිවන තත්ත්වය අද කැබිනට් මණ්ඩලය පත් වී ඇති ඉරණමින් පැහැදිලියි. ආණ්ඩු පක්ෂයේ අය අද රූකඩ වෙලා ඉවරයි. අද ආණ්ඩු පක්ෂය ඩෝසර් කරගෙන යනවා. ඊළඟට විපක්ෂයත් ඊළඟට ජනතාවත් ඩොසර් කරගෙන යා හැකියි.

වසරකින් පාර්ලිමේන්තුව විසුරුවා හැරීමේ බලය නැවත ජනාධිපතිවරයාට ලබාගෙන තිබෙනවා. මේ අනුව අමාත්‍යවරුන්, මන්ත්‍රීවරුන් රූකඩයක් බවට පත්කර ගැනීමට ජනාධිපතිවරයාට හැකියි. තමන්ට බාධාකාරී වන ඕනෑම අවස්ථාවක පාර්ලිමේන්තුව විසුරුවා හැරීමේ තර්ජනය කිරීමට ජනපතිට හැකියාව තිබෙනවා. දැන් ආණ්ඩුවට 2/3ක බලයක් තිබෙන නිසා අවශ්‍ය ඕනෑම මොහොතක පනතක් සම්මත කර තමන්ටම පාර්ලිමේන්තුව විසුරුවා ගත හැකියි. නමුත් මේ විසුරුවා හැරීමේ බලය ජනපතිවරයා අතට පත්කිරීම අතිශය භයානක තත්ත්වයක්. මේ ආදී වශයෙන් තවත් කරුණු ගණනාවක් 20 සම්බන්ධයෙන් ඉදිරිපත් කළ හැකියි.

ඒකාධිපති ස්වරූපයේ ජනාධිපති ධුරයේ බලතල සීමා කිරීම වෙනුවෙන් එදා අප ජනතා විමුක්ති පෙරමුණ ලෙස චන්ද්‍රිකා ජනපතිනියගේ කාලයේ පරිවාස වැඩපිළිවෙළ තුළ 17වැනි ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ඉදිරිපත් කළා. එමගින් විධායක බලතල යම් ප්‍රමාණයක් කප්පාදු කළා. අපේ රටේ පළමු වතාවට ජනපතිගේ බලතල කප්පාදු කරමින් ස්වාධීන කොමිෂන් සභා ස්ථාපිත වුණේ මේ සමගයි. මැතිවරණ, පොලිස්, රාජ්‍ය සේවා, අධිකරණ සේවා ආදී ස්වාධීන කොමිෂන් සභා මේ අනුව පිහිටවනු ලැබුවා.

නමුත් 18 වැනි ව්‍යවස්ථා සංශෝධනය අනුව 17 අහෝසි කර නැවතත් ඒකාධිපති ජනාධිපති ක්‍රමය ශක්තිමත් කළා. නැවතත් 19 වැනි සංශෝධනය මගින් ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් වුණා. 19 තුළ අඩුපාඩුකම් තිබුණත් එය ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීමේ දිශාවට සිදුවූවා. දැන් නැවතත් ආණ්ඩුවේ 20වැනි සංශෝධනය මගින් ජේ.ආර්.ගේ වුවමනාව හා සමානව කොල්ලකාරී ආර්ථික වැඩපිළිවෙළක් වෙනුවෙන් විධායක ජනාධිපති ක්‍රමය ශක්තිමත් කර ගැනීමට හදනවා. රටේ සමස්ත ණය බර කෝටි ලක්ෂ 14යි. ඒ කියන්නේ ට්‍රිලියන 14යි. වසරකට කෝටි ලක්ෂ දෙකක් ණය හා පොලී වාරික ගෙවීමට සිදුවී තිබෙනවා. රජයේ ආදායමට වඩා ණය හා පොලී ගෙවීමට සිදුව තිබෙනවා. මේ තත්ත්වය තුළ වත්මන් ජනපතිට එදා ජේ.ආර්.ටත් එහා යන, ප්‍රජාතන්ත්‍රවාදය හකුළන ඒකාධිපති ජනාධිපති ධුරයක් නිර්මාණය කර ගැනීමට අවශ්‍ය වී තිබෙනවා. ඒ කොල්ලකාරී ආර්ථික වැඩපිළිවෙළ ඉදිරියට ගෙනයෑම වෙනුවෙනුයි.

20වැනි සංශෝධනයේ ඇති යෝජනා අතිශය ගැටලුකාරියි. ඒවායින් කිහිපයක් අපට මෙසේ හඳුනාගත හැකියි. වර්තමාන සමාජයේ නීතිය කාටත් සමාන බව මූලික සංකල්පයක් ලෙස පිළිගන්නවා. ඒ අනුව ජනපතිවරයාට නීතිය හමුවේ මුක්තිය ලැබීම ගැටලුවක්. 19වැනි සංශෝධනය යටතේ මූලික අයිතිවාසිකම් කඩවීමකදී ජනාධිපතිවරයාට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ නඩු පැවරිය හැකි පරිදි ව්‍යවස්ථාව සංශෝධනය කර තිබුණා. ඔහුට මුක්තිය ලැබුණේ සිවිල් සහ අපරාධ චෝදනාවලදී පමණයි.

19 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේදී අගවිනිසුරු, නීතිපති, විගණකාධිපති ඇතුළු රටේ ප්‍රධාන තනතුරු පත් කිරීමේ බලය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට පවරා තිබුණා. නමුත් දැන් 20 වැනි සංශෝධනය මගින් යෝජනා කර ඇති පාර්ලිමේන්තු සභාවේ සිටින්නේ අගමැතිවරයා, කථානායකවරයා, අගමැතිවරයාගේ නියෝජිත මන්ත්‍රීවරයා, විපක්ෂ නායකවරයා සහ විපක්ෂ නායකවරයාගේ නියෝජිත මන්ත්‍රීවරයායි. මේ පස් දෙනාගෙන් තිදෙනෙක්ම ආණ්ඩුව නියෝජනය කරනවා. ඒ වගේම මේ පාර්ලිමේන්තු සභාව කිසිදු බලයක් නැති එකක්. ඔවුන්ට කළ හැක්කේ ජනාධිපතිවරයා විසින් යෝජනා කරන නම්වලට අදාළව නිරීක්ෂණ ලබාදීමට පමණයි. එම නිරීක්ෂණ පවා ජනාධිපතිවරයාට නොසලකා හැරිය හැකියි.

20වැනි සංශෝධනය අනුව කොමිෂන් සභා ඉතිරි වුවද ඒවා තවදුරටත් ස්වාධීන කොමිෂන් සභා වන්නේ නැහැ. ස්වාධීන මැතිවරණ කොමිෂන් සභාව නිසා ලංකාවේ මැතිවරණවල සාම්ප්‍රදායිකව පැවති ප්‍රචණ්ඩ ක්‍රියා, රාජ්‍ය දේපළ අවභාවිතාව වැනි දේ විශාල ලෙස අවම වුණා. එහෙත් තවදුරටත් එසේ වීමේ ඉඩක් නැහැ. ඒ වගේම ස්වාධීන විගණන කොමිෂන් සභාව සම්පූර්ණයෙන් අහෝසි කර තිබෙනවා. ඒ වගේම විගණකාධිපතිවරයා පත්කිරීම ජනාධිපතිවරයා යටතට පත් කර ගැනීමට අමතරව ඔහුගේ විෂය පථය පවා සීමාකර තිබෙනවා. ජනාධිපති කාර්යාලය, අගමැති කාර්යාලය රටේ ජනතාවගේ මුදල් විශාල ලෙස වියදම් කරන ආයතනයි. මේවා වියදම් කරන්නේ මහජනතාවගේ මුදලුයි. නමුත් 20වැනි සංශෝධනය මගින් එම ආයතන විගණනය කිරීම විගණකාධිපතිවරයාගෙන් ඉවත් කර තිබෙනවා.

20වැනි සංශෝධනයේ ආණ්ඩුව හදිසි පනත් ගෙන ඒමේ හැකියාව ලබාගෙන තිබෙනවා. ඒ අනුව බරපතළ වැරැදි තත්ත්වයක් රටේ උද්ගත වෙනවා. ජනතාවට හොර රහසේ පනත් ගෙන ඒම මගින් ඒවා අධිකරණය හමුවේ ප්‍රශ්න කිරීමේ අවස්ථාව ජනතාවට අහිමි වෙනවා. 19වැනි සංශෝධනය මගින් මෙවැනි පනත් ගෙනඒම නතර කළා. 20වැනි සංශෝධනය මගින් ආණ්ඩුව මේ අවස්ථාව නැවත ලබාගෙන තිබෙනවා. පනතක් ගැසට් කර ලබා දිය යුතු දින 14ක කාලය දින 7ක් දක්වා අඩු කර තිබෙනවා.

**ඡායාරූපය - රොෂාන් පිටිපන**

# කැබිනට් තීරණ

### අම්ෆන් සුළි කුණාටුවෙන් ආපදාවට ලක් වූ පවුල්වලට සහන සැලසීම

අම්ෆන් සුළි කුණාටුවෙන් යාපනය දිස්ත්‍රික්කයේ කෝපායි, තෙල්ලිපලෙයි සහ කරවෙට්ටි යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ගොවීන් 2,374 දෙනකුගේ කෙසෙල් හා ගස්ලබු වගාවලට දැඩි හානි පැමිණ තිබූ අතර, එහිදී සිදු වී ඇති මුළු අලාභය රුපියල් මිලියන 52.98 ක් වශයෙන් යාපනය දිස්ත්‍රික් ලේකම්/දිසාපති වාර්තා කර ඇත. මේ ගොවීන්ට සහන සැලසීම සම්බන්ධයෙන් ධීවර ඇමැති ඩග්ලස් දේවානන්දා මහතා ඉදිරිපත් කළ යෝජනාව පරිදි කෘෂිකර්ම අමාත්‍යාංශයේ, ආපදා කළමනාකරණ විෂය භාර අමාත්‍යාංශයේ සහ යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සම්බන්ධීකරණයෙන් යුතු වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීමටත්, ඒ සඳහා අවශ්‍ය රුපියල් මිලියන 52.98ක මුදල ආපදා කළමනාකරණ විෂය භාර අමාත්‍යාංශය හරහා අතිරේක ප්‍රතිපාදනයක් වශයෙන් යාපනය දිස්ත්‍රික් ලේකම්/දිසාපති වෙත ලබාදීමටත් ඇමැති මණ්ඩලය තීරණය කර ඇත.

### ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ ගැසට් නිවේදන පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම

1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ ගැසට් නිවේදන 04ක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට වෙළෙඳ ඇමැති බන්දුල ගුණවර්ධන මහතා ඉදිරිපත් කළ යෝජනාවට ඇමැති මණ්ඩල අනුමැතිය ලැබී තිබේ.

සෞඛ්‍ය අමාත්‍යාංශයේ, ත්‍රිවිධ හමුදාවේ සහ කොවිඩ් මධ්‍යස්ථානයේ ඉල්ලීම් මත කොවිඩ් - 19 වසංගත තත්ත්වය වැළැක්වීම සඳහා අවශ්‍ය ඖෂධ, රසායනික ද්‍රව්‍ය, සෞඛ්‍ය ආරක්ෂණ උපකරණ, යන්ත්‍රෝපකරණ ආදී නිෂ්පාදන ආනයනය කිරීමේදී හෝ ආනයනය කර සැපයීමේදී හෝ ආනයනය කර පරිත්‍යාග කිරීමේදී හෝ සෙස් බදු ගෙවීමෙන් නිදහස් කිරීම, පෝට්ලන්ඩ් සිමෙන්ති ආනයනයේදී අදාළ වන සෙස් බද්ද අනුපාතික පදනම මත අය කිරීම වෙනුවට ඒකක පදනමින් අය කිරීම, සිමෙන්ති කැට ආනයනය කිරීමේදී සෙස් බදු ඉවත් කිරීම සහ පාවහන් නිෂ්පාදනය සඳහා අවශ්‍ය ඇතැම් කොටස්, සූත්‍රිකා බල්බ සහ නම්‍යශීලී ඇසුරුම් ද්‍රව්‍ය ආනයනය කිරීමේදී සෙස් බදු පැනවීම වෙනුවෙන් නිකුත් කළ ගැසට් නිවේදන මෙසේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කෙරේ.

### වැලිගම පොල් කොළ මැලවීමේ හා කුණුවීමේ රෝග මර්දන වැඩසටහන

"වැලිගම පොල් කොළ මැලවීමේ හා කුණුවීමේ රෝගය" මාතර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 12ක, හම්බන්තොට දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 02ක හා ගාල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 02ක ව්‍යාප්තව පවතී.

2008 වර්ෂයේදී ආරම්භ කර ක්‍රියාත්මක කරගෙන යන ලද රෝග කළමනාකරණ වැඩසටහන මගින් මේ වන විට රෝගී කලාපයෙන් පිටතට රෝගය පැතිරීම සම්පූර්ණයෙන් පාලනය කර ඇති අතර, රෝගී කලාපයේ රෝගය සාර්ථකව කළමනාකරණය කරමින් පවතී. ඒ අනුව, එකී වැඩසටහන තවදුරටත් 2021-2023 කාලසීමාව ඇතුළත ක්‍රියාත්මක කිරීම පිණිස වැවිලි ඇමැති වෛද්‍ය රමේෂ් පතිරණ මහතා ඉදිරිපත් කළ යෝජනාවට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබේ.

### සාක්ෂි ආඥාපනත සංශෝධනය කිරීම

සාක්ෂි ආඥාපනත සංශෝධන පනත් කෙටුම්පත ගැසට් පත්‍රයේ පළකර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා අධිකරණ ඇමැති අලි සබ්‍රි මහතා ඉදිරිපත් කළ යෝජනාවට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබේ. සාක්ෂි ආඥා පනතේ ඇතැම් වචන සහ යෙදුම් වර්තමානයේ භාවිත නොවන බැවින් ඒ වෙනුවට අලුත් වචන හා යෙදුම් යොදා එම ආඥාපනත සංශෝධනය කිරීම සඳහා 2016 ජූලි මස 05 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, නීති කෙටුම්පත් සම්පාදක සකස් කරන ලද පනත් කෙටුම්පතට නීතිපතිවරයාගේ නිෂ්කාශනය ලැබී තිබේ.

### සබරගමුව විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය ආරම්භ කිරීමට පැරා සායනික ගොඩනැගිල්ල ඉදිකිරීමේ කොන්ත්‍රාත්තු ප්‍රදානය කිරීම

ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශය පරිදි, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය සඳහා පැරා-සායනික ගොඩනැගිල්ල ඉදි කිරීමේ කොන්ත්‍රාත්තුව රුපියල් මිලියන 1,013.87 සහ ඊට අදාළ එකතු කිරීමේ අගය මත වූ බද්ද (VAT) සහිත මුදලකට මාගා ඉංජිනියරින් පෞද්ගලික සමාගම වෙත පිරිනැමීම සඳහා අධ්‍යාපන ඇමැති මහාචාර්ය ජී.එල්. පීරිස් මහතා ඉදිරිපත් කළ යෝජනාවට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබේ.

### රසායනික පොහොර ප්‍රසම්පාදනය කිරීම 2020 මහ කන්නය - ඔක්තෝබර් මාසය

2020 මහ කන්නයේ ඔක්තෝබර් මාසය අවසානයේදී අවශ්‍ය වන රසායනික පොහොර ප්‍රසම්පාදනය කිරීම සඳහා අන්තර්ජාතික විවෘත තරගකාරී මිල ගණන් කැඳවා ඇත. ඒ අනුව, යූරියා (ග්‍රැනියුලර්) මෙට්‍රික් ටොන් 60,000ක් අමාත්‍ය මණ්ඩලය පත් කළ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශය පරිදි, දින 180ක ණය කාලසීමාවක් යටතේ මෙට්‍රික්ටොන් එකක් අමෙරිකානු ඩොලර් 298.34 බැගින් ඇග්‍රිෆර්ට් ලයිවන් ඉන්ටර්නැෂනල් ලිමිටඩ් වෙතින් මිලදී ගැනීම සඳහා කෘෂිකර්ම ඇමැති මහින්දානන්ද අලුත්ගමගේ මහතා ඉදිරිපත් කළ යෝජනාවට කැබිනට් අනුමැතිය ලැබී තිබේ.

### මාස අටක කාලයකට මර්බන් බොර තෙල් ආනයනය කිරීමේ දිගුකාලීන කොන්ත්‍රාත්තුව

අමාත්‍ය මණ්ඩලය විසින් පත් කළ විශේෂ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශය පරිදි, මේ වසරේ ඔක්තෝබර් 01 සිට 2021 වසරේ මැයි 31 දක්වා මාස අටක කාලයක් සඳහා මර්බන් බොර තෙල් බැරල් 8,400,000+/-5%ක් මිල දී ගැනීමේ දිගුකාලීන කොන්ත්‍රාත්තුව සිංගප්පූරුවේ M/s Emirates National Oil Company (ENOC) වෙත ප්‍රදානය කිරීමට බලශක්ති ඇමැති උදය ගම්මන්පිල මහතා ඉදිරිපත් කළ යෝජනාවට ඇමැති මණ්ඩල අනුමැතිය ලැබී ඇත.

### එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ 45 වැනි සැසිවාරයේදී ගත් පියවර

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ 45 වැනි සැසිවාරය ස්විට්සර්ලන්තයේ ජිනිවාහිදී සැප්තැම්බර් 14 වැනිදා ආරම්භ කෙරුණු අතර, එම සැසිවාරයේදී "ගෝලීය මානව හිමිකම් යාවත්කාලීන කිරීම" තේමාව යටතේ මානව හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස්වරිය සහ ශ්‍රී ලංකාව පිළිබඳ වූ 30/1 යෝජනාවලියේ ප්‍රධාන කණ්ඩායම වෙනුවෙන් එක්සත් රාජධානිය ශ්‍රී ලංකාව පිළිබඳ ඉදිරිපත් කළ ප්‍රකාශ පිළිබඳවත්, එම ප්‍රකාශ මගින් ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් මතු කළ චෝදනා පිළිබඳවත්, ශ්‍රී ලංකාවේ ස්ථාවරය පැහැදිලි කරමින් ඉදිරිපත් කළ පිළිතුරු ප්‍රකාශය පිළිබඳවත් විදේශ ඇමැති දිනේෂ් ගුණවර්ධන මහතා අමාත්‍ය මණ්ඩලය දැනුවත් කර තිබේ. එම කරුණු අමාත්‍ය මණ්ඩලය සැලකිල්ලට ගෙන තිබේ.

**බුද්ධිකා ඉඹුලාන - සිතාරා සේනානි**

# අප්‍රේල් 04 වැනිදා ලද තොරතුර නිශ්චිත බුද්ධි තොරතුරක් නොවන බව මට හැඟී ගියා

## හිටපු ආරක්ෂක ලේකම් හේමසිරි ප්‍රනාන්දු

**සුභාෂිණී සේනානායක**

විදෙස් බුද්ධි අංශයක් මඟින් රාජ්‍ය බුද්ධි සේවාවට ලැබී තිබුණු බුද්ධි තොරතුර ඉතා වැදගත් හෙයින් 2019 අප්‍රේල් 09 වැනිදා පැවති බුද්ධි සම්බන්ධීකරණ රැස්වීමේදී ඒ සම්බන්ධයෙන් රාජ්‍ය බුද්ධි අධ්‍යක්ෂවරයා හා කතා කළ යුතු බවට තමන්ට හැඟී ගිය බව හිටපු ආරක්ෂක ලේකම් හේමසිරි ප්‍රනාන්දු මහතා පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් විමර්ශනය කරන ජනාධිපති කොමිසම හමුවේ දෙවන දිනටත් (17) සාක්ෂි දෙමින් කියා සිටියේය.

කිසිදු ආකාරයක ප්‍රහාරයක් සම්බන්ධයෙන් කුඩා හෝඩුවාවක් හෝ නොලැබුණු තත්ත්වයක ජාතික බුද්ධි ප්‍රධානියා මඟින් මෙම තොරතුරු දැනගත් බව කියා සිටි ඒ මහතා මෙම තොරතුරු ගැන නිලන්ත ජයවර්ධන මහතා කතා කරාවී යැයි සිතා සිටි බවත් ඒ මහතා එහිදි අදහස් පළ නොකිරීම නිසා ඒ සම්බන්ධයෙන් ජාතික බුද්ධි ප්‍රධානි සිසිර මෙන්ඩිස් මහතා ඔහුගෙන් විමසා සිටි බවත් කියා සිටි හේමසිරි ප්‍රනාන්දු මහතා "ටීම් එකක් යවා තියෙන්නේ. තොරතුරු ලැබුණු පසු සවිස්තර වාර්තාවක් ඉදිරිපත් කරන්නම්" යැයි නිලන්ත ජයවර්ධන මහතා ආරක්ෂක කවුන්සිලය පැවැත්වෙද්දී කියා සිටි බවත් කීවේය.

> **රාජ්‍ය බුද්ධි සේවය අපිට තොරතුරු දෙන්නේ නැහැ. අපිව බයිපාස් කරලා වැඩ කරන්නේ කියලා හමුදාපතිව සිටි මහේෂ් සේනානායක මහතා වරක් මා සමඟ පැවැසුවා**

"එම බුද්ධි තොරතුර සම්බන්ධයෙන් කතා කරන ලෙස එවකට රාජ්‍ය බුද්ධි අධ්‍යක්ෂ ව සිටි නිලන්ත ජයවර්ධන මහතා දැනුවත් කරන ලෙස මම ජාතික බුද්ධි ප්‍රධානී සිසිර මෙන්ඩිස් මහතාට පැවැසුවා. එහෙත් 09 වැනිදා පැවති බුද්ධි සම්බන්ධීකරණ රැස්වීමේදී නිලන්ත ජයවර්ධන මහතා විසින් ඒ සම්බන්ධයෙන් කතා කළේ නැහැ. ඒ අප්‍රේල් 04 වැනිදා ලද තොරතුර නිශ්චිත බුද්ධි තොරතුරක් නොවන නිසා යැයි මට හැඟී ගියේ" යැයිද ඒ මහතා කොමිසම හමුවේ කියා සිටියේය.

තමන් එම තොරතුර නිශ්චිත බුද්ධි තොරතුරක් නොවන බව සඳහන් කරන්නේ කුමන පදනමකින්දැයි මෙහිදී කොමිසම ප්‍රශ්න කළ අතර ඊට පිළිතුරු දෙමින් සාක්ෂිකරු කියා සිටියේ නිශ්චිත බුද්ධි තොරතුරක් වීමට නම් ප්‍රහාරය එල්ල වන වේලාව, දිනය, නිශ්චිත ලෙසම ප්‍රහාරය එල්ල කරන ආකාරය සම්බන්ධයෙන් නිවැරදි ලෙසම දැක්විය යුතු බවයි.

තමන් එවැනි බුද්ධි තොරතුරු දැක තිබේදැයි කොමිසම විසින් ප්‍රශ්නයක් නගන ලදී. එම අවස්ථාවේ හේමසිරි ප්‍රනාන්දු මහතා සාක්ෂි දෙමින් පැවසුවේ 'ඔව් ස්වාමීනි, මම දැකල තියෙනවා' යනුවෙනි.

තමන් නාවික හමුදාවේ සේවය කරන සමයේ කුච්චිවේලි නාවික හමුදා අනු බණ්ඩයේ කඳවුරට LTTE ප්‍රහාරයක් එල්ල වෙන බවට අද ගහනවා යනුවෙන් නිශ්චිත ලෙසම තොරතුරු ලැබුණු බවයි. තමන් එම බුද්ධි සටහනද දුටු බවත් හේමසිරි ප්‍රනාන්දු මහතා සාක්ෂි දෙමින් පැවසු අතර එම සටහන දැකීමෙන් පළමු වරට මරණ බිය දැනුණු බවද හේමසිරි ප්‍රනාන්දු මහතා කොමිසම හමුවේ කියා සිටියේය.

**කොමිසමේ සභාපතිවරයා**

මෙම තොරතුර හා අප්‍රේල් 04 වැනිදා ලද තොරතුර සසඳා බලන්න. අප්‍රේල් 4 වැනිදා ලද තොරතුර තුළද ප්‍රහාරය එල්ල කරන තැනැත්තන් 6 දෙනෙකුගේ නම්,ප්‍රහාරය එල්ල වන ස්ථාන ලෙස ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලය සහ වැදගත් පල්ලි,ප්‍රහාරය එල්ලවිය හැකි ආකාර 4ක් සහ ප්‍රහාරය එල්ල වන කාලය Shortly ලෙස දක්වා තිබෙන අතර එය නිශ්චිත තොරතුරක් නොවන්නේ කෙසේද ?.

**සාක්ෂිකරු**

අප්‍රේල් 04 වැනිදා ලද තොරතුර නිශ්චිත තොරතුරක් නොවන බව එම තොරතුරු නිරීක්ෂණය කිරිමෙන් වැටහි ගියා.කොළඹ ප්‍රදේශය තුළ පල්ලි පමණක් 1500ක් පමණ තිබෙනවා. ඒ සම්බන්ධ තොරතුරු ආරක්ෂක අමාත්‍යාංශය සතුව තිබුණේ නැහැ.පල්ලි සම්බන්ධ විස්තර මම සොයා ගත්තේ ප්‍රහාරයෙන් පසුවයි.එමෙන්ම එහි සඳහන්ව ඇත්තේ ප්‍රහාරයක් එල්ල වනවා නොව එල්ල විය හැකි බවටයි..

**කොමිසම**

කෙසේ වෙතත් එය වැදගත් තොරතුරක් බවට තමන් හඳුනා ගැනීම නිසා ඒ සම්බන්ධයෙන් සාකච්ඡා කළාද

**සාක්ෂිකරු**

ඒ කොළ කැල්ලේ තොරතුරු ඇරෙන්න වෙන විස්තරයක් අපි දන්නේ නැහැ. ඒ ගැන සොයන්න බලය දීලා තිබුණේ රාජ්‍ය බුද්ධි සේවයට. ඔහු ඒක 09 වැනිදා බුද්ධි සම්බන්ධීකරණ රැස්වීමේ කතා කරන්න ඕනේ. ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, හමුදාපතිවරු තිදෙනා,යුධ හමුදා බුද්ධි අධ්‍යක්ෂ මේ සියලු දෙනා එතන හිටියා. ඒ අයටත් මේක දැනගන්න තිබුණා. රැස්වීම අවසාන මොහොතේ මම ජාතික බුද්ධි ප්‍රධානී සිසිර මෙන්ඩිස් මහත්මයාගේ අතේ තිබෙන කොළ දෙක දැකලා නිලන්තගෙන්

> **ව්‍යවස්ථාදායක අර්බුදයෙන් පසුව පත් වූ අගමැති මහින්ද රාජපක්ෂ මහතා ආරක්ෂක මණ්ඩල රැස්වීමට ගෙන්වන්න දැයි මා මෛත්‍රීපාල ජනපතිවරයාගෙන් විමසා සිටියත් එය අනවශ්‍ය බව සිරිසේන මහතා කියා සිටීයා.**

ඇහුවා අරක දාන්නේ නැද්ද නිලන්ත කියලා. ඒ වෙලාවේ නිලන්ත කිව්වේ සර් මම වාර්තාවක් හදලා තියෙන්නේ පොලිස්පතිතුමාට යවන්න. මගේ කණ්ඩායමක් යැව්වා රහසිගතව තොරතුරු බලන්න. අද රෑ තමයි ඔවුන් එන්නේ. මම සම්පූර්ණ වාර්තාවක් එවන්නම් කියල කිව්වා. මම ඒකෙන් සෑහීමකට පත් වුණා ස්වාමීනි. නිලන්ත කියන්නේ මාත් එක්ක සුහඳව වැඩ කරපු අවුරුදු හතරක් විතර බුද්ධි තොරතුරු ගැන අත්දැකීම තිබෙන පොලීසියේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක්. ඒ නිසා වැඩිදුරටත් ඒ වෙලාවේ ඒ ගැන කතාකරන්න අවශ්‍යතාවක් තිබුණේ නැහැ.

**කොමිසම**

මෙම තොරතුර සම්බන්ධයෙන් රාජ්‍ය බුද්ධි සේවයේ එවක අධ්‍යක්ෂ නිලන්ත ජයවර්ධන මහතා විසින් ජාතික බුද්ධි සේවයේ ප්‍රධානී සිසිර මෙන්ඩිස් මහතා වෙත එම විදෙස් බුද්ධි අංශයකින් තොරතුර දන්වා තිබුණු අතර අප්‍රේල් 08 වැනිදා සිසිර මෙන්ඩිස් මහතා සහ ඔබ අතර ඇත්තටම සිදු වූ සාකච්ජාව මෙම කොමිසමට පැහැදිලි කරන්න

**සාක්ෂිකරු**

අප්‍රේල් 08 වැනිදා ඉන්දීය ආරක්ෂක ලේකම් ඇතුළු පිරිස පැමිණ සිටි හෙයින් ඉතා කාර්ය බහුල දිනයක් වුවත් සිසිර මෙන්ඩිස් මහතා තමන් හමු වී මේ ගැන කතා කළ අතර එය දුටු විට එය ඉතා වැදගත් තොරතුරක් බව තමන් වටහා ගත් හෙයින් පසුදා පැවැත්වෙන බුද්ධි සම්බන්ධීකරණ රැස්වීමේදී නිලන්ත ජයවර්ධනට මේ ගැන කතා කරන්න කියමු කියලා මම කිව්වා.

> **පාස්කු දින ප්‍රහාරය සම්බන්ධයෙන් විමර්ශනය කරන ජනාධිපති කොමිසම**

**කොමිසම**

ඒ අනුව රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂකට ඒ ගැන කතා කිරීමට බුද්ධි සම්බන්ධීකරණ රැස්වීමේදී අවස්ථාව ලබා දුන්නාද

**සාක්ෂිකරු**

'අවස්ථාව දුන්නා. නමුත් කතා කළේ නැහැ'

කොමිසම

08 වැනිදා මේ තොරතුර ගැන ඔබ දැන ගන්න විට ඉන්දීය ආරක්ෂක ලේකම්වරයා සිටියේ ලංකාවේ. ඔබට හිතුනේ නැද්ද මේ වගේ බැරෑරුම් තොරතුරක් එද්දී ඉන්දීය ආරක්ෂක ලේකම් ලංකාවේ ඉන්න එක භයානක, අනතුරු දායක දෙයක් බවක් දැනුණේ නැද්ද?

**සාක්ෂිකරු**

නැහැ ස්වාමීනි. රාජ්‍ය බුද්ධි සේවය විශ්ලේෂණය කළ තොරතුරක් නොවෙයි දුන්නේ. විශ්ලේෂණය කරලා දුන්නොත් තමයි නිවැරදිව වැටහෙන්නේ. නිලන්තට තිබුණා මා එක්ක කතා කරන්න. මේ බුද්ධි තොරතුර ආපු රටවත් මම ඒ වෙලාවේ දැනගෙන හිටියේ නැහැ.

**කොමිසම**

මේ තොරතුරේ තිබෙනවා Shortly කියලා. එහෙම තියෙද්දීත් මේක බැරෑරුම් තත්ත්වයක් කියලා ඔබේ කාර්ය බහුල තත්ත්වයත් එක්ක හිතුනේ නැද්ද?

සාක්ෂිකරු: මේක විය හැකි ප්‍රහාරයක්. ඒ නිසා අවදානමක් තිබුණේ නැහැ. පහුවදා කතාකරන්න තීරණය කළේ ඒ නිසා.කෙසේවෙතත් අදාළ 09 වැනිදා බුද්ධි සම්බන්ධීකරණ රැස්වීමේදී නිලන්ත ජයවර්ධන මහතාට කරුණු දැක්වීමට ලැබෙන අවස්ථාවේ ඔහු විසින් විදෙස් බුද්ධි සේවාවකින් ඔහු වෙත ලැබී තිබුණ එම ප්‍රහාරයක අවදානම ගැන වූ තොරතුර සම්බන්ධයෙන් කතා නොකළ අතර රැස්වීම අවසානයේ එය කතා කිරීමට තමන් සිතා ගත්තා

**කොමිසම**

එම තොරතුර වැදගත් තොරතුරක් බවට තමන් විසින් හඳුනාගෙන තිබියදීත් එය පස්සට දැමේ ඇයි

සාක්ෂිකරු

බුද්ධි තොරතුරු හාරා අවුස්සනවට බුද්ධි අංශ කැමති නැහැ. කොහොමත් මට ඒ වෙද්දී හමුදා බුද්ධි අංශ දෙකක් කියල තිබුණේ මෙහෙම කරන්න බැහැ. SIS එක අපි එක්ක තොරතුරු බෙදා ගන්නේ නැහැ කියල. එවකට හමුදාපතිව සිටි මහේෂ් සේනානායක මහතා වරක් මා සමඟ පැවසුවා රාජ්‍ය බුද්ධි සේවය අපිට තොරතුරු දෙන්නේ නැහැ. අපිව බයිපාස් කරලා වැඩකරන්නේ කියලා. මම ඒ වෙලාවේ ඔහුට කිවේ කලබලවෙන්න එපා අපි ජනාධිපතිතුමා එක්ක කතා කරලා විසඳුමකට එමු කියලා'

**කොමිසම:** ජනාධිපතිතුමා එක්ක කතා කළාද?

සාක්ෂිකරු: නැහැ. බැරි වුණා. මම උත්සාහ කළෙත් නැහැ. මොකද පිට අය විසින් ඇති කර තිබුණු ගැටලු නිසා ජනාධිපතිතුමා මා එක්ක කතාකරන්න කැමැත්තක් දැක්වූයේ නැහැ.

**කොමිසම:** බුද්ධි සම්බන්ධීකරණ රැස්වීමේදී සහරාන් ගැන කතා කළේ නැද්ද?

**සාක්ෂිකරු:**සහරාන් ගැන කතා කළා. අන්තවාදියෙක් කියල කිව්වා. අන්තවාදී ප්‍රචණ්ඩත්වයෙන් ත්‍රස්තවාදයට යනවා කියලා කිව්වේ නැහැ.

මම එද්දිත් අගමැති ආරක්ෂක කවුන්සිලයට ආවේ නැහැ

තමන් ආරක්ෂක ලේකම් ධුරයට පත්වන විටත් අගමැතිවරයා සහ රාජ්‍ය ආරක්ෂක ඇමති ආරක්ෂක කවුන්සිලයට නොපැමිණි බව හේමසිරි ප්‍රනාන්දු මහතා කොමිසම හමුවේ සාක්ෂි දෙමින් පැවසුවේය.

ව්‍යවස්ථා අර්බුදයෙන් පසු නව අගමැති ලෙස මහින්ද රාජපක්ෂ මහතා පත් වූ අතර ඔහුව හෝ ආරක්ෂක මණ්ඩලයට කැඳවීමට ජනාධිපතිවරයා කටයුතු කර නැහැ.ආරක්ෂක කවුන්සිලයේ සභාපති ලෙස එය පැවැත්වීම මෙන්ම සහභාගී වන අය කවුරුන්ද යන්න තීරණය කරන්නේ ජනධිපතිවරයා වන අතර කෙසේවෙතත්

ආරක්ෂක කවුන්සිලයට සහභාගී විය යුතු නිත්‍ය සාමාජිකයන් කිහිප දෙනෙකුම ඊට පැමිණිම එවකට ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා විසින් වළක්වා තිබෙනවා.අලුත් අගමැතිව හෝ ආරක්ෂක කවුන්සිලයට කතා කරමු කියා මම ජනාධිපතිවරයාට පැවසුවා. එවිට එවකට ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා කිව්වේ'දැනට අවශ්‍ය නැහැ. පස්සේ බලමු' කියලායි.

**කොමිසම:** ඔබ ඇහුවේ නැද්ද ඒ ගැන?

සාක්ෂිකරු: ඇහුවා. ජනාධිපතිතුමා මොනවත් කිව්වේ නැහැ.

**කොමිසම:**මොකක්ද ඔබ වටහා ගත්තේ?

**සාක්ෂිකරු:** මොනවත් වටහා ගත්තේ නැහැ ස්වාමීනි. විධායක ජනධිපතිතුමා මොනව හරි කිව්වම ලේකම් එය ක්‍රියාත්මක කරන එකයි වැඩේ.

> **හිටපු අගමැති රනිල් වික්‍රමසිංහ සහ හිටපු පොලිස්පති පූජිත් ජයසුන්දර මහත්වරුන් ආරක්ෂක මණ්ඩල රැස්වීමට සහභාගි නොකරන්නැයි හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා තමන්ට දැනුම් දුන්නා.**

පොලිස්පති පූජිත් ජයසුන්දරත් ආරක්ෂක කවුන්සිලයෙන් එළියට දැම්මේ ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතායි. එවකට පොලිස්පති පූජිත් ජයසුන්දර මහතාද ආරක්ෂක කවුන්සිලයට පැමිණීම නතර කළේ ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතායි.මේකට හේතු වුනේ හිටපු ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානිට එරෙහිව රහස් පොලිසියේ නිලධාරියෙක් නඩුවක් ගොනු කිරිමට සූදානම් වුණා ඔහුව මාරු කරන්න කියා එවකට ජනාධිපතිතුමා උපදෙස් දුන්නා ඒ සම්බන්ධයෙන් පොලිස්පති පූජිත් ජයසුන්දර මහතා පොලිස් කොමිසමට ලිව්වා. පොලිස් කොමිසමෙන් විමැසූ බව සිරිසේන මහතා දැන ගැනිමෙන් පුසුව මේ විරසකය ඇති වුණා.හිටපු අගමැති රනිල් වික්‍රමසිංහ සහ හිටපු පොලිස්පති පූජිත ජයසුන්දර මහත්වරුන් ආරක්ෂක මණ්ඩල රැස්වීමට සහභාගි නොකරන්නැයි හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා තමන්ට දැනුම් දුන්නා.ව්‍යවස්ථාදායක අර්බුදයෙන් පසුව පත් වූ නව අගමැති මහින්ද රාජපක්ෂ මහතා ගෙන්වන්න දැයි තමා ජනපතිවරයාගෙන් විමසා සිටියා ඒ අවස්ථාවේ එය අනවශ්‍ය බව සිරිසේන මහතා කියා සිටීයා.

හිටපු අගමැති රනිල් වික්‍රමසිංහ මහතා නැවතත් අගමැතිවරයා ලෙස පත් වුණා. මම ඔහුට එන්න කියලා ආරාධනා කළේ නැහැ. මේ දෙන්නා අතර ඒ වනවිට නයි පොළොං වෛරයක් තිබුණා. එහෙත් නිළ බලයෙන් රනිල් වික්‍රමසිංහ මහතාට සහභාගී විය

> **ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානිට එරෙහිව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරියකු නඩු පවරන්න සූදානම් වූ අවස්ථාවේ ඒ නිලධාරියා සම්බන්ධයෙන් පොලිස්පති පූජිත් ජයසුන්දර මහතා පොලිස් කොමිසමට ලියා තිබුණා. ඒ නිසා පොලිස්පතිවරයා සමග මෛත්‍රීපාල සිරිසේන මහතා විරසකයක් ඇති කරගත්තා**

හැකියි. එහෙත් ඒ මහතා ආවෙත් නැහැ. මම ආරක්ෂක රාජ්‍ය අමාත්‍ය රුවන් විජයවර්ධන මහතාට එන්න කියා දැන්වූවෙත් නැහැ. ඒකට හේතුවුණේ ඒ අවස්ථාවේ මෛත්‍රීපාල සිරිසේන මහතා සිටියේ තදබල කෝපයකින්.ඒ නිසා ව්‍යවස්ථාදායක අර්බුදයෙන් පසුව 2019.01.04 තිබූ ආරක්ෂක මණ්ඩලය රැස්වීම සඳහා මම මේ අයට ආරාධනා කළේ නැහැ. ඒ වුණාට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරුන් වන දයාසිරි ජයසේකර, තිලංග සුමතිපාල, මහින්ද අමරවීර සහ ලසන්ත අලගියවන්න මහත්වරුන් ආරක්ෂක මණ්ඩල රැස්වීමට ජනාධිපතිවරයා සමග පැමිණියා. මම ආරාධනාවක් කටේ නැතිව මේ අය එනවිට මා පුදුමයට පත් වුණා. නිත්‍ය සාමාජිකයන් නොවී මේ අයට පැමිණීමට නොහැකි බවද හේමසිරි ප්‍රනාන්දු මහතා පාස්කු කොමිසම හමුවේ කියා සිටියේය.

ඒ වගේම ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානිට එරෙහිව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරියකු නඩු පවරන්න සූදානම් වූ අවස්ථාවේ ඒ නිලධාරියා සම්බන්ධයෙන් පොලිස්පති පූජිත ජයසුන්දර මහතා පොලිස් කොමිසමට ලියා තිබුණා. ඒ නිසා පොලිස්පතිවරයා සමග මෛත්‍රීපාල සිරිසේන මහතා විරසකයක් ඇති කරගත්තා යැයි ද ඒ මහතා කියා සිටියේය.

රාජ්‍ය බුද්ධි අංශය හමුදා බුද්ධි අංශය බයිපාස් කරමින් කටයුතු කරනවා කියලා හිටපු හමුදාපති මහේෂ් සේනානායක මහතා ආරක්ෂක කවුන්සල රැසිවීමකින් අනතුරුව මට දැනුම් දුන්නා අවස්ථා දෙකක් දී. නිලන්ත ජයවර්ධන මහතා බුද්ධි තොරතුරු බෙදා ගන්නේ නැහැ කියලා 2018 මාර්තු මාසයේ මට ජනාධිපති තමාට කියන්න කිව්වා. ඒ බව කියන්න මට නොහැකි වුනේ එතුමා අනෙකුත් අයගේ කතා අහලා මා සමග කතා කරන්න අකැමැත්තක් තිබූ නිසා. ඔහු එවූ වාර්තාවේ කොල දෙක පෙන්වා ජාතික බුද්ධි ප්‍රධානි සිසිර මෙන්ඩිස් මහතා කතා කරන්නේ නැද්ද කියලා නිලන්ත ජයවර්ධන මහතාගෙන් ඇසුවා .එවිට ඔහු ටීම් එකක් යැව්වා. විමර්ශන ඉවර වුණාම සවිස්තරාත්මක වාර්තාවක් ලබා දෙන්නම් කියා කිව්වා. මම හිතුවා දින දෙක තුනකින් දැනුම් දෙයි කියා යැයිද හිටපු ආරක්ෂක ලේකම්වරයා කොමිසම හමුවේ කියා සිටියේය.

ඒ මහතා මේ කරුණු කියා සිටියේ අතිරේක සොලිසිටර් ජෙනරාල්වරිය සහ කොමිසමේ විනිසුරු වරුන් සිදු කළ විමසීම් වලට පිළිතුරු ලබා දෙමිනි.

## කොලොන්නාව සංහිඳ සෙවණ නිවාස සංකීර්ණය ජනතා අයිතියට



**චන්දිමා කරුණාරත්න**

ඉදිරි වසර 5 තුළ පුළුල් වැඩපිළිවෙළක් ඔස්සේ මෙරට නිවාස ගැටලුවට ස්ථිරසාර විසඳුම් ලබාදෙන බව නාගරික සංවර්ධන, වෙරළ රක්ෂණ, අපද්‍රව්‍ය බැහැරලීමේ හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍ය ආචාර්ය නාලක ගොඩහේවා මහතා පැවැසීය.

අඩු පහසුකම් සහිත ජනාවාසවල පදිංචිකරුවන් සඳහා නව නිවාස ලබාදීමේ වැඩපිළිවළ යටතේ කොලොන්නාව 101 වත්ත පදිංචිකරුවන්ට 'කොලොන්නාව සංහිඳ සෙවණ නිවාස සංකීර්ණය 'ජනතා අයිතියට පත්කිරීමේ අවස්ථාවට සහභාගී වෙමින් ඒ මහතා මේ බව ප්‍රකාශ කළේ ය.

මැදි අදායම්ලාභීන්ගේ නිවාස ගැටලුවට ද විසඳුමක් ලෙස රජය මගින් නිවාස සාදා ඉතාමත් සාධාරණ මුදලකට දීර්ඝ කාලීන ණය ක්‍රමයක් යටතේ සෑම දිස්ත්‍රික්කයක්ම ආවරණය වන පරිදි ලබාදීමට කටයුතු කරමින් සිටින බවද රාජ්‍ය අමාත්‍යවරයා මෙහිදී කීය.

එම අවස්ථාවට පළාත් සභා, පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍ය රියර් අද්මිරාල් ආචාර්ය සරත් වීරසේකර, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යංශයේ ලේකම් සිරිනිමල් පෙරේරා, නාගරික සංවර්ධන අධිකාරියේ සභාපති හර්ෂාන් ද සිල්වා, නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ප්‍රසාද් රණවීර යන මහත්වරුන් ඇතුළු නිලධාරීහු පිරිසක් සහභාගී වූහ.

## 'සුවධරණී' හෙළ ඔසු ව්‍යාපෘතියෙන් මිලියන 1000ක විදේශ විනිමය ඉතුරුවක්



**සන්ධ්‍යා කරුණාරත්න**

'සුවධරණී' හෙළ ඔසු සංවර්ධන හා සංරක්ෂණ ව්‍යාපෘතිය ආරම්භයත් සමඟ රුපියල් මිලියන 1000ක පමණ විදේශ විනිමය මෙරටට ඉතිරි කර ගත හැකි බව දේශීය වෙදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන සහ ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය ඇමැති සිසිර ජයකොඩි මහතා පැවැසුවේය.

දේශීය ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය සඳහා මෙරටට අවශ්‍ය ඖෂධ පැළෑටි අවශ්‍යතාවෙන් සියයට 50 ක් ඉදිරි වසර තුන තුළදී දේශීයවම වගා කිරීමට පියවර ගන්නා බව ද ඇමැතිවරයා පැවැසුවේය.

අනගාරික ධර්මපාලතුමන්ගේ 156 වැනි ජන්ම දින සංවත්සරය නිමිත්තෙන් 'සුවධරණී' හෙළ ඔසු සංවර්ධන හා සංරක්ෂණ ව්‍යාපෘතියේ සමාරම්භක උත්සවයට සහභාගි වෙමින් නාවින්න ආයුර්වේද දෙපාර්තමේන්තුවේදී ඇමැතිවරයා මේ බව ඊයේ (17) ප්‍රකාශ කළේය. මෙම ව්‍යාපෘතියේ සමාරම්භක උළෙලේදී සෞඛ්‍ය ඇමැතිනී පවිත්‍රා වන්නිආරච්චි, වෙළෙඳ ඇමැති ආචාර්ය බන්දුල ගුණවර්ධන, දේශීය වෙදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන සහ ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය ඇමැති සිසිර ජයකොඩි මහත්ම මහත්මීහු ඔසු පැළ වගා ව්‍යාපෘතියකට එක් වූහ.

මෙම අවස්ථාවට දේශීය වෙදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන සහ ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් කුමාරි වීරසේකර, ආයුර්වේද දෙපාර්තමේන්තුවේ කොමසාරිස් චතුර කුමාරතුංග මහත්ම මහත්මීහු සහභාගි වූහ.

**ඡායාරූපය - සමන්ත වීරසිරි**

## විමල සුරේන්ද්‍ර ගුණ සැමරේ



**අමෝදා ජයමහ**

2030 වසර වනවිට පුනර්ජනනීය බලශක්තිය උපරිමයෙන් ලබා ගනිමින් මහජනතාවට මනා වූ සේවයක් සපයන ලබා දායී ආයතනයක් බවට විදුලිබල මණ්ඩලය පත් කිරීමට කැපවන බව විදුලිබල මණ්ඩල සභාපති ඉංජිනේරු විජිත හේරත් මහතා පැවැසුවේ ය.

විදුලිබල මණ්ඩල ප්‍රධාන කාර්යාලයේ පෙරේදා (17) පැවැති විදුලිබල උත්පාදන පුරෝගාමී විමලසුරේන්ද්‍ර මහතාගේ 146 වන ගුණ සමරුවට එක්වෙමින් ඒ මහතා මේ බව පැවසුවේ ය.

පුනර්ජනනීය බල ශක්තිය තුළින් බලශක්ති අර්බුදය ජය ගැනීම ඉලක්කය බවද මොරගොල්ල විදුලි ව්‍යාපෘතිය 2023 වර්ෂය වන විට අවසන් කර ජනසතු කළ හැකි වනු ඇති බවටද සභාපතිවරයා විශ්වාසය පළ කළේය.

**ඡායාරූපය - චින්තක කුමාරසිංහ**

■ ඩබ්ලිව් රෝහණ - බුලත්කොහුපිටිය සමූහ

# රාජ්‍ය ඇමැති කනක සහ වතු සමාගම් අතර හමුවක්



අමාත්‍යයවරයා ඇතුළු සහභාගි වී සිටි වතු සමාගම් නියෝජිතයෝ

සමාගම් වතු ප්‍රතිසංස්කරණ, තේවතු ආශ්‍රිත බෝග, තේ කර්මාන්ත ශාලා නවීකරණ හා තේ අපනය බෝග ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යය කනක හේරත් මහතාගේ ප්‍රධානත්වයෙන් කෑගල්ල දිස්ත්‍රික්කයේ වතු සමාගම්වල පාලන අධිකාරියේ සහභාගිත්වයෙන් පසුගියදා කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දී වතු සමාගම් හා අමාත්‍යවරයා අතර සාකච්ඡාවක් පැවැත්විණි.

එහිදී වතු ජනතාවගේ නිවාස ප්‍රශ්නය හා වතු සමාගම්වල කටුපොල් වගාව සිදු කිරීම යන මූලික කරුණු සාකච්ඡා කෙරිණි.

වතු පාලන අධිකාරියන් විසින් කියා සිටියේ පේළි නිවාස වෙනුවට වෙනත් වැඩපිළිවෙළකට යාමට වතු සමාගම් කටයුතු කරන බවයි. එමෙන්ම කටුපොල් වගාවන් වතු සමාගම් විසින් රහසිගතව වගා කරනවා යයි යන චෝදනාවට පිළිතුරු දුන් එම සමාගම් කියා සිටියේ සම්පූර්ණයෙන් එම චෝදනාව ප්‍රතික්ෂේප කරන බවයි.

කැලණි වැලි වැවිලි සමගාම, බොගවන්තලාව වැවිලි සමාගම, කෑගලු වැවිලි සමාගම ආදී සමාගම් වලට අයත් වතු වල පාලන අධිකාරිය සහභාගි වී සිටියහ.

මෙම අවස්ථාවට කෑගල්ල දිස්ත්‍රික් ලේකම් මහින්ද එස් වීරසූරිය, අතිරේක දිස්ත්‍රික් ලේකම්වරු වන නාලිකා පියසේන, දිනිෂා රත්නායක යන මහත්ම මහත්මීන් ඇතුළු ප්‍රාදේශීය ලේකම්වරු ද සහභාගි වී සිටියහ.

■ ඩී.එස් ගුණතිලක - ඌව වෙල්ලස්ස විශේෂ

# අභිජනනයට යැයි කියා ගවයන් මසට ගෙන ගිහින්



වැල්ලවාය ඇතිලිවැව ප්‍රදේශයේ සිට අක්කරේපත්තු ප්‍රදේශයට ලොරියකින් රැගෙන යමින් සිටි මී මී ගවයන් පහළොස් දෙනකු මොනරාගල පොතුවිල් මාර්ගයේ වැලියාය ප්‍රදේශයේදී පොලීසිය මඟින් අත්අඩංගුවට ගෙන ඇත.

මෙම මී ගවයන් අභිජනනය සඳහා රැගෙන යන බවට පශු වෛද්‍ය නිලධාරීන් සහතික ලබාදී තිබුණත් සතුන් මස් පිණිස ඝාතනය කිරීමට සිදු කරන බැව් පරීක්ෂණවලදී හෙළිවී තිබේ. මෙම මී ගවයන්ගේ වටිනාකම රුපියල් ලක්ෂ 5 ක් පමණ වේ. ලොරියේ රියදුරු සහ තවත් අයකු පොලීසිය මඟින් අත්අඩංගුවට ගෙන ඇති අතර සැකකරුවන් සහ නඩු භාණ්ඩ මොනරාගල මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතව තිබිණි. මොනරාගල මූලස්ථාන පොලිස් පරීක්ෂක ඉන්දික ගමගේ මහතාගේ මෙහෙයවීම යටතේ උ.පො.ප පී.එම් දයානන්ද මහතා ඇතුළු කණ්ඩායමක් වැටලීම සිදු කර ඇත.



# ලුණුගල සමෘද්ධි ලාභීන්ගේ අඩු ආදායම්ලාභීගේ ආර්ථිකය නංවන්න වැඩපිළිවෙළක්

ලුණුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සමෘද්ධි පවුල් සහ අඩු ආදායම්ලාභී පවුල් වල ආර්ථිකය නගා සිටුවීමට ඔවුන්ගේ නිසරු ඉඩම් තේ ඇතුළු අපනයන බෝග වගාබිම් බවට පත්කිරීමේ වැඩසටහනක් ඇරඹේ.

කම්කරු අමැති නිමල් සිරිපාල ද සිල්වා මහතාගේ ඉල්ලීම පරිදි වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය, කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය සමග එක්ව මෙම වැඩසටහන මෙහෙයවයි. පසුගියදා කම්කරු අමාත්‍යාංශයේ පැවති සාකච්ඡාවකදී ඇමැති නිමල් සිරිපාල ද සිල්වා මහතා කියා සිටියේ, ඌවේ ජනතාව දැඩි සංවර්ධන අසාධාරණයකට ලක්වූ පිරිසක් බවත්, ඔවුන්ට සංවර්ධන සාධාරණය ඉටුකර දී ඌවේ දුෂ්කර ගම්මාන වල ජනතාව ආර්ථික වශයෙන් ශක්තිමත් කිරීම තම අරමුණ බවය. මෙම ප්‍රදේශයේ ජනතාවට සිය කුඩා ඉඩම් වල තේ වගාව ඇරඹීමට ප්‍රධාන බාධකය ආර්ථික අපහසුතාවයන් බවත් ඔවුන්ට තේ පැළ ලබා දීමට හැකි නම් ඔවුන්ගේ ජීවන තත්ත්වය කෙටි කලක් තුළ යහපත් තත්ත්වයකට ගෙන ආ හැකි බව අමැතිවරයා මෙහිදී පෙන්වා දුන්නේය.

ඒ අනුව ලුණුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ග්‍රාම නිලධාරී වසම් 14 ක පවුල් 243 කට සිය අක්කර කාල බැගින් වූ ඉඩම්වල නව තේ වගා ඇරඹීමට අවශ්‍ය පහසුකම් සැපයීමට වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය ලේකම් රවීන්ද්‍රි හේවාවිතාරණ මහතා මෙහිදී පැවසීය.

එහිදී මෙම වැඩසටහන යටතේ සිය ඉඩමේ වගා බිම සකස් කර ගැනීම ප්‍රතිලාභියාගේ වගකීමක්වේ. අවශ්‍යතේ පැළ ලබාදීම, ඵලදා සංවර්ධන උපදෙස්, වගාවට අදාළ පුහුණු කටයුතු කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය මගින් සිදුකෙරේ.

තේ වලට අමතරව එම ඉඩම් වල අතිරේක වගාවන් ලෙස පුවක්, ගම්මිරිස්, කෝපි, කොකෝවා, එනසාල්, කරාබු නැටි වැනි අපනයන බෝග වගා කිරීමට ද අවශ්‍යය, දිරිගැන්වීම් සිය අමාත්‍යයංශය මගින් සිදු කිරීමට සූදානම් බව රවීන්ද්‍ර හේවාවිතාරණ මහතා පැවසීය.

මේ සඳහා එක් වගා ඒකකයක් සඳහා රුපියල් 60000 කට අසන්න අධාර මුදලක් ලබා දීමට අපේක්ෂිතය. ඒ අනුව ලුණුගල මෙම වැඩසටහන සඳහා කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය රුපියල් මිලියන 19 අසන්න මුදලක් වැය කිරීමට නියමිත අතර, මෙම තේ වගා ව්‍යාපෘතියෙන් දළ වශයෙන් මාසයකට එක් පවුලකට රුපියල් 20000 කට ආසන්න අදායමක් ලබා ගත හැකි බව කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ සාමාන්‍යාධිකාරී ඩී.එච්. මහීපාල මහතා මෙහිදී පෙන්වා දුන්නේය.

මෙම ඉඩම් සහිත ගම්මාන වලට යාමට ඇති අති දුෂ්කර ග්‍රාමීය මාර්ග සංවර්ධනයට ද කිසියම් වැඩපිළිවෙළක් යොදන ලෙසද අමාත්‍යවරයා මෙහිදී විශේෂ ඉල්ලීමක් කළේය.

මෙම අවස්ථාවට කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ සාමාන්‍යධිකාරී ඩී.එච්. මහීපාල, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී සී.ජේ.අයි.ටී. ප්‍රනාන්දු ඇතුළු නිලධාරී පිරිසක් එක්වූහ.

■ ඒ.පී. දයාචන්ද්‍ර - ඌරුබොක්ක විශේෂ

# බටු මෝජු හදලා පත්තර කොළවල ඔතලා

## හෝටල් හිමිකරුට 20,000ක් දඩ

පරිභෝජනයට නුසුදුසු හා සනීපාරක්ෂාවට අහිතකර ලෙස මුද්‍රිත පත්තර කඩදාසි මත පිසින ලද වම්බොටු මෝජු ගබඩාකර තබා ගැනීමෙන් හා හෝටලයේ මුළුතැන්ගෙයි ඉතාම අපිරිසිදු ලෙස තබා ගනිමින් මුළුතැන්ගෙයි ඉවත් කරන කැළි කසළ තැන තැන දමා තිබීම පිළිබඳ වරදකරු බවට පිළිගත් මාතර ප්‍රදේශයේ හෝටල් හිමියකුට මාතර මහෙස්ත්‍රාත් අතිරේක දිසා විනිසුරු චම්පික රාජපක්ෂ මහතා විසින් දඩ නියම කරමින් රුපියල් විසිදහසක (20000.00) දඩ මුදලක් ගෙවන ලෙසට නියෝග කළේය. මෙසේ දඩ ගෙවීමට නියම වූයේ මාතර වෙරළ පාරේ පිහිටි රණතුංග හෝටලයේ අයිතිකරුටය.

පැමිණිල්ල වෙනුවෙන් අධිකරණයේ පෙනී සිටී වැලිහේන මහජන සෞඛ්‍ය පරීක්ෂක ජේ.පී. අබේවික්‍රම සමඟ මහජන සෞඛ්‍ය පරීක්ෂක දම්මික විදාන පතිරණ යන මහත්වරු පෙනී සිටියහ. පිසින ලද වම්බොටු මෝජු මුද්‍රිත පත්තර කඩදාසි මත ගබඩා කර තැබීම හා හෝටලයේ මුළුතැන්ගෙයි ඉතාම අපිරිසිදු ලෙස කැළි කසළ තැන තැන දමා තිබීම හේතුවෙන් මිනිස් පරිභෝජනයට නුසුදුසු මෙන්ම මහජනතාවගේ සනීපාරක්ෂාවට අහිතකර ලෙස මාතර වෙරළ පාරේ හෝටලයක් පවත්වාගෙන යන බවට තොරතුරක් ලැබුණා.

ඒ ලැබුණු තොරතුරට අනුව වෙරළ පාරේ පිහිටි මෙම හෝටලය පරීක්ෂාවට ලක්කිරීමේදී මහජනතාවට ආහාර විකිණීමට ආහාර පිසින මුළුතැන්ගෙයි කැළි කසළ තැන තැන දමා ඉතා අපිරිසිදු ලෙස පවත්වාගෙන යන බවට සොයා ගත්තා. ඒ අනුව හෝටල් හිමිකරුට විරුද්ධව චෝදනා ගොනුකර බවට අධිකරණයට වැඩිදුරටත් කරුණු දැක්වීය.

■ පී.පී.ගුණතිලක - ගලේවෙල මධ්‍යම සමූහ

# ගලේවෙල උපාධිදාරී 260කට පත්වීම්



ගලේවෙල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ උපාධිධාරීන් 260කට පසුගිය දා පත්වීම් ලිපි ලබා දීම සඳහා අදාළ කාර්යාලය වෙත කැඳවා තිබිණි. එහිදී පත්වීම් ලබාදීම සංකේතවත් කරමින් ප්‍රාදේශීය ලේකම් එම්.යූ. නිශාන්ත මහතා විසින් උපාධිධාරි හිමිනමකට පත්වීම් ලිපිය ලබාදුන් අතර පත්වීමේ ලිපි පිරිනැමීම ප්‍රාදේශීය ලේකම් ශ්‍රවණාගාරයේදී පැවැත්විණි. මේ අවස්ථාවට සහකාර ප්‍රාදේශීය ලේකම් චතුරිකා නවරත්න, ගණකාධිකාරි පුබුදු එගොඩවත්ත ඇතුළු නිලධාරිහු පිරිසක් සහභාගී වූහ.

■ රූපිකා කේ.බණ්ඩාර - කුරුවිට සමූහ

# රත්නපුරයේ 'සපිරි ගමක්' වැඩසටහනින් ව්‍යාපෘති දෙදහස් විසිඑකක්

සපිරි ගමක් ජනතා සහභාගිත්ව ග්‍රාමීය සංවර්ධන වැඩසටහන යටතේ රත්නපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස දාහත තුළ ව්‍යාපෘති දෙදහස් විසිඑකක් ක්‍රියාත්මක වන බවත් දැනට ව්‍යාපෘති හත්සිය අනූදෙකක වැඩ අවසන් වී තිබෙන බවත් රත්නපුර දිස්ත්‍රික් ක්‍රම සම්පාදන අධ්‍යක්ෂ ඩබ්ලිව්.පි.සමන් තිලක මහතා පවසයි.

රත්නපුර දිස්ත්‍රික් ලේකම් මාලනී ලොකුපෝතාගම මහත්මියගේ උපදෙස් හා මගපෙන්වීම මත මෙම ව්‍යාපෘති සිදුකරයි. ඇහැලියගොඩ කොට්ඨාසයේ ව්‍යාපෘති 162ක්ද, කුරුවිට 136ක්ද, කිරිඇල්ල 66ක්ද, රත්නපුර 182ක්ද, ඉඹුල්පේ 175ක්ද, බලංගොඩ 176ක්ද, ඕපනායක 70ක්ද, පැල්මඩුල්ල 135ක්ද, ඇලපාත 79ක්ද, අයගම 74ක්ද, කලවාන 129ක්ද, නිවිතිගල 88ක්ද, කහවත්ත 82ක්ද, ගොඩකවෙල 165ක්ද, වැලිගෙපොල 102ක්ද, ඇඹිලිපිටිය 98ක්ද, කොලොන්න 102ක්ද වශයෙන් මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක වේ.මේ සඳහා අනුමත මුළු ප්‍රතිපාදන ප්‍රමාණය රුපියල් මිලියන 1147.5කි.

## ජන පොත

# සාම විනිසුරු පදවි ලබති



ගාල්ල හබරාදුව පිටිදූව 'සියල්සෙත්' නිවසෙහි පදිංචි ගංගානාත් කෝසල ගුණසේකර මහතා මුළු දිවයිනටම බලපැවැත්වෙන පරිදි සාමදාන විනිශ්චයකාරයකු ලෙස ගාල්ල දිසා අධිකරණයේදී දිසා විනිසුරු නිල්මිණි කේ. විතාරණ මහත්මිය ඉදිරියේ දිවුරුම් දෙන ලදී.

ඒ මහතා ගාල්ල ශාන්ත ඇලෝෂියස් විද්‍යාලයෙන් 1978 වසරේදී පළමුවන ශ්‍රේණියට ඇතුල් වී 1190 වසරේදී උසස් පෙළ හදාරා සමත්ව එම විද්‍යාලයේම වසර 13ක් ඉගෙනුම ලැබූ කීර්තිමත් ආදි ශිෂ්‍යයෙක්ය. තවද ඒ මහතා රාජ්‍ය සේවා වෘත්තීය සමිති සම්මේලනයේ ලේකම් ලෙසද කටයුතු කරයි. ඒ මහතා ප්‍රදේශයේ ප්‍රකට දේශපාලන හා සමාජ සේවකයෙක්ද වේ.

■ එස්.එම්.ෆාරුක් - වැලිමඩ විශේෂ



ශ්‍රී ලංකා නාවික හමුදා වසර 22 සේවා කාලයකින් පසු විශ්‍රාම ලබා ඇති කේ.ඩී. කරුණාසිරි මහතා නො. 53, ගල්ලොලුව මිනුවන්ගොඩ ලිපිනයෙහි පදිංචිව සිටී. උත්තම සේවා පදක්කමෙන් පිදුම් ලබා ඇති අතර මුළු දිවයිනටම සමාදාන විනිශ්චයකාරවරයකු ලෙසට ගම්පහ අතිරේක දිසා විනිසුරු ඩී.එම්. රවීන්ද්‍ර රන්ජන් බණ්ඩාර මහතා ඉදිරියේ ප්‍රතිඥා දුනි. මූලික අධ්‍යාපනය බුත්පිටිය කනිෂ්ඨ විද්‍යාලයෙන් සහ වැඩිදුර අධ්‍යාපනය බුත්පිටිය මහා විද්‍යාලයෙන් හදාරා ඇති අතර පරිගණක ඩිප්ලෝමාධාරියෙකි.

තවද ඉන්දියාවේ බෙල්ගම්හිදි නායකත්වය හා අනදීමේ පාඨමාලාවක්ද, බූස්ස නාවික හමුදා උසස් පුහුණු පාසලේ නායකත්වය හා කළමනාකරණ පාඨමාලාවක් ද උණවටුන ගුරු අභ්‍යාස විද්‍යාලයේ සහ මාතර නිල්වලා විද්‍යාපීඨයේ උපදේශක තාක්ෂණික පාඨමාලාවක් හදාරා ඇති අතර පාසල් ශිෂ්‍යභට උපදේශකවරයකු ලෙසද කටයුතු කර ඇත. දැනට ලේක්හවුස් ආයතනයේ සේවය කරනු ලබයි.

■ සේන ඉදිරිසිංහ - වයඹ පළාත් සංචාරක

# පාරිභෝගික වැටලීම්වලින් විශාල මුදලක්

පාරිභෝගික අධිකාරියේ කුරුණෑගල දිස්ත්‍රික් කාර්යාලයේ වැටලීම් අංශය මගින් ඉකුත් අගෝස්තු මාසය සිදු කරන ලද වැටලීම් වලින් රුපියල් තුන් ලක්ෂ හතළිස්දහසක දඩ මුදලක් ලබාගෙන ඇතැයි පාරිභෝගික අධිකාරියේ වයඹ පළාත් අධ්‍යක්ෂ එච්.ඒ. ගුණරත්න මහතා පැවැසීය. සිදු කරන ලද වැටලීම් ප්‍රමාණය 73කි. මිල ප්‍රදර්ශනය නොකිරීම, කල් ඉකුත් වූ භාණ්ඩ විකිණීම හා ඒවා ප්‍රදර්ශනය, වැඩි මිලට විකිණීම, වගකීම් සහතික නොමැතිව විකිණීම වැනි පාරිභෝගික නීති උල්ලංඝනය කළ වෙළෙඳුන්ට විරුද්ධව අධිකරණයේ නඩු පවරා මෙසේ දඩ මුදල් අය කරගෙන ඇත.

මීට අමතරව රූපලාවන්‍ය ආලේප භාණ්ඩ සම්බන්ධයෙන් ඒවා අළෙවි කරන්නන් දැනුවත් කිරීමේ ජංගම වැඩසටහන් ආරම්භ කිරීමට පියවරගෙන ඇති බවද පැවැසීය.

■ සකුන්තලා ජයසිංහ - අඹන්පොළ විශේෂ

# මහ සියඹලන්ගමුව වැව් රක්ෂිතය වැනසෙන්නට පෙර රැකගනිමු ද?



උකුස ඇස
ukusuase@lakehouse.lk

වන සතුන්ගේ නිදහස් තෝතැන්නක් මෙන්ම අගනා පරිසර පද්ධතියක් වු මහ සියඹලන්ගමුව වැව් රක්ෂිතයට අනවසර වගාවන් හේතුවෙන් බරපතළ පාරිසරික තර්ජනයක් එල්ල වෙමින් පවතින බැව් ප්‍රදේශවාසීහු පවසති.

2012 වසරේ වැව් රක්ෂිතය ආරක්ෂා කර ගැනීම සඳහා ප්‍රදේශවාසීන් රාජ්‍ය ආයතන කීපයක සහාය ඇතිව විශේෂ පාරිසරික වැඩසටහනක් ද ක්‍රියාතමක කළද අද වන විට ඒ සියල්ල පුස්සක් බවට පත් කරමින් වැව් තාවුල්ල අනවසරෙන් අල්ලා ගෙන ගොවිතැන් කරන බැව් ජනතාව පවසයි.

මේ සම්බන්ධයෙන් වැඩිදුරටත් කරුණු අනාවරණය කරමින් මහ සියඹලන්ගමුව වම් ඉවුර ගොවි සංවිධානයේ හිටපු ලේකම් සමන්ත සංජීව මහතා කියා සිටියේ මේ වන විට වැව් රක්ෂිතය අල්ලා ගෙන ඇතැමුන් ලියැදි සකස් කර කුඹුරු ද අස්වද්දා ඇති බවයි. හෙතෙම මේ සම්බන්ධයෙන් මෙසේ ද කියා සිටියේය.

මහ සියඹලන්ගමුව වැව ආරක්ෂා කර ගැනීමට 2012 වැවේ මායිම් නිරවුල් කරලා ගල් දැම්මා. ඒවා අනවසර වගාකරුවෝ ගැලෙව්වා. 2018 පැළ 15000ක් රක්ෂිතයේ හිටෙව්වා. අද එක පැළයක් වත් නෑ. සියල්ලම ගලවලා . අපි දන්නා තරමින් අක්කර 200ක් පමණ වැව් රක්ෂිතයෙන් අල්ලා ගෙන වගා කරනවා. වැව ඇතුළේ විදුලි වැටවල් ගහලා . නියරවල් බැඳලා කුඹුරු කරනවා. මේ නිසා වැව් රක්ෂිතයේ ඉන්න වනඅලි ගම්මාන වලට වැදිලා මහත් විනාශයක් කරනවා. විසඳුමක් පේන තෙක් මානයකවත් නෑ.මේ ප්‍රශ්නය විසඳන්න කාටවත් වුවමනාවකුත් නෑ.

මහ සියඹලන්ගමුව වැව් රක්ෂිතයේ වත්මන් තත්ත්වය පිළිබඳ ගල්ගමුව ගල්ගමුව වාරිමාර්ග ප්‍රාදේශීය ඉංජිනේරු එන්. ජී.එම් වීරසූරිය මහතාගෙන් කළ විමසීමේ දී හෙතෙම පැවසුවේ මෙවැන්නකි.

වැව් රක්ෂිතයෙන් කොටසක් අපිට අයිතියි. තවත් කොටසක් වනජීවි දෙපාර්තමේන්තුවටත් තියෙනවා. අනවසර අල්ලා ගැනීම් නැවැත්වීමට නම් සියලු ආයතන ඒකාබද්ධව වැඩපිළිවෙළකට යා යුතුයි. වාර්මාර්ග රක්ෂිතයේ ඇතැම් කොටස්වලට වෙනත් ආයතන මගින් බලපත්‍රත් දිලා තිබෙනවා. ඒ නිසා මේ සම්බන්ධයෙන් තීරණයක් ගැනීම සංකීරණ වැඩක්. නමුත් අපි අනවසර වගාවට අපි කිසිසේත්ම අනුබල දෙන්නේ නෑ.නිරන්තරයෙන් වැටලීම් කරනවා.

■ එස්.එම්. ෆාරුක් - වැලිමඩ විශේෂ

# බර වාහන ගමන් කිරීමෙන් පාරට හානි

හපුතලේ හා බණ්ඩාරවෙල මාර්ග දෙක සම්බන්ධ කරමින් දඹවින්න පුරාණ විහාරස්ථානය අසලින් ආරවැලිමඩම්භ වී වැලිමඩ විදුලිබල මණ්ඩලයට නුදුරින් හපුතලේ මාර්ගයට සම්බන්ධ වනවා අක්කර 28 ගම කොන්ක්‍රීට් මාර්ගයේ ටොන් 5 වැඩි බර වාහන ගමනාගමනය තහනම් කර තිබියදී අඩි අටක් පළල එම මාර්ගයේ පස් හා වැලි පුරවාගත් විශාල ටිපර් රථ මෙන්ම දැව කඳන් පටවන ලද විශාල ලොරි රථය ධාවනය කිරීම නිසා එම මාර්ගය අබලන් වෙමින් පවතින බවට ප්‍රදේශවාසීහු චෝදනා කරති.

■ සම්පත් ප්‍රියනන්දන - බලන්ගොඩ විශේෂ

# වන අලි උවදුර මඩින්න ඉක්මනින් පිහිට වෙන්න

ඉඹුල්පේ ප්‍රදේශිය ලේකම් කොට්ඨාසයට අයත් පුවක්ගහවෙල ප්‍රදේශයට පැමිණි වන අලි රංචුවක් එම ප්‍රදේශයේ ගොවීන් විසින් වගාකර ඇති කුඹුරු වගාවන් රැසක් විනාශ කර දමා ගොස් ඇතැයි ගොවීහු කියති.

අස්වැන්න නෙළීමට දින කිහිපයක් තිබියදී මෙලෙස කුඹුරු වගා විනාශ කිරීම හේතුවෙන් තමන් දැඩි ලෙස අසරණතත්ත්වයට පත් වන බවද ගොවීහු කියති.

බිජ,පොහොර ,රසායනික දියර සඳහා විශාල මුදලක් වැය කර එමෙන්ම කාලය ශ්‍රමය වැය කර වගා කළ කුඹුරු වගාවන් වන අලි විසින් විනාශ කිරීම හේතුවෙන් තමන් ආර්ථික ගැටලු රැසකට මුහුණ පාන බවද ඔවුහු සඳහන් කරති.

■ ටී.එල්.ඒ.පී.හේමපාල-නාගොඩ සමූහ

# විදෙස් රටක තුවක්කුවක් සමඟ සැකකරු අසුවේ

විදේශීය රටක නිපදවන ලද බෝර 12 වර්ගයේ තුවක්කුවක් සමග සැකකරුවකු උඩුගම පොලීසිය විසින් අත්අඩංගුවට ගෙන ඇත. සැකකරු උඩුගම අලුත්වත්ත ප්‍රදේශයේ පදිංචි අවුරුදු 31 පමණ වයසැති අයෙකි.

උඩුගම පොලිස් ස්ථානයේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක අයි.ඩී.සී. ක්‍රිෂාන්ත පො.ප .පුෂ්පකුමාර මහත්වරුන් ඇතුළු නිලධාරීන් වැටලීම සිදුකරඇත. සැකකරු උඩුගම මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතව තිබිණි.

1 TEAM 1 NATION
Sri Lanka Cricket

## ‘ශ්‍රී ලංකා ක්‍රිකට් Pace Ace - 2020’ වැඩසටහනට අනුග්‍රාහකයකු සොයා ගැනීම සඳහා කැමැත්ත ප්‍රකාශ කිරීම (EOI)

ගෝලීය වශයෙන් පිලිගැනීමක් ලබා ඇති ජාත්‍යන්තර සන්නාමයක් වන ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය, අනාගතයේදී ජාතික කණ්ඩායම නියෝජනය කිරීමට හැකියාවෙන් හෙබි එහෙත් සිය හැකියාව ජාතික මට්ටමින් ඉදිරිපත් කිරීමට අවස්ථාව නොලද වේග පන්දු යවන්නන් හඳුනා ගැනීම වෙනුවෙන් දිස්ත්‍රික්ක මට්ටමින් ‘Pace Ace - 2020’ නම් දක්ෂතා ගවේශන වැඩසටහනක් ආරම්භ කිරීමට සැලසුම් කර තිබේ. දිවයින පුරා විසිරී සිටින කුසලතාවයන්ගෙන් පිරි ක්‍රීඩකයින් සෙවීම වෙනුවෙන් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය සිදුකරගෙන යනු ලබන වැඩපිළිවෙළට සැලකිය යුතු දායකත්වයක් මෙමඟින් ලැබෙනු ඇති බව ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ අපේක්ෂාවයි.

ඒ අනුව ‘ශ්‍රී ලංකා ක්‍රිකට් Pace Ace - 2020’ වැඩ සටහනෙහි එකම අනුග්‍රාහකයා ලෙසින් කටයුතු කිරීමට උනන්දුවක් දක්වන මෙරට කීර්තිමත් ආයතන වලට ඒ සඳහා ඉදිරිපත් වන ලෙස ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය ආරාධනා කර සිටියි. ශ්‍රී ලංකා ක්‍රිකට් සමඟ අත්වැල් බැඳගනු ලබන ලංසුකරු / අනුග්‍රාහකයාට දිවයින පුරා සිය වෙළෙඳ නාමය ප්‍රචාරණය කරගැනීම සඳහා වූ වාණිජම අවස්ථාවක් නිර්මාණය වනු ඇත.

මේ සඳහා උනන්දුවක් දක්වන ආයතන 2020 සැප්තැම්බර් මස 24 වැනි දින ප.ව. 1.00 ට හෝ ඊට පෙර තම ආයතනය පිළිබද කෙටි හැඳින්වීමක් සහ සුදුසුකම් පිලිබඳව සාරාංශයක් සමග ස්වකීය කැමැත්ත ප්‍රකාශ කිරීමේ ලිපි (EOI) ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතන sponsorship@srilankacricket.lk විද්‍යුත් තැපැල් ලිපිනය වෙත එවන මෙන් ඇරයුම් කරණු ලැබේ. මෙම කැමැත්ත ප්‍රකාශ කිරීම සම්බන්ධව වැඩිදුර තොරතුරු අපේක්ෂා කරන්නේ නම් ජංගම දුරකථන අංක 0764-127253 ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතන වෙළඳ කළමනාකරු ඇමැතීමෙන් ලබාගත හැක.

උක්ත මාතෘකාගත කාරණය සම්බන්ධයෙන් කැමැත්ත ප්‍රකාශ කිරීම පිළිබඳ වූ ලිපි (EOI) ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් හට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ අවශ්‍යතා හා මාර්ගෝපදේශ සම්බන්ධව සවිස්තරාත්මකව සඳහන් කර ඇති යෝජනාවකින් (RFP) දැනුම් දෙනු ලැබේ.

සැලකිය යුතුයි,

- ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය සහ අයදුම්කරුවෙකු අවසාන හා බන්ධිත ගිවිසුමකට ඇතුළත් වන තුරු ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය හා යම් අයදුම්කරුවෙකු අතර යම් බන්ධිත ගිවිසුමක් නිර්මාණය වන බව හෝ ඒ සඳහා අයිතියක් පැන නගින බවට මෙම ඇරයුම වටහා නොගත යුතුය.
- මත්පැන් හා සම්බන්ධ සමාගම් (ආදේශිත හෝ ආදේශිත නොවන) කැමැත්ත ප්‍රකාශ කිරීමේ ක්‍රියාවලියට සහභාගිවීමේ අවස්ථාවක් නොමැත.

කිසිදු හේතුවක් ඉදිරිපත් නොකර, ඕනෑම වේලාවක උනන්දුව ප්‍රකාශ කිරීම සඳහා වන මෙම ආරාධනය (EOI) ස්වකීය අභිමතය පරිදි අවලංගු කිරීමට, සංශෝධනය කිරීමට හෝ වෙනස් කිරීමට පූර්ණ අයිතිය ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය සතු වේ.

**ප්‍රධාන විධායක නිලධාරී**
**ශ්‍රී ලංකා ක්‍රිකට්**

1 TEAM 1 NATION
Sri Lanka Cricket

## ‘ශ්‍රී ලංකා ක්‍රිකට් Pace Ace - 2020’ වැඩසටහනට රූපවාහිනී / ගුවන්විදුලි මාධ්‍ය අනුග්‍රාහකත්වය සඳහා කැමැත්ත ප්‍රකාශ කිරීම (EOI)

ගෝලීය වශයෙන් පිලිගැනීමක් ලබා ඇති ජාත්‍යන්තර සන්නාමයක් වන ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය, අනාගතයේදී ජාතික කණ්ඩායම නියෝජනය කිරීමට හැකියාවෙන් හෙබි එහෙත් සිය හැකියාව ජාතික මට්ටමින් ඉදිරිපත් කිරීමට අවස්ථාව නොලද වේග පන්දු යවන්නන් හඳුනා ගැනීම වෙනුවෙන් දිස්ත්‍රික්ක මට්ටමින් ‘Pace Ace - 2020’ නම් දක්ෂතා ගවේශන වැඩසටහනක් ආරම්භ කිරීමට සැලසුම් කර තිබේ. දිවයින පුරා විසිරී සිටින කුසලතාවයන්ගෙන් පිරි ක්‍රීඩකයින් සෙවීම වෙනුවෙන් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය සිදුකරගෙන යනු ලබන වැඩපිළිවෙළට සැලකිය යුතු දායකත්වයක් මෙමගින් ලැබෙනු ඇති බව ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ අපේක්ෂාවයි.

ඒ අනුව ‘ශ්‍රී ලංකා ක්‍රිකට් Pace Ace - 2020’ වැඩසටහන සඳහා ප්‍රචාරණ සහ ප්‍රවර්ධන කටයුතු සිදුකරමින් මහජනතාව දැනුවත් කිරීමට රූපවාහිනී වැඩසටහන් මාලාවක් නිෂ්පාදනය කොට විකාශනය කිරීම සඳහා රූපවාහිනී සහ ගුවන්විදුලි මාධ්‍ය අනුග්‍රාහකයින් ලෙසින් කටයුතු කිරීමට උනන්දුවක් දක්වන මෙරට කීර්තිමත් රූපවාහිනී / ගුවන් විදුලි මාධ්‍ය ආයතන වලට ඒ සඳහා ඉදිරිපත් වන ලෙස ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය ආරාධනා කර සිටියි. ශ්‍රී ලංකා ක්‍රිකට් සමඟ අත්වැල් බැඳගනු ලබන ලංසුකරු / අනුග්‍රාහකයාට දිවයින පුරා සිය වෙළෙඳ නාමය ප්‍රචාරණය කරගැනීම සඳහා වූ වාණිජම අවස්ථාවක් නිර්මාණය වනු ඇත.

මේ සඳහා උනන්දුවක් දක්වන ආයතන 2020 සැප්තැම්බර් මස 24 වැනි දින ප.ව. 1.00 ට හෝ ඊට පෙර තම ආයතනය පිළිබද කෙටි හැඳින්වීමක් සහ සුදුසුකම් පිලිබඳව සාරාංශයක් සමග ස්වකීය කැමැත්ත ප්‍රකාශ කිරීමේ ලිපි (EOI) ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතන sponsorship@srilankacricket.lk විද්‍යුත් තැපැල් ලිපිනය වෙත එවන මෙන් ඇරයුම් කරණු ලැබේ. මෙම කැමැත්ත ප්‍රකාශ කිරීම සම්බන්ධව වැඩිදුර තොරතුරු අපේක්ෂා කරන්නේ නම් ජංගම දුරකථන අංක 0764-127253 ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතන වෙළඳ කළමනාකරු ඇමැතීමෙන් ලබාගත හැක.

උක්ත මාතෘකාගත කාරණය සම්බන්ධයෙන් කැමැත්ත ප්‍රකාශ කිරීම පිළිබඳ වූ ලිපි (EOI) ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් හට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ අවශ්‍යතා හා මාර්ගෝපදේශ සම්බන්ධව සවිස්තරාත්මකව සඳහන් කර ඇති යෝජනාවකින් (RFP) දැනුම් දෙනු ලැබේ.

සැලකිය යුතුයි,

- ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය සහ අයදුම්කරුවෙකු අවසාන හා බන්ධිත ගිවිසුමකට ඇතුළත් වන තුරු ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය හා යම් අයදුම්කරුවෙකු අතර යම් බන්ධිත ගිවිසුමක් නිර්මාණය වන බව හෝ ඒ සඳහා අයිතියක් පැන නගින බවට මෙම ඇරයුම වටහා නොගත යුතුය.
- මත්පැන් හා සම්බන්ධ සමාගම් (ආදේශිත හෝ ආදේශිත නොවන) කැමැත්ත ප්‍රකාශ කිරීමේ ක්‍රියාවලියට සහභාගිවීමේ අවස්ථාවක් නොමැත.

කිසිදු හේතුවක් ඉදිරිපත් නොකර, ඕනෑම වේලාවක උනන්දුව ප්‍රකාශ කිරීම සඳහා වන මෙම ආරාධනය (EOI) ස්වකීය අභිමතය පරිදි අවලංගු කිරීමට, සංශෝධනය කිරීමට හෝ වෙනස් කිරීමට පූර්ණ අයිතිය ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය සතු වේ.

**ප්‍රධාන විධායක නිලධාරී**
**ශ්‍රී ලංකා ක්‍රිකට්**

# අභිලාෂය ප්‍රකාශ කිරීම සඳහා ඉල්ලීමයි

## දේශීය ඖෂධ හා සුවතා සංචාරක සේවය සංවර්ධනය සඳහා පොදු - පෞද්ගලික හවුල්කාරීත්ව අවස්ථාවක් (PPP)

ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද ආයතනය (GWAI) යනු දේශීය වෛද්‍ය ආයතනය වන අතර, එය ජාතික විශ්වවිද්‍යාලයක් ලෙසට උත්ශ්‍රේණිගත කිරීමට කටයුතු කෙරෙන අතර, ඒ සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය හිමිව ඇත. ඒ අනුව, එම ආයතනය විසින්, ජාත්‍යන්තර සංචාරකයන්හට දේශීය වෛද්‍ය / සුවතා සේවා සැපයීම සඳහා, රජයේ ප්‍රතිපත්ති ප්‍රකාරව, තම අනාගත අධ්‍යයන වැඩසටහන් සමග දේශීය වෛද්‍ය / සුවතා සංචාරක කටයුතු සම්බන්ධව විවිධ විෂයයන් වෙත යොමුවීමට අදහස් කොට ඇත. විශ්වවිද්‍යාලයක් ලෙසට පරිවර්ථනය වීමේදී එහි ප්‍රධාන අරමුණු ලෙසට, අපනයන වෙළඳපොළ සඳහා දේශීය වෛද්‍ය නිෂ්පාදන සංවර්ධනය, අනාගත දේශීය වෙද වෛද්‍යවරු පුහුණුකිරීම හා සුවතා හා අධ්‍යාත්මික අධ්‍යාපනය සංවර්ධනය ඇතුළත් වේ.

ඒ අනුව, රජයේ අරමුණු අනුගාමීව, GWAI ආයතනය, සත්‍යවූ සේවා පරිසරයක් තුළ, වඩාත් වර්ධනයවූ ප්‍රායෝගික විවෘතභාවය සමග ඉදිරි වැඩසටහන් ව්‍යාප්ත කිරීමට අපේක්ෂා කරයි. අධ්‍යයන හා රාජකාරී පරිසරය එක්ව ගමන් කිරීම උදෙසා, GWAI ආයතනය විසින්, පොදු හා පෞද්ගලික හවුල්කාරීත්ව (PPP) ස්ථාපිත කිරීම සඳහා ආයෝජනය කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීමට පෞද්ගලික අංශයට ආරාධනා කරනු ලබයි. එම හවුල්කාරීත්වයට, අධ්‍යයන කටයුතු සඳහා භෞතික පහසුකම් සැපයීම සහ විශ්වවිද්‍යාලයට බඳවා ගනු ලබන 'Z' ලකුණු සඳහා ප්‍රායෝගික කාර්ය සඳහා අනාවරණය වීම ඇතුළත් වේ.

ඒ අනුව, GWAI ආයතනය විසින්, පොදු-පෞද්ගලික හවුල්කාරීත්ව සඳහා සලකා බැලීම සඳහා ජාත්‍යන්තර සංචාරක / ආයුර්වේද / සුවතා පහසුකම් සපයනු ලබන පෞද්ගලික අංශයේ ආයතන වෙතින්, පහත සඳහන් අවම තලයේ සුදුසුකම් සපුරාලීම අපේක්ෂා කරයි;

- ස්ථාපිත වූ ජාත්‍යන්තර සංචාරක වෙළඳපොළ පදනමක් සහිතව, ජාත්‍යන්තර සංචාරක කර්මාන්තයට සේවා සපයනු ලබන සමාගමක් / සංවිධානයක්.
- ජාත්‍යන්තර සංචාරකයින්, වසරකට (2016-2018) අවම වශයෙන් 300-500 සඳහා සේවා සපයා තිබීම.
- දැනට, අවම වශයෙන් කාමර 100 මෙහෙයුම් කටයුතු කිරීම හෝ දේශීය වෛද්‍ය / සුවතා සංචාරක සේවය සඳහා රුපියල් මිලියන 300 ක නේවාසික ආයෝජන සතුවීම.
- දැනට, ව්‍යාපාර ලියාපදිංචිය (BR), ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියෙහි (SLTDA) ලියාපදිංචිය හෝ සංචාරකයන් සඳහා ආයුර්වේද / සුවතා පහසුකම් සැපයීම සඳහා අවශ්‍ය වෙනත් බලපත්‍ර හිමි අයවලුන් (සහතිකවල පිටපත් අමුණා තිබිය යුතුය.)
- GWAI ආයතනය සමග, PPP හවුල්කාරීත්වය යටතේ අවම වශයෙන් වසර 15-20 ක් හෝ ඊට වැඩි කාලයක්, වසර 2021 න් ඉදිරියට කටයුතු කිරීම සඳහා ගිවිසුමකට එළඹිය යුතුය.

**අදාළ යෝජනා** (EOI) සඳහා සමාගමේ / සමූහයේ ආයතනික විස්තර, අනුබද්ධ ආයතන හා සහෝදර සමාගම් සහ වෙනත් දේශීය වෛද්‍ය / ආයුර්වේද / සුවතා සංචාරක සේවයට හා එහි මෙහෙයුම් කටයුතුවලට සම්බන්ධ මූලාරම්භයන් ඇතුළත් වේ. පහත සඳහන් ආයතනික A, B, C, D අංශ, අදාළ යෝජනාවේ දෙවන කොටස වේ. ඇගයුම් පහසුතාවය සඳහා එම අනුපිළිවෙලට ප්‍රමුඛතාවය හිමිවේ. වෙනත් අමතර අදාළ හා සහාය තොරතුරු හා යෝජනා, අභිලාෂය ප්‍රකාශ කිරීම් සමග අමුණා ඉදිරිපත් කළ හැක. එසේම, EOI යෝජනා සඳහා ඇමුණුම්වල විස්තරයක් සහිත සමාගමේ නිල ලිපියක ආවරණ සටහනක් ලෙස අධ්‍යක්ෂ / GWAI යක්කල වෙත යොමු කළ යුතුය.

**A. හවුල්කාරීත්වය සඳහා ගෙබිම ඉඩකඩ හා පහසුකම් ලබාදිය හැකි වීම / හවුලේ භාවිතය / පැවතීම (අපේක්ෂිත අවම අවශ්‍යතා හා හැකියාවන්)**

A1 - පරිපාලන (කාර්යාලය) ව. අඩි 200-350 හෝ වැඩි.

A2 - අධ්‍යයන කාර්ය (පංති) ව. අඩි. 900-1,100 හෝ වැඩි.

A3 - පොදු පහසුකම් සඳහා ඉඩකඩ (පුස්තකාලය, අධ්‍යයන ප්‍රදේශය, පොදු සේදුම්කාමර ආදිය)

A4 - ශිෂ්‍ය නවාතැන් - අවම පුද්ගලයන් 60 ක් සඳහා (ස්ත්‍රී / පුරුෂ) හා ඔවුන්ගේ පොදු අවශ්‍යතා

A5 - විද්‍යාර්ථීන් සඳහා නවාතැන්

A6 - ඉගෙනුම ලබන අතරවාරයේ, සිසුන්හට කර්මාන්තයේ අනාවරණය සඳහා කටයුතු සූදානම් කිරීම (ශිෂ්‍යයන් ගණන)

A7 - අවසන් වසරේ සිසුන්හට ලබාදිය හැකි සීමාවාසිකත්ව අවස්ථා (උපරිම) - (සිසුන් ගණන)

A8 - සන්නිවේදන යටිතල පහසුකම් හා චංචල වත්කම් (එනම් ගෘහභාණ්ඩ මෝටර් රථ ආදිය) හවුල් භාවිතයට ඇති හැකියාව.

A9 - වෙනත් පවිත්‍රතා කටයුතු, බැහැර කිරීම හා ආරක්ෂක අවශ්‍යතා සම්බන්ධ පහසුකම් හවුලේ භාවිතය / කුලියට සැපයීමට ඇති හැකියාව.

**B. ආයෝජකගේ දැනට පවත්නා ධාරිතා තක්සේරුව -**

දේශීය වෛද්‍ය / ආයුර්වේද සත්කාරක හා සුවතා සංචාරක සේවය සඳහා පවත්නා සියලුම පහසුකම්.

B1 - සංචාරකයන් හා ඔවුන්ගේ නැවතුම් ස්ථාන සඳහා (විවිධ ස්ථානවල පිහිටා ඇත්නම්) ක්‍රියාත්මකව පවත්නා ආගන්තුක කාමර ගණන.

B2 - සංචාරකයන් සඳහා සැපයෙන ප්‍රතිකාර පහසුකම් වර්ග හා ප්‍රමාණයන් (පහසුකම්, ධාරිතාවයන් හා ස්ථාන)

B3 - නේවාසික ප්‍රතිකාර සඳහා තමන්ගේම ඖෂධ නිෂ්පාදන / පිළියෙල කිරීම් හා ඖෂධ ඔසු පැවතීම.

B4 - අලෙවිය හා අපනයනය සඳහා තමන්ගේම ඖෂධ නිෂ්පාදනය / පිළියෙල කිරීම හා ඖෂධ ඔසු පැවතීම.

B5 - 2018 වසර අවසාන වන විට සමාගමේ / සමූහයේ මුළු ආයෝජන වටිනාකම.

B6 - B2 හි සඳහන් පරිදි 2016, 2017, 2018 වර්ෂවල නවාතැන් හා ප්‍රතිකාර සැපයීම සඳහා පවත්වාගත් පදිංචි කාලයේ සමාන්‍යය.

B7 - 2018 වසර අවසානයේ සිටි සේවක සංඛ්‍යාව

(i) කළමනාකරුවන් (ii) කළමනාකරු නොවන (iii) කොන්ත්‍රාත් පුහුණුකරුවන් / සීමාවාසික අය.

**C. විදේශ සිසුන් බඳවා ගැනීම් ඇතුළත්ව, A1 - A7 හි සඳහන් පහසුකම් ව්‍යාප්ත කිරීමට ඇති හැකියාව.**

(2023 සිට ඉදිරියට - පියවර II)

C1 - එම ස්ථානයම (ස්ථානය හා පහසුකම්)

C2 - ආදේශක ස්ථානයක් වෙතොත් (ස්ථානය හා පහසුකම්)

**D. ඔබගේ යෝජනාව පිළිගතහොත්, විශේෂ සළකාබැලීම් / යෝජනා (ඇතොත්)**

D1 - කොන්දේසි

D2 - නියමයන්

D3 - මාර්ගෝපදේශ හෝ ප්‍රතිපත්ති

D4 - PPP හවුල්කාරීත්වයට අදාළ හා ප්‍රයෝජනවත්, එයට සම්බන්ධකළ හැකි වෙනත් පහසුකම්.

D5 - උපාධිධාරීන් නොවන අය, පශ්චාත් උපාධිධරයන් හා කර්මාන්තයේ ප්‍රායෝගිකව යෙදෙන්නන් සඳහා පාඨමාලා / වැඩසටහන් පිළිබඳ අදහස් / යෝජනා.

**සටහන :** වෙන් වශයෙන් කවරවල බහාලූ **මූල්‍ය යෝජනා,** ප්‍රධාන යෝජනාව (EOI) සමග ඉදිරිපත් කළ යුතුය. (ගාස්තු හා වෙනත් අයකිරීම් / ගාස්තු හෝ පිරිවැය කොටස ආදිය රහිතව හවුල්කාරිත්ව වත්කම් වෙනම පෙන්විය යුතුය)

තෝරාගැනීම, A, B, C හා D කොටස්වල තොරතුරු, ආකර්ෂණීය සංකල්ප හා අනාගත වන්දි සහිතව සහයෝගීතාව සඳහා එකඟතාවය මත තරඟකාරී පදනමින් සිදු කෙරේ. මූල්‍ය යෝජනා සලකා බලනු ලබන්නේ කෙටි ලැයිස්තුගත යෝජනා සඳහා පමණි.

- ලබාදෙනු ලබන තොරතුරුවල රහස්‍යභාවය සුරැකීම සහතික වන අතර, PPP තෝරාගැනීම් ක්‍රමවේදය සඳහා පමණක් භාවිතා කෙරෙනු ඇත.
- GWAI ආයතනය / දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය, තෝරාගනු ලබන අයදුම්කරුවන් සමග පමණක් සන්නිවේදනය කරනු ඇත.
- පොදු පූර්ව - EOI/ හමුව, යක්කල දී (GWAI), **2020 ඔක්තෝබර් 01** වන දින **පෙරවරු 10.30** ට පැවැත්වීමට කටයුතු සලසා ගත හැක.
- අභිලාෂය ප්‍රකාශ කිරීම් තෝරා ගැනීම හා එහි PPP ආයතනයේ කොන්දේසි සම්බන්ධව වන අවසන් තීරණය පිළිබඳ අයිතිය GWAI ආයතනය / විශ්වවිද්‍යාලය සතුවේ.

අදාළ යෝජනා, **2020 ඔක්තෝබර් 09** වන දින **පස්වරු 2.30** ට පෙර, යක්කල, නුවර පාරේ, GWA1 ආයතනයේ, සාමාන්‍ය පරිපාලන අංශයේ නියෝජ්‍ය ලේඛකාධිකාරී වෙත ලැබෙන්නට සැලැස්විය යුතුය.

ප්‍රමාදවී ලැබෙන යෝජනා හා අසම්පූර්ණ යෝජනා ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලැබෙන යෝජනා කෙටි ලැයිස්තුගත කිරීමේ අයිතිය GWAI ආයතනය සතුවේ. වැඩිදුර තොරතුරු සඳහා කරුණාකර, ශම්මික මහතා (දුරකථන - 0718036122, ඉමේල් - dulaksha.shammika@gmail.com) (රාජකාරී දිනවල පමණක්, පෙරවරු 8.30 හා පස්වරු 4.00 අතර කාලය තුළ) අමතන්න.

**නිසි බලධාරී**
**ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද ආයතනය,**
**යක්කල.**
**2020 සැප්තැම්බර් 19.**

■ ඩී ජේ දිසානායක - තිරප්පනේ සමූහ

# තිරප්පනේ ස්ථාන දෙකක නිදන් හාරයි

## පස් දෙනෙක් පොලිස් දැලේ

එකම දිනයක ස්ථාන දෙකක නිදන් හාරමින් සිටිය දී (13) සවස පුද්ගලයන් පස් දෙනකු අත්අඩංගුවට ගෙන ඇතැයි තිරප්පනේ පොලිසිය කියයි .

තිරප්පනේ පොලිස් බල ප්‍රදේශයට අයත් ගල්කුලම කරුවලගස්වැව හා නාච්චාදූව කුනිස්සන්ගල රක්ෂිතයේ පුද්ගලයන් කීපදෙනකු විසින් (13) දිනයේ නිදන් හාරමින් සිටින බවට ලද තොරතුරකට අනුව සිදු කරන ලද වැටලීම් දෙකකදී නිදන් හාරමින් සිටි මෙම සැකකරුවන් පස්දෙනා නිදන් හෑරීමට භාවිතා කළ උපකරණ ද සමඟ පෙරේදා (13) සවස තිරප්පනේ පොලිසිය මගින් අත්අඩංගුවට ගෙන ඇත .

ගල්කුලම මිහින්තලා පාර කරුවලගස්වැව නිවෙසක් පිටුපස කැලෑබද ප්‍රදේශයක නිදන් හාරන බවට 119 හදිසි දුරකථන අංකයට තිරප්පනේ පොලිසිය වෙත තොරතුරක් ලැබී තිබේ.

පසුව තිරප්පනේ පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ආර්. එම්. අයි. බණ්ඩාර රත්නායක මහතාගේ මූලිකත්වයෙන් විශේෂ පොලිස් කණ්ඩායමක් විසින් එම ස්ථානයට ළඟා වනවිට අඩි 13 ගැඹුර කැනීම් වළක් හාරා නිදන් සොයමින් සිටි සැකකරුවන් දෙදෙනකු අත්අඩංගුවට ගෙන තිබේ. අත්අඩංගුවට ගත් සැකකරුවන් දෙදෙනා ගල්කුලම කරුවලගස්වැව ප්‍රදේශයේ පදිංචි කරුවෝ වෙති. එහි සිටි කපුමහතා යැයි කියන පුද්ගලයෙකු සමඟ තවත් අයකු පලාගොස් ඇත. පලාගිය සැකකරුවන් සෙවීම සඳහා පරීක්ෂණ ආරම්භ කොට ඇත.

ගල්තලා දෙකක් මැදිකොට මෙම කැනීම් වළ හාරා තිබේ. නිදන් හෑරීමට භාවිතා කළ ඉලෙක්ට්‍රොනික් හැමර් යන්ත්‍රයක් ,කිලෝ 12 ක බරැති කුළු ගෙඩියක් , ඉණිමගක් , අලවංගුවක්, යකඩ කටු, අඬුම්ටියක්, හා මීටර් 289 ක් පමණ දිගැති වයර් රෝලක් ඇතුළු තවත් උපකරණ කීපයක් ද පොලිස් අත්අඩංගුවට ගෙන තිබේ.

සැකකරුවන් විසින් නිදන් සොයා කැනීම් කළ මෙම ස්ථානය පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුත් ප්‍රදේශයක් ද යන්න තහවුරු කරගැනීම සඳහා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙන් වාර්තාවක් ලබාගැනීමට ද නියමිතව ඇත.

# ඔසුපැළ රෝපණය කිරීමේ වැඩසටහනක්



ශ්‍රී ලංකාවේ දේශීය ඖෂධ අවශ්‍යතාව සපුරාලීම සඳහා ඖෂධීය ශාඛ වගා ව්‍යාප්තිය හා සංරක්ෂණය වෙනුවෙන් ප්‍රජාව මෙහෙයවීමේ රජයේ වැඩසටහනට අනුව පේරාදෙණිය විශ්ව විද්‍යාල පරිශ්‍රයේ ඔසුපැළ රෝපණය කිරීමේ වැඩසටහනක් උපකුලපති මහචාර්ය උපුල් දිසානායක මහතාගේ ප්‍රධානත්වයෙන් පෙරේදා (17) සිදු කෙරිණි. සුදු හඳුන්, කප්පරවල්ලිය, සාදික්කා, මූනමල්, එනසල්, හීන් අරත්ත, ඉඟුරු, ඉඟුරු පියලි, තිත්පිලි යන දේශීය ඖෂධ පැළ උපකුලපතිවරයා ඇතුළු පිරිස විසින් රෝපණය කළ අවස්ථාව.

ඡායාරූපය - අසේල කුරුළුවංශ

දිනමිණ දසත - දස අත ම එක තැන

■ හැටන් මධ්‍යම විශේෂ

# හැටන්වල පුවක් මිල ඉහළට

හැටන් නගරයේ පුවක් මිල දැඩි ලෙස ඉහළ යෑමත් සමඟ බුලත් විටක මිලද ඉහළ යෑමෙන් වතු කම්කරුවන් ඇතුළු පිරිසක් විවිධ අපහසුතාවන්ට පත්ව සිටිති.

මේ වන විට හැටන් නගරයේ පුවක් ගෙඩියක මිල රුපියල් 20ත් 25ත් අතර මිලකට අලෙවි වන අතර ගොලෑ පුවක් යනුවෙන් හඳුන්වන කුඩා පුවක් ගෙඩියක්ද රුපියල් 15කට අලෙවි වන අතර බුලත් විටක මිලද රුපිල් 50ත් 60ත් දක්වා ඉහළ ගොස් ඇත.

මෙම තත්ත්වයන් පිළිබඳව අදහස් දක්වන ප්‍රදේශයේ වතු කම්කරුවන් ඇතුළු පිරිසක් පවසනුයේ පුවක් මිල මෙසේ ඉහළ යෑමෙන් තමන් විවිධ අපහසුතාවන්ට පත්ව ඇති බවත්ය.

වතුකරයේ තේ වතුවල සේවය කිරීමේදි තමන් බුලත් විට වැඩියෙන් කෑම සිදු කරන බවත් එම තත්ත්වයන් මත පුවක් මිල ඉහළ යෑමෙන් තමන් දැඩි දුෂ්කරතාවන්ට පත්ව ඇති බව වතු කම්කරුවන් පිරිසක් පැවසූහ.

■ ධමහානාම විතානගේ - මල්වාන සමූහ සුදත් පුබුදු කීර්ති - දෙල්ගොඩ සමූහ

# කලාකරුවන්ගේ සුහද හමුවක්



දිවයින පුරා කලා ක්ෂේත්‍රයේ නියැළී සිටින කලාකරුවන්ට හා කලාකාරිණියන්ට කලාවේ නියැළී සිටින තාක් කල් මෙන්ම ඉන්පසුවත් ඔවුනට අතදීම සඳහා පිහිටුවා ගන්නා ලද අපේ කලා සවිය නම් වූ සංවිධානය මගින් සංවිධාන කරනු ලැබූ කලාකරුවන්ගේ සුහද හමුවක් 16 වැනිදා පස්වරුවේ තලවතුගොඩ ග්‍රෑන්ඩ් මොනාච් උත්සව ශාලාවේ දී පවත්වන ලදී.

මෙම සුහද හමුවේදී අපේ කලා සවිය සංවිධානයේ සභාපති හා නිර්මාතෘ ප්‍රසන්න දිසානායක මහතා කතා කරමින් මෙසේ පැවසීය .

අපි මෙ සංවිධානය පිහිටුවා ගත්තේ කලාකරුවන්ට කලාවේ නියැළී සිටින තාක් කල් හා ඉන්පසුවත් ඔවුනට අත දෙන්නටයි .ඒ අනුව අපි කලාකරුවන්ට නොමිලේ රක්ෂණයක් ලබා දෙනවා. ඔවුන් සඳහා බැංකු ගිණුම් විවෘත කර දෙනවා. කලා ගම්මානයක් නිර්මාණය කරනවා. වියපත් කලාකරුවන් රැකබලා ගැනීමෙ මධ්‍යස්ථානයක් ආරම්භ කරනවා. ජ්‍යෙෂ්ඨ කලාකරුවන් සඳහා අරමුදලක් පිහිටුවනවා. කලාකරුවන් පුහුණු කිරීමේ ආයතනයක් පිහිටුවනවා. ඔවුන්ගේ දරුවන් සඳහා ශිෂ්‍යත්ව ප්‍රදානය කරනවා. ඉතින් මෙ ආකාරයට කලාකරුවන් වෙනුවෙන් අපි විශාල වැඩ කොටසක් ඉටු කරන්නට සැලසුම් කර තිබෙනවා. ඒ නිසා සියලුම කලාකරුවන් මේ අපේ කලා සවිය වටා ඒකරාශී වන ලෙසට අපි ආරාධනා කරනවා.

මෙම සංවිධානයේ ලේකම් බිමල් සමන්ත කොඩිකා, ප්‍රධාන සංවිධායක කසුන් විදුශංක පෙරේරා, අනුශාසක ප්‍රවීණ රංගන ශිල්පී මහේන්ද්‍ර පෙරේරා, ප්‍රවීණ රංගන ශිල්පිනී අනෝජා බිබිලේ, කලාශූරී අසංක පෙරේරා හා 306 බී 2 සිංහ දිස්ත්‍රික් පළමුවන උප සිංහාධිපති කෞශල්‍ය රාජපක්ෂ යන මහත්ම මහත්මීන් ඇතුළු කලාකරුවෝ කීප දෙනෙක්ම කථා කළහ.

මෙම සුහද හමුවට පැමිණි සිටි කලාකරුවන්ට සාමාජික පත් සමඟ සිහිවටනයක් ලෙස පලතුරු පැළ ප්‍රදානය කෙරිණි.

■ ඡායාරූපය - හල්දුම්මුල්ල සමූහ සිරිල් සෙනෙවිරත්න

# උපාධිධාරී රැකියාලාභීන්ට පුහුණු වැඩසටහන්



උපාධිධාරීන් 60කට හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ට උපාධිධාරී රැකියා පත්වීම් ලැබී ඇති අතර, ඔවුන් සඳහා මේ දිනවල පුහුණු වැඩ සටහන් හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් සුනෙත් ජිනේද්‍රසේන මහතා ගේ මග පෙන්වීම යටතේ සිදුකර ගෙන යයි.

ඒ අනුව ළමා හිමිකම් සංවර්ධන නිලධාරිනි නිලාණි චන්ද්‍රිකා, වනිතා සංවර්ධන නිලධාරිනි මංජුලා සෙනෙවිරත්න මහත්මීන් විසින් ළමා හිමිකම් සහ කාන්තා හිමිකම් පිළිබඳව උපාධි රැකියාලාභීන්ගෙන් කොටසක් දින දැනුවත් කළ අයුරු.

■ දෙමෝදර සමූහ

# පදික මාරුවේදී දැරිය යට කර යතුරුපැදි සැරයන් පැනලා

## සැකකරු පොලීසියේ පස්ස දොරෙන් ඇතුළු වී ඉස්සරහ දොරෙන් මාරු වෙලා

බදුල්ල පොලීසිය අසල පදික මාරුවකදී, දොළොස් හැවිරිදි දැරියක් තම වාහනයට යට වීමෙන් පසු සැකකරු දිව ගොස් පලා යෑමේ පුවතක් පිළිබඳව පොලිසියෙන් වාර්තාවේ. පසුව කරන ලද පරීක්ෂණවලදී, අදාළ යතුරුපැදිකරු පොලිස් සැරයන්වරයකු බව හෙළිවී තිබේ.

අදාළ සැකකරු තම යතුරුපැදිය ධාවනය කර පැමිණිමේදී, මෙම දැරිය අනතුරට පත්ව ඇත. කලබලයට පත් වූ සැකකරු පැන යෑමට තැත්කරද්දී. අවට පිරිසක් විසින් ඔහු අල්ලා ගැනීමට උත්සාහ ගෙන තිබූ අතර, පොලීසිය පිටුපස දොරටුවකින් ඇතුළු වී, පොලීසිය ඉදිරිපස දොරටුවකින් පැන ගොස් තිබේ. පසුව මොහු නිවාඩු ලබා සිටි සැරයන්වරයකු බව අනාවරණය වී තිබේ.

බදුල්ල දිසාවේ නියෝජ්‍ය පොලිස්පති අසංග කරවිට මහතාගේ නියෝගයක් පරිදි බදුල්ල මූලස්ථාන පොලිසියේ රථ වාහන අංශයභාර නිලධාරීන් විසින් මොහු පොලිස් අත්අඩංගුවට ගෙන තිබේ. අනතුරක් වළක්වා ගැනීමට කටයුතු නොකිරීම,බීමත්ව රිය පැදවීම, අනතුරක් සිදු කොට පලා යෑම ආදී වරදවල් යටතේ සැකකරු අධිකරණයට ඉදිරිපත් කරන ලදී. බදුල්ල ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී වසන්ත කන්දේවත්ත සහකාර, පොලිස් අධිකාරී ප්‍රදීප් වීරසේකර මහත්වරුන්ගේ අධීක්ෂණය සහ මෙහෙයවීම යටතේ බදුල්ල පොලිසිය වැඩිදුර පරීක්ෂණ පවත්වාගෙන යයි.

■ ප්‍රසන්න පත්මසිරි - ඌව පළාත් සමූහ



# පාසල් ගේට්ටුව අසලට පිඹුරෙක් ඇවිත්

ලුණුගල ජනතාපුර පාසල් ගේට්ටුව අසලට 16 දින රාත්‍රි පැමිණ සිටි විශාල පිඹුරකු අල්ලා වන ජීවියට භාරදුන් බව පොලිසිය කියයි.

රාත්‍රිකාලයේ පාසල අසල සිටි සතා දැක බලා ගැනීමට ගම්මානයේම ජනතාව පැමිණ සිටි බවත් පිඹුරා අඩි දහයක දිගකින් හා කිලෝ 25ක බරකින් යුත්ත වන බව ගම්වාසීහු කියති.

වනයේ සිට ගම්මානයට පැමිණ සිටි පිඹුරා ගම්මානයේ සුනඛයන්, බළලුන්, කුකුළන් ඇතුළු සතුන් ආහාරයට ගෙන තිබෙන බව ගම්වාසීහු පැවසූහ.

■ ඌව පළාත් සමූහ - ප්‍රසන්න පත්මසිරි

# ඌව පළාත් කළමනාකරණ සේවා නිලධාරී සංගමයේ නිල වෙබ් අඩවිය එළිදක්වයි





ඌව පළාත් කළමනාකරණ සේවා නිලධාරි සංගමයේ නිල වෙබ් අඩවිය එළිදැක්වීමේ උත්සවය ඌව පළාත් ආණ්ඩුකාරවර ඒ.ජේ.එම්. මුසම්මිල් මහතාගේ ප්‍රධානත්වයෙන් 16 පස්වරුවේ ඌව පළාත් සභා ශ්‍රවණාගාරයේදී සිදු විය.

ඌව පළාත් රාජ්‍ය සේවයේ කාර්යාල මට්ටමින් කාර්යක්ෂම හා ප්‍රමුඛ සේවයක් ඉටුකරන කළමනාකරණ සේවා නිලධාරින්ට තමන්ගේ දැනුම, කුසලතාවය වර්ධනය කර ගැනීම හා නවීන තොරතුරු දැනගැනීම ප්‍රවර්ධනය කිරීම සඳහා වෙබ් අඩවිය ආරම්භ කර ඇත.

ඌව පළාත් කළමනාකරණ සේවා නිලධාරි සංගමයේ විසින් සංවිධාන කළ මෙම අවස්ථාවට ඌව පළාත් ප්‍රධාන ලේකම් පී.බී. විජේරත්න,ආණ්ඩුකාර ලේකම් සන්ධ්‍යා අඹන්වල මහත්මිය ඇතුළු කළමනාකරණ සේවා නිලධාරීහු පිරිසක් එක්වූහ.

■ ගාමිණී බණ්ඩාර ඉලංගන්තිලක - මස්කෙළිය සමූහ

# මාවුස්සාකැලේ ජල මට්ටම ඉහළට

මධ්‍යම කඳුකරයේ ජල විදුලි බලාගාර ජල පෝෂක ප්‍රදේශ වලට මාසයකට වැඩි කාලයක් තිස්සේ ඇද හැලෙන අධික වර්ෂාවත් සමග මාවුස්සාකැලේ හා කාසල්රී යන ජලාශ දෙකේ ජල මට්ටම පිටාර මට්ටමට ආසන්න වෙමින් පවතී.

පවතින අධික වර්ෂාවත් සමග මාවුස්සාකැලේ හා කාසල්රී යන ජලාශ දෙකේ ජල මට්ටම 16 දා පෙ.ව.06.00 වන විට පිටාර මට්ටමට පැමිණීමට පිළිවෙළින් අඩි 16ක් හා 08ක් වශයෙන් පැවති බව එම ජලාශ බාර ඉංජිනේරුවෝ පැවසූහ.

ජාතික ජල විදුලි බල පද්ධතියට අයත්, ලක්ෂපාන ජල විදුලි බලාගාර සංකීර්ණයයටතේ ඇති ලක්ෂපාන, නව ලක්ෂපාන, කැනියෝන්, විමලසුරේන්ද්‍ර හා පොල්පිටිය යන ජලවිදුලි බලාගාර 05 සඳහා ප්‍රධාන වශයෙන් ජලය සැපයෙන්නේ මාවුස්සාකැලේ හා කාසල්රී යන ජලාශ දෙකෙනි.

■ බී.එම්.විජේසූරිය -අනුරාධපුර මධ්‍යම විශේෂ

# බිල්පත් නොමැතිව රැගෙන ගිය ජංගම දුරකතන 63ක් පොලිස් බාරයට

මත්ද්‍රව්‍ය වෙනත් නීතිවිරෝධි ජාවාරම් හා අපරාධ වැළැක්වීමේ අරමුණින් හොරොව්පොතාන පොලිසියේ ස්ථානාධිපතිවරයා ඇතුළු නිලධාරින් හැත්තෑ පස් දෙනකු එක්ව සිදුකළ විශේෂ මෙහෙයුමකදී බිල්පත් නොමැතිව රැගෙන ගිය රුපියල් ලක්ෂ ගණනක් වටිනා ජංගම දුරකථන 63ක් පොලිස් බාරයට ගැනීමට නිලධාරීන්ට (16 දා) හැකි වී තිබේ.

හොරොව්පොතාන වව්නියාව ප්‍රධාන මාර්ගය හොරොව්පොතාන කපුගොල්ලෑව ප්‍රධාන මාර් ගය හා හෙරොව්පොතාන ත්‍රිකුණාමලය ප්‍රධාන මාර්ගය ආවරණය වන අන්දමින් විශේෂ මෙහෙයුම පැය දෙකක කාලයක් සිදු කර තිබුණි. එක් මාර්ගයකට නිලධාරින් 25 දෙනකු බැගින් නිලධාරින් 75 දෙනකු ඊට සහභාගිව සිටියහ.

මෙම විශේෂ මෙහෙයුමේදී පුද්ගලයන් 108 දෙනකු සමග රථවාහන 228ක් පොලිස් පරීක්ෂාවට ලක්වී තිබූ අතර බලපත්‍ර නොමැතිව හා බලපත්‍ර කොන්දේසි උල්ලංගණය කරමින් රිය පැදවූ පුද්ගලයන් 11දෙනකු පොලිස් අත්අඩංගුවට ගෙන තිබුණි.ඊට අමතරව සිය අනන්‍යතාව ඔප්පු කිරීමට නොහැකිවූ පුද්ගලයකු පොලිසිය සැකපිට අත්අඩංගුවට ගෙන තිබිණි.

■ එන්.විජේරත්න - නාගොඩ විශේෂ

# කළුතර නගර සභා බල ප්‍රදේශයේ සියලු මාර්ග සංවර්ධනයට කටයුතු කරනවා

## විපක්ෂ නායක ප්‍රදීප් කරුණාමුනි (ශ්‍රී.ල.පො.පෙ)

**සභාපති - එම්.අමීර් නසීර් මහතා (එ.ජා.ප)**

කළුතර කලීල් පෙදෙසේ සායනයේ කටයුතු ආරම්භ කළා. එමෙන්ම කළුතර උද්‍යානය තුළ හරිත ගොඩනැගිල්ලෙහි කායවර්ධන මධ්‍යස්ථානය සම්බන්ධයෙන් ද කටයුතු කරගෙන යනවා. එය ටෙන්ඩර් මඟින් හොඳ ආයතනයකට ලබා දීමටත් කටයුතු කරනවා.

**සුකුමාල් පෙරේරා මහතා (ශ්‍රී.ල.පො.පෙ)** වෙනත් ආයතනයකට අයත්නම් සභා අරමුදල් වියදම් කිරීමේ ප්‍රශ්නයක් තියෙනවා. ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ආණ්ඩුවක් තියෙන්නෙ.

ක්‍රීඩා ඇමැතිතුමා මේ ගැන කතා කළ යුතුයි. වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයිති ඉඩමකට නගර සභා අරමුදල් වියදම් කළ හැකිද?

**විපක්ෂ නායක ප්‍රදීප් කරුණාමුණි මහතා (ශ්‍රී.ල.පො.පෙ)**

යෝජනා ගේනවා. එක එක්කෙනා සතුටු කරන්න. බීච් වොලිබෝල් ක්‍රීඩා කළුතර උතුරෙත් තිබුණා.

තිබෙන ක්‍රීඩාංගණ සංවර්ධනය කළ යුතුයි. කළුතර උතුරේ ක්‍රීඩාංගණයත් සංවර්ධනය කිරීමට කටයුතු කරන්න.

**ඒ.පාලිත සිල්වා මහතා (ශ්‍රී.ලං.නි.ප)**

මේ යෝජනාව අසම්පූර්ණ යෝජනාවක්. ක්‍රීඩා වැඩි දියුණු කිරීම සඳහා ක්‍රීඩා සමාජවලට සහාය ලබා දිය යුතුයි. නෛතික ප්‍රතිපාදනවලින් ඔබ්බට ගිහින් ක්‍රියා කිරීමේ හැකියාවක් නැහැ. මේ යෝජනාව විධිමත් ආකාරයට ඉදිරිපත් වී නැහැ.

### කළුතර නගර සභාව

**සභාපති - එම්.අමීර් නසීර් මහතා (එ.ජා.ප)**

ක්‍රීඩා අමාත්‍යාංශය මඟින් බීච් වොලිබෝල් ක්‍රීඩාව සංවර්ධනය කර සභාවට භාර දෙනව නම් අපේ විරුද්ධත්වයක් නැහැ.

**සුරංග ද සොයිසා මහතා (එ.ජා.ප)**

නගර සභා ඉඩම් නිලධාරීන්ට දීල අද ඒවාට හොර ඔප්පු හදාගෙන ඉන්නෙ. අද ඒවා පෞද්ගලික බූදල් බවට පත් වෙලා.

මින් ඉදිරියට නගර සභා දේපළ පවරා දීමේදී දැඩිව විමසිලිමත් වීම වැදගත් වෙනවා.

**සන්ධ්‍යානි වීරතුංග මහත්මිය (පො.ජ.පෙ)**

ඉපැරැණි කළුතර නගර සභා ගොඩනැගිල්ල වෙනුවට නව ගොඩනැගිල්ලක් ඉදි කිරීමට කටයුතු කරන්න. ඒ සඳහා අපේ සහයෝගය දෙනවා.

**විපක්ෂ නායක - ප්‍රදීප් කරුණාමුණි මහතා (ශ්‍රී.ල.පො.පෙ)**

ජනාධිපතිතුමාගේ සෞභාග්‍යයේ දැක්ම යටතේ සියලු මාර්ග සංවර්ධනය කිරීමට කටයුතු කරනවා. ඒ අනුව කළුතර නගර සභා බල ප්‍රදේශයේ සියලු මාර්ග සංවර්ධනය කිරීමට අපි කටයුතු කරනවා. පක්ෂ භේදයෙන් , ජාති භේදයෙන් තොරව එම කටයුතු සිදු වෙනවා.

**සන්ධ්‍යානි වීරතුංග මහත්මිය (පො. ජ.පෙ)**

කටුකුරුන්ද දුම්රියපළ පිටුපස රේල් පාරට සමාන්තර පාර මේ වන විට සංවර්ධනය කර ඇත. එම මාවත ගරු අර්නස්ට් පෝරුතොට මාවත ලෙස නම් කරන මෙන් මා යෝජනා කරනවා.

එම යෝජනාව සම්මත විය.

තරුණ අකුරු

හුස්ම ගන්න

අපේ

නවාතැන් පොළ


දිනමිණ

සදාකාලික පත්තර තාරුණ්‍යය

# යොවුන් ජනතා

2020 සැප්තැම්බර් 19 සෙනසුරාදා





පුරාණ සීගිරියේ ශ්‍රී විභූතිය පිළිබඳ සිතුමි සුධාර විසින් අඳින ලද සිතුවමකි.


පිටුව 03 අපේ වෑයම අනාගත පරපුර අස්වැද්දීමයි

පිටුව 04 අපම වනු පිණිස

පිටුව 08 ඒ ඇස්වල කිසිම වෛරයක් තිබ්බේ නෑ


යොවුන් ජනතා අප සියලු දෙනාගේ ආදරණීයම පුවත්පතයි. පතාක යෝධයන් රැසකට විසල් සෙවණක් සැදූ යොවුන් ජනතා නැවත ඇරඹෙන්නේ තවත් පරපුරැකක් වෙනුවෙන් යහ මඟ පෙන්වීම සඳහාය. ලියන අඳින අලුතින් සිතන සෑමදෙනකුටම යොවුන් ජනතා ඉඩ හැකි පමණ වෙන් වෙයි. ඕනෑම මාතෘකාවක් පිළිබඳ කරනු ලබන නිර්මාණ සඳහා මෙම පිටුවට ඉඩ වෙන් කර දීමට අපි නිරතුරුවම බලා සිටින්නෙමු.

ඒ නිසා එන්න, මේ පිටු අතර සැරිසරමු.
අපි ළෙන්ගතු අකුරු සමඟ අලුත් හුස්මක් ගනිමු.

yovunjanatha@lakehouse.lk

'යොවුන් ජනතා'
දිනමිණ
ලේක් හවුස්
අංක 35
ඩී.ආර්. විජයවර්ධන මාවත
කොළඹ 10.

# ප්‍රදීපස්තම්භය නිවී ගොස් සොළොස් වසරයි



**අද සැප්තැම්බර් 19 වන සෙනසුරාදා. 'යොවුන් ජනතා' නිර්මාතෘ මෙන්ම චිත්‍රපට නිර්මාණ ශිල්පියකු, ගීත රචකයකු හා ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදියකු වූ ධර්මසිරි ගමගේ මහතා අප අතරින් වියෝ වී අදට වසර 16කි. ලේක්හවුස් ආයතනය මගින් පළ කළ අතිශය ජනප්‍රියත්වයට පත් යොවුන් ජනතා, රසඳුන ප්‍රකාශනයන්හි ආරම්භක කතුවරයා ලෙසින් අලුත් පරපුරක් බිහි කරන්නට එතුමා කටයුතු කළේය. මේ සිහි කැඳවුම එතුමාගේ 16 වන ගුණානුස්මරණය වෙනුවෙනි.**

# ඉර - හඳ අව්ව - වැස්ස අප කාටත් පොදුයි

උදේට අහසේ ලස්සනට ඉර පායලා තියෙනවා, බලන්න ආසයි. ඒත් මොහොතකට ඒ ලස්සන අහසින් ඇස් ඉවතට අරගෙන බලන්න අහසින් එහා අපේ ලෝකය දිහා. සමහර ප්‍රබලයන්ට පමණක් ඉර පායලා. මොකද මේ වෙලා තියෙන්නේ? පීඩිත පංතිය තවමත් අඳුරේ. අප හැම කෙනාම මේ ලෝකේ ඉන්න මිනිස්සු. මේ ඉර, හඳ, අව්ව, වැස්ස, සතුට, වේදනාව අපි කාටත් පොදුයි.

ඒත් ඇයි අපේ මිනිසුන් අතර ඉන්න සමහර පිරිසක් දුක් විඳින්නේ. අපේ මේ පුංචි රටේ එක එක ජාතියේ මිනිස්සු ඉන්න එක ඇත්ත ඒත් ඒ මිනිස්සුන්ව label කරලා තියෙන විදිහ ගොඩක් කැතයි. වෙන කවුරුත් නෙමෙයි එහෙම කරලා තියෙන්නෙත් අපේම මිනිස්සු. තට්ටු දෙකේ ගෙවල්වල ඉන්න මිනිස්සු විතරද posh වෙන්නේ. අඟල් දෙකක කොට සායක් ඇඳලා බෙල්ල ගාවට වෙන්න tattoo එකක් ගහලා makeup තට්ටු ගණන් ඇගේ උලාගෙන hybrid car වල ගියාම posh වෙනවා කියලා හිතන් ඉන්න අයත් අපි අතරේ ගොඩක් ඉන්නවා.

මේ වගේ අය තමයි නැව ගිලුණත් බෑන් චුන් කියලා එයාලා ගැන විතරක් හිතලා time waste කරන්නේ. නෑ ඇත්තටම මේ කිසි දෙයක් ඕනෑ වෙන් නෑ posh වෙන්න. හොඳ හිතක් එක්කම මනුස්සකම තිබ්බ නම් ඇති. මේ අපි අතරේ ඉන්න තවත් එක්තරා කොටසක් විතරයි. සුළු පිරිසක් ඉතා සැහැල්ලුවෙන් ජීවත් වෙද්දි තවත් පිරිසක් ජීවිතේ ජීවත් කරවන්න හිඟා කනවා. ලෑලි ගෙවලවල ජීවත් වෙන මිනිස්සුට කියන්නේ මුඩුක්කු මිනිස්සු කියලා. එයාලගේ ගෙවල් එක ගාව තිබ්බා කියලා, ලෑලිවලින් හදලා තියෙන්නේ කියලා, කොහොමද මුඩුක්කු වෙන්නේ. ඒ ගෙවල්වල ජීවත් වෙන ළමයි කොහොමද හිඟන කොල්ලෝ කෙල්ලෝ වෙන්නේ. මේ වචන ටික මගේ නම් නෙමෙයි මේවා මේ සමාජගත කරපු වචන set එකක්. අපේ කන්වලට මේවා නුපුරුදු වචනත් නෙමෙයිනේ. අපි හැම කෙනාම මිනිස්සු. ඉතිං එයාලා මිනිස්සු නෙමෙයිද?ලස්සනට ඇඳුමක් අඳින්න සල්ලි නැති වෙන්න පුලුවන්. ඒත් ඒ මිනිස්සු ළඟ මනුස්සකම තියෙනවා. ඇත්තටම අපි ජීවත් වෙලා ඉන්නේ ටික කාලයයි. ඒ ටික කාලේ අපි මිනිස්සු එක්ක හිත හොඳින් ඉන්න ඕනා.

උදේ ඉඳන් හවස් වෙනකන් දුක් විඳලා සල්ලි හම්බුකරන්නේ අපි ජොලියට නෙමෙයි නේද? අපි අපේ ජීවිතේ ජීවත් කරවන්නනෙ එහෙම කරන්නේ. ලස්සනට කැරකෙන පුටුවක් උඩට වෙලා job නොකළට ගෙයක් ගෙයක් ගානේ ගිහින් කූලි වැඩක් කරලා හරි එයාලත් එයාලගේ පවුල් රැකගන්න උත්සාහ කරනවා.

ක්‍රම දෙකකට වුණත් මේ දෙගොල්ලොම කරන්නේ එකම දේ නෙමෙයිද? උගත්කම නැති හින්දම නෙමෙයි ඒ මිනිස්සු එහෙම කරන්නේ. සමාජේ විසින් එයාලට නිසි තැන දීලා නෑ. A/L, O/L ඉහළින්ම pass කරලා campus ගියා කියලා එයා උගතෙක් වෙන් නෑ. අද ගොඩක් මිනිස්සුන්ට වරදින තැනත් ඕකම තමයි. පොතේ දැනුම තිබුණට මදි සමාජේ පිළිබඳවත් දැනගෙන තියෙන්න ඕනෑ කියලා තමයි මම නම් හිතන්නේ. අද ගොඩක් ලොකු පුටුවල ඉඳගෙන ඉන්න අයගෙත් දියුණුව පිටිපස්සේ දුක හිතෙන කතන්දර නැත්තෙම නෑ. ඒත් සමහර අයට ලොකු තනතුරක් ලැබිලා, A/C Room එකක කැරකෙන පුටුවක ඉඳගෙන ඉන්නකොට ඇත්තටම එයාලට මුල අමතක වෙලා යනවා. ඒත් අපේ මිනිස්සු අතර එයාලා හරිම great කියලා හිතන් ඉන්න මිනිස්සු කොටසකුත් ඉන්නවනේ එයාලට නම් මේ ඇත්ත තිත්තයි. හැම අම්මෙක්ම තාත්තෙක්ම කැමති තමන්ගේ ළමයා සමාජේ හොඳ තැනකට එනවා දකින්න. ඉතින් මේ බලාපොරොත්තුව එදා වේල කන්න නැති හරියට අඳින්න ඇඳුමක් නැති කුණු දූවිලි නාගෙන තමන්ගේ ළමයි ගැන මහමෙරක් තරම් දේවල් හිතේ තියන් උගන්වන දුප්පත් අම්මා තාත්තටත් පොදුයි කියන එක අපි අමතක කරන්න නරකයි.

තට්ටු ගණන්වල ගෙවල් හදාගෙන අතට පයට servants ලා කොච්චර තියාගෙන හිටියත්, අලුත් අලුත් car වලින් රෑට dinner out ගියාට අර අපි අප්පිරියාවෙන් බලන මුඩුක්කු ගෙවල් වල තියෙන සතුට තරම් සතුටක් ඒ දේවල් වලින් ගන්න බෑ. ඇයි අපි අපේම අයව මෙහෙම හඳුන්වන්නේ? අපි අප්පිරිය වෙන්න ඕනෑ අපි ගැනමයි. අපිට බැහැ ලෝකයා හිතන විදිහ change කරන්න.. But අපට පුළුවන් අප හිතන විදිහ change කරන්න. බලන්න අපි මේ පාගලා පොඩි කරලා, විනාස කරන්න යන්නේ සමාජේ අපි වගේම තවත් කට්ටියක්. මෙයාලා සත්තු ජාතියක්වත් වෙනම ග්‍රහලෝකෙකින් ආපු අයවත් නෙමෙයි. අපි වගේම මේ ලෝකේ ජීවත් වෙන්න අයිතිය තියෙන මිනිස්සු. ඉතින් දැන්වත් අපි අපේ අයට නැගිටින්න උදව් කලොත් නරකද?? එහෙම වුණ දවසට මේ සමාජේ මුඩුක්කු මිනිස්සු posh මිනිස්සු නැති වෙලා ඔක්කොම මිනිස්සු වෙයි. එහෙම වුණොත් අර උදේට පායන ලස්සන ඉර අපි හැම කෙනාටම ලස්සනට පෙනෙයි. ඒ ලස්සන අපි හැම කෙනාටම පොදුවේ විඳගන්නත් පුළුවන් වෙයි.

අමන්දා හංසිනී



# අපේ වෑයම අනාගත පරපුර අස්වැද්දීමයි

## ජගත් වැල්ලවත්ත

**'පහන්ටැඹ සාමූහිකය' කැඳවුම්කරු**

**'පහන්ටැඹ සාමූහිකයේ' මූලික පරමාර්ථය වන්නේ දක්ෂතාවන්ගෙන් හෙබි නවක ලේඛක ලේඛිකාවන්ගේ හැකියාවන් ප්‍රවීණ සාහිත්‍යධරයන්ගේ දැනුම හා සම්බන්ධ කිරීමයි. එහි මූලික ඇරඹුම ලෙස සාහිත්‍ය මාසය මුල් කරගනිමින් මාතලේදී පවත්වනු ලබන සාහිත්‍ය වැඩසටහන නම් කළ හැකිය. මෙහිදී දින හතක් පුරා මෙම වැඩසටහන පැවැත්වෙන අතර සැප්තැම්බර් 26 වැනි දිනය මුළුල්ලේම සිදු කෙරෙන්නේ 'පහන්ටැඹ සාමූහිකයේ' ක්‍රියාකාරකම්ය. මෙහිදී යොවුන් පරපුරට මෙන්ම ළමා පරපුරට ද නැවුම් අත්දැකීම් ලබාදෙන චිත්‍ර ප්‍රදර්ශනයක් පැවැත්වීමට නියමිත අතර, ප්‍රවීණ සාහිත්‍යධරයන් කිහිපදෙනකුට සම්මාන පිරිනැමීමක් ද සිදු කරනු ලැබේ. 'පහන්ටැඹ සාමූහිකයේ' කැඳවුම්කරු ජගත් වැල්ලවත්ත මහතා සමඟ කළ සාකච්ඡාවකි.**

71 කැරැල්ලත් සමඟ සාහිත්‍යමය ලෙසින් ඉහල දැනුමක් තිබූ බොහෝ දෙනෙක් ජීවිතයෙන් සමු අරන් තිබුණා. මෙන්න මේ කියන අර්බුද අතරෙ තමයි ධර්මසිරි ගමගේ මහත්තයලා ඇතුළු කණ්ඩායම කවි බස හැදෑරූ, ඒ බස භාවිත කරන ලියන කියන පිරිසකුත් ඒ බස අවබෝධ කරගත හැකි පාඨක සමාජයකුත් බිහි කිරීමට මූලික වෙන්නෙ. ධර්මසිරි ගමගේ මහත්මයගේ නායකත්වයෙන් යොවුන් ජනතා කණ්ඩායමේ මූලික කාර්යභාරය වුණේ ඒක. නමුත් වර්තමානයේ කවි ලියන පිරිස් හිටියත් කවි බස තේරෙන අය නෑ. ඒක නිසා ලොකු පරතරයක් මේ දෙගොල්ල අතර තියෙනවා. ඒ කාලයේ මේ ගැටලුව පවතින විට තමයි ගමගේ මහත්තයලා මේකට සම්බන්ධවෙලා යොවුන් ජනතා තුළින් එය වෙනස් කරන්න මුල් වුණේ. එය තමයි සාහිත්‍ය කෙතට යොවුන් ජනතා ලබාදුන් හොඳම දේ. එයට සංස්කෘතික සාහිත්‍ය පැත්තෙන් ගත්තාම යොවුන් පහන් වැට නිර්මාණ කළා. කේන්ද්‍රයක් බිහිකර ගනු ලැබුවා.

මෙහෙම කාලයක් ගිහිල්ලා යුද්ධය ආවාට පසුව වුනත් ඕනම අයෙකුට හැකියාව තිබුණා. තමන්ගෙ නිර්මාණ කාර්යයන් සිදු කරගෙන යෑමට. නමුත් අපි පුරුදුවෙලා හිටියෙ රූපවාහිනිය ඉදිරියේ වාඩිවෙලා ඒක නරඹන්නත් ජංගම දුරකථනය සමඟ හුදෙකලා වන්නත් පමණයි. චිත්‍රපට බලන එක අතෑරුනා. නාට්‍ය බලන එක අතෑරුනා. පොතක් පතක් ගන්න යන එක නැති වුණා. මේ වගේ දේවල් හින්දා බොහෝ අය නිවසටම කොටු වුණා. බයත් එක්ක ජීවත් වෙන්න පටන්ගත්තා. බය විසින් අපේ නිර්මාණාත්මක හැකියාවන් සියල්ල වියළා දැමුවා. භෞතික වෙනස් වීම් සමඟම අපේ ජීවන ලීලාවේ ද වෙනස් වීම් සිදු වුණා. මෙහෙම කාලයක් යනකොට ගුවන්විදුලියේදී මට හමුවෙනවා හර්ෂ කරුණාරත්න, විමුක්ති කාරියවසම්. එහිදී ගීත සම්බන්ධයෙන් ආගිය කතාබහක් ඇති වුණා. එතැනදී මතුවෙලා ආවා දැන් තියෙන්නෙ හරි බොළඳ ගීත නේද කියන එක. ඒත් මම එතැනදී කිව්වා අලුත් පරපුර අපිට මුණ ගැහෙන්නෙ නෑ. ඔවුන් කවි, ගීත ආදිය දාන්නේ අන්තර්ජාලය මුල්කරගෙන මුහුණු පොතේ හා යූටියුබ් එකේ කියලා. මොකද ඒකට හේතුව වෙන්නේ ගීතයක් කරත් කොහේවත් දාගන්න වෙන්නෙ නෑ. තියෙන එකම මාධ්‍ය මේ දෙක විතරයි කියලා. ඔන්න එතැනදී අපි අතර යම් කිසි සංවාදයක් ගොඩ නැගුණා. ඊට පස්සෙ අපි බැලුවා කවි පොත් සම්බන්ධයෙන්. කවි පොත් මුද්‍රණයට ප්‍රකාශකයෙක් ඉදිරිපත් වෙන්නෙත් නෑ. මොකද විකිණෙන්නෙ නැති නිසා. ඒකට හේතුව මුලින් සඳහන් කරන විදියට කවි බස නොතේරීම. ඉතින් අපි එදා තීරණය කළා ධර්මසිරි ගමගේ මහතා කරපු වැඩත් මතක් කරලා මේ වැඩේ අපි යළිත් පටන්ගත යුතුයි කියලා. ඉතින් මේ වැඩේ පසුව සම්බන්ධීකරණය කළා. අපි හිතුවා එය වඩාත් පුළුල් පරාසයකින් සමාජගත කරන්න. අපි එය හැඳින්වූවේ "පහන් ටැඹ සාමූහිකය පාමුල ද එළිය කරන" කියලා. මේ සඳහා 25 දෙනෙක් ඉන්නවා. ඔවුන් තමයි මේකෙ භාරකාර මණ්ඩලය විදිහට කටයුතු කරන්නේ. සරලව කියනවා නම් නිලතල වලට වඩා නිල කටයුතුවලට තමයි සියලුම දෙනා මූලිකත්වය ලබා දෙන්නෙ. මේ තුළ විවිධ දේශපාලන පක්ෂවල අය ඉන්නවා. විවිධ සංවිධානවල අය ඉන්නවා. පහන් වැටේ සිටි අයත් ඉන්නවා. දේශපාලන පක්ෂ, ආගම, ජාතියෙන් තොරව තමයි අපි මේ කටයුත්ත සිදු කර ගෙන යන්නෙ. ඒක සාමූහිකයේ කටයුතුවල අදාළ නෑ. අපි කටයුතු කරන්නෙ පොදු අරමුණු වෙනුවෙන්.

අපි අතර තියෙන පොදු අරමුණුවලින් එකක් තමයි. නව යොවුන් ලේඛක, ලේඛිකාවන්ට අවශ්‍ය සාහිත්‍යයේ කවියේ බස උගන්වන එක. ඒ සඳහා තමයි අපි වැඩමුළු පවත්වන්නේ; නිර්මාණ තරග තියෙන්නේ සහ ඔවුන්ව දිරිගන්වනු ලබන්නේ. අනෙක් කාරණාව තමයි අපි ඔවුන්ට මුණගස්වනවා දැනට ඉන්න ප්‍රවීණයන්ව. වැඩමුළු පවත්වන අතරතුරදී මේ සමඟම අපේ නව වැඩසටහනක් තිබෙනවා 'නැණදැල' කියලා. මෙයින් සිදු වන්නේ ළමුන්ගේ සහ යෞවනයේ සිටින්නන්ගේ කියවීමේ පුරුද්ද සහ නිර්මාණකරණයේ පුරුද්ද ඇති කිරීම. ඇත්තෙන්ම කියනවා නම් මෙය පුස්තකාල ව්‍යාපෘතියක්. එය සිදු කරන්නේ පාසල් හා ගම්මාන මට්ටමින්. අපේ ඉලක්කය තමයි වසර දහයක් තුළදී පුස්තකාල 1000ක් ඉදිකිරීම. මේ මොහොතේ ඒ සඳහා අපිට ප්‍රතිපාදන නැතිවුණත් එය අපේ ඉලක්කයක්.

අනෙක් කාරණාව තමයි වර්තමානයේ ඉන්න ප්‍රවීණ ලේඛක ලේඛිකාවන් සම්බන්ධයෙන් ගෙන එන වැඩසටහන. එය අපි නම් කරලා තියෙන්නේ "මහායාය" කියලා. ඒ අයටත් යම් අර්බුදයක් තියෙනවා. මෙන්න මේවාට පිළිතුරක් විදියට අපි ආරම්භ කරන්න කටයුතු කරලා තියෙනවා 'පහන්ටැඹ ප්‍රකාශන'. අපේ ප්‍රකාශන මගින් අපි යෝජනා කරලා තියෙන්නේ ඔවුනට 25%ක කර්තෘ භාගයක් ගෙවන්න. මගේ අදහස නම් සාහිත්‍ය කලාව තියෙන්නෙ මුදලාලිලා බිහිකරන්න නෙවෙයි කියලා. මේ නිර්මාණකරුවන්ට නිර්මාණ කරන මහන්සියේ අයිතිය යා යුතුයි. අන්න ඒකයි වෙනත් ප්‍රකාශකවරු 5%ක කර්තෘ භාගයක් ගෙවනකොට අපි 25%ක කර්තෘ භාගයක් ගෙවන්න කටයුතු කරමින් ඉන්නෙ. ඉතිං මේවා අලෙවි විය යුතු නිසා මෙතෙක් කාලයක් පොත් විකිණීමේ ගැටලු මතුවුණු නිසාත් පෙර කී පුස්තකාල ව්‍යාපෘතිය හරහා කියවන සමාජයක් බිහි කරන්න කටයුතු කරනවා. අපේ සාමාජිකයෝ හැරුණු කොට කිසිදු සාමාජික ගාස්තුවකින් තොරව සාමාජිකත්වය ඕනෑම අයකුට ගන්නත් පුළුවන්. එතනින් අපි පාඨක සමාජයකුත් නිර්මාණය කරනවා. ඉතින් එතැනදී අපි හොඳ ගොඩනැගීමක් සහිතව ක්‍රියාත්මක වන නිසා පළමු ප්‍රකාශනයේදීම පොත් 1000ක් අලෙවිකර ගැනීමේ ගැටලුවක් ඇතිවන්නේ නෑ. වෙනත් භාෂාවකින් කියනවා නම් මේක සම්පූර්ණ ව්‍යාපෘතියක්. ඉතින් එහි මනා දිගුකල් පැවැත්මක් තියෙනවා. අන්න ඒකෙ පළමු වැඩසටහන විදියට තමයි මෙවර සාහිත්‍ය උලෙළ වෙනුවෙන් මාතලේ මේ වැඩසටහන පවත්වන්න කටයුතු කරන්නේ.



**සැප්තැම්බර් 26 වනදා මාතලේ දී සාහිත්‍ය උලෙළ වෙනුවෙන් වැඩසටහනක් පවත්වන්න කටයුතු කරලා තියෙනවා. එය දින 7ක පමණ වැඩසටහනක්. එයින් එක් දවසක් අපි 'පහන්ටැඹ සාමූහිකය' විසින් වෙන්කොට ගෙන තිබෙනවා.**

මාතලේ පැවැත්වෙනවා දින 7ක පමණ වැඩසටහනක්. එයින් එක් දවසක් අපි 'පහන්ටැඹ සාමූහිකය' විසින් වෙන්කොට ගෙන තිබෙනවා. ඒ සැප්තැම්බර් 26 වනදා. මේ වැඩසටහනේ මුඛ්‍ය දේශනය පවත්වන්නේ රත්න ශ්‍රී විජේසිංහ මහතා. ඒ වගේම වසන්ත බණ්ඩාර දුක්ගන්නාරාළ, යසනාත් ධම්මික බණ්ඩාර, කුමාර ලියනගේ, හෙන්රි වර්ණකුලසූරිය, නාලිකා කරුණාතිලක, තුසිත මලිත් ගුණරත්න, පුෂ්පා රම්‍යානි වගේ විශාල පිරිසක් එදිනට සම්බන්ධ වෙනවා. මෙතැනදී මූලිකවම වෙන්නේ ප්‍රවීණයන් සමඟ අත්දැකීම් මුණගැස්වීමක්. ඒ වගේම ළමයින් වෙනුවෙන් බලා කියවීමේ රසඥතාව දියුණු කිරීමට චිත්‍ර ප්‍රදර්ශනයක් පවත්වන්නත් අපි කටයුතු කරනවා. චිත්‍ර කියන්නේ කතා නොකරන වචන නැති පින්තූරය විසින් රසදැනීම් මවන වෙනමම භාෂා ලීලාවක්. තුන්වනුව අපි කියපු 'මහායාය' වෙනුවෙන් කීපදෙනෙකුට සම්මාන ප්‍රදානය කරන්නත් අපි බලාපොරොත්තු වෙනවා.

ඒ වගේම අපි උත්සාහ කරනවා සංස්කෘතික අමාත්‍යාංශය, ජනමාධ්‍ය අමාත්‍යාංශය, ජාතික පුස්තකාල මණ්ඩලය හා ගුවන්විදුලි සංස්ථාව, ස්වාධීන රූපවාහිනී සේවය හා සම්බන්ධව ජාතික වැඩපිළිවෙළක් බවට පත් කරන්න. ඊට අමතරව මාතර සහ අනුරාධපුර වැඩසටහන් පවත්වන්න බලාපොරොත්තු වෙනවා. මේ වැඩමුළු දෙක අපි පවත්වන්නේ ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ ප්‍රාදේශීය සේවාවන් හරහා. මෙහිදී තරගාවලියක් පවත්වන්න සූදානම් කරගෙනයි තියෙන්නේ. ඉන්පසු දෙසැම්බර් 17 හෝ 18 හෝ දෙදිනම කොළඹදී වැඩමුළුවක් පවත්වන්න කටයුතු කරලා සංස්කෘතික ඇමැතිවරයා විදියට මහින්ද රාජපක්ෂ අගමැතිතුමාගේ ප්‍රධානත්වයෙන් 'පහන්ටැඹම ස්වර්ණ සම්මාන ප්‍රදානෝත්සවය, පවත්වනවා. ඒ වගේම තමයි දිස්ත්‍රික් වශයෙන් පවත්වනු ලබන වැඩමුළුවලදී අපි අගයන්නේ ඒ ඒ දිස්ත්‍රික්කවල සිටිනා ප්‍රවීණයන්. අපි ඒක නම් කරලා තියෙන්නේ 'මහායාය ස්වර්ණ සම්මාන' කියලා.

අවසාන වශයෙන් කියන්න තියෙන්නේ මෙය ප්‍රධාන ජාතික වැඩපිළිවෙළක් මෙහෙයුම් කිරීමට ගොඩනැගෙන්නක්. පහන්ටැඹ පිළිබඳව තවත් ලෙසකින් සඳහන් කරනවා නම් අතීතයේ අස්වැන්න අනාගත පරපුරට භුක්තිවිඳීම සඳහා ගෙන යන තීර්ථ යාත්‍රාවක්. මේ තීර්ථ යාත්‍රාව පැදගෙන යෑමට වර්තමාන සහ මහායාය ප්‍රවීණයන් සියලුදෙනාම අප සමඟ රැඳී සිටිනවා. අපි ආරාධනා කරනවා මේ මහයායේ සිටින සියලුම කලාකරුවන්ට කිසිදු දේශපාලන භේදයකින් තොරව අප සමඟ එක්වන්න කියලා.

**රජිත බස්නායක**

# මනමාලියෝ

**රත්තරං සඳක් පායන්නයි...**

හඬ වැඩි කරපු රේඩියෝ එකෙන් ජෝතිගේ සින්දුවක් වැහෙනවා. මං දුවගෙන ගිහින් දොර රෙද්ද අස්සෙන් සුදු පුංචි ගේකාමරයට එබෙනවා. කණ්ණාඩිය ඉස්සරහ ඉඳගෙන ඉන්න එයාගේ රූපය කණ්ණාඩියෙන් ආයෙත් සැරයක් පෙන්නනවා. කොණ්ඩෙ කඩා දාලා. පැත්තකින් මලක් ගහලා. තොල් දෙක ළා රතු පාටින් පාට කරලා. කම්මුල් රෝස පාටවෙලා. සුදුපුංචි අද වෙනදට වැඩිය ලස්සන වෙලා. මම හොර පූසෙක් වගේ හෙමි හෙමින් එයා ගාවට ළං වෙනවා. සමන් පිච්ච මල් සුවඳක් නහය පුරා පිරෙනවා. එක එක පාට ගල් අල්ලපු සාරිය දිලිසෙනවා. අල්ලලා බලන්න ආස හිතෙනවා.

"යනවා... යනවා ළමයෝ අහකට ඔය ඇඳුම කිලිටි කරන්නේ නැතුව...."

පුංචි මාව ඇදලා අරන් එයාට තුරුලු කරගන්නවා. එයාගේ හීනි ඇස් දෙක දිලිසෙනවා.. එයාගෙ මූණේ පුයරු මගේ මූණෙත් තැවරෙනවා.

කුස්සිය පැත්තෙන් කෑම සුවඳක් ගේ පුරා පැතිරෙනවා. පුටු කවර දොර රෙදි පවා අලුත් වෙලා. අන්න.... අන්න මනමාලයා එනවා. හැමෝගෙම උනන්දුව එයා දැක ගන්න. මාත් දොර රෙද්ද අස්සෙන් සාලයට එබෙන්න උත්සාහයක යෙදෙනවා.

යන්න ළමයෝ අන්න අරහෙට ගිහින් සෙල්ලම් කරන්න. මං කුස්සිය පැත්තට වෙලා කෝම්පිට්ටු හදන්න පටන් ගන්නවා.

ඒ මහත්තයා ආණ්ඩුවේ හොඳ රස්සාවක් කරන්නේ..... පවුලෙත් තනි ළමයා... ඔය අලුත්ම වාහනේ ගත්තෙත් මේ ළඟදී... කිසි කරදරයක් නැතුව ඉන්න පුළුවන්. කපු මහත්තයා තව තව බලාපොරොත්තු දල්වනවා. දවල් හීන මවනවා අහසේ මාලිගා හදනවා. අත්තම්ලා නැන්දලා වට කරගෙන ඒ කතාවලට හූ මිටි තියනවා. අනෙක් අයට කොහොම වෙතත් දවල් කෑමෙන් පස්සේ හවස තේ එක දක්වාම වැඩේ ඇදගෙන යන්න කපු මහත්තයාගේ ට්‍රයි එක.

ඒ වැඩ කටයුතු ටික ඉවර වෙලා තව ටික දවසකින් සුභ ආරංචියක් අරගෙන එන බලාපොරොත්තුවෙන් කපු මහත්තයා පිටව යන්නේ ගානක් අතේ මිට මෙළවුවැයින් පස්සෙ.

'මේකවත් හරිගියොත් ලොකු දෙයක්' හැමෝම බලාපොරොත්තු පිරුණ සැනසුම් සුසුමක් හෙළනවා.

විවාහය කියන්නේ මනුෂ්‍යන්ගේ පරම්පරාව පවත්වා ගෙන යෑමේ ජීව විද්‍යාත්මක ක්‍රියාවලිය විධිමත් කිරීම සඳහා ගොඩනගාගත් සංස්කෘතික සංස්ථාවක්. ගැහැනියෙක් පිරිමියෙක් එකිනෙකාට ආකර්ෂණය වීම බලෙන් කරන්න පුළුවන් දෙයක් නොවුණත් විවිධ සමාජ මිණුම් දඬු උපයෝගී කරගෙන ඒ පෑහීම ඇති කරන්න අපේ වැඩිහිටි පරම්පරාව උත්සාහ ගන්නවා. සල්ලි,රස්සාව,යාන වාහන වගේ භෞතික දේවල් පදනම් කරගෙන අහිංසක හිත් විවාහය නැමති හිර කූඩුවේ හිර කරලා අනෙක් හැමෝම සතුටු වෙනවා.

සුදුපුංචිම වෙනත් විදියකින් වෙනත් තැනකදී එයා ළඟදි මට ආයෙම මුණ ගැහෙනවා. ආ ගිය තොරතුරුවල සිට කතාබහ විවිධ ඉසව් කරා දිව යනවා. දුක වගේම සතුටත් කැලතුණ ඒ කතාවේ අවසානයේ තියන්නේ එපා වීම හා කළකිරීම පිළිබඳ නොපෙන්වන ඡායාවන් ඒ අස්සේ පෙනෙන්නට තියනවා. සාද කතා හමාර වෙලා සංග්‍රහ භුක්ති විඳලා. බලාපොරොත්තු දල්වගෙන හැමෝම එන්න පිටත් වෙනවා. විසඳුමක් නොවුණත් යුතුකමක් විදිහට මම මුදල් නෝට්ටු කිහිපයකින් යුත් ඇන්ලොප් එක බුලත් හුරුල්ලකට යට කරලා තියලා එන්නට හැරෙනවා.

වැහි අන්ධකාරේ දූවගෙන ඇවිත් ඉරත් වහ ගන්නවා. ඒ මන්දාරම් දවසේ තියෙන්නේ මහ මුස්පේන්තු පෙනුමක්. බලාපොරොත්තු වූ සුභ පණිවිඩය වෙනුවට ඒ අසුභ පණිවිඩය වැහි අඳුරත් එක්ක ගේ ඇතුළට ඇවිත් කළු වලාවක වුණත් තියෙන්නට පුළුවන් රිදී ඉරිත් මැකිලා ගිහින්. වැස්සේ ඝෝෂාව අතරේ කපු මහත්තයගේ හිත හැදීමේ උත්සාහය දියවෙලා යනවා. මුළු ගෙදරම හුදෙකලා නිශ්ශබ්දතාව ක ගිලෙනවා. ඒ අතරින් නෝක්කාඩු බැලුම් හී සර වගේ ඇනුම් පද එහෙට මෙහෙට පා වෙනවා. සුදූ පුංචි ඒ හැම එකක් මැද අසරණ වෙලා බලාගෙන ඉන්නවා. තමන් නොකරපු වරදකට පසු තැවෙනවා. ගැහැනු ආත්මයක් ලබන්නේ පෙර ආත්ම වල පව් කරලා තියෙන නිසා කියලා ආත්තම්මා තමන් අහපු බන වල තියෙනවා කියලා කියනවා මං අහගෙන ඉඳලා තියෙනවා. සුදු පුංචිත් ගිය ආත්මේ පව් කරපු කෙනෙක්ද? ඒක එහෙම නොවෙන වග පසුකාලීනව ෆෙමිනිසම්වලදි මම ඉගෙන ගන්නවා.මට සුදුපුංචි ගැන අනුකම්පාවක් දැනෙනවා ඒත් එක්කම ගේ ඇතුළේ දඟලන මේ පාළුව මගේ හුස්ම හිරකරනවා. මම දූවගෙන ගිහින් සුදුපුංචිට තුරුලු වෙනවා. හිස් බැල්මෙන් පිරුන ඇගේ ඇස් දෙකේ කඳුළු බින්දුවක් නළියනවා. හෝ ගාගෙන එන සුළං රැල්ලත් අම්බොක්කෙ කන්දේ හැපිලා අඬාගෙන වැටෙනවා. එයින් බින්දු දෙකක සීතල මගේ ඔළුවටත් දැනෙනනවා.

හැමකෙනාටම ඕනෑ තමන් කොහොමහරි ගැලවෙන්න ඒකට කියන්නේ "යුතුකම් ඉටුකරනවා කියලා" අනිත් කෙනාගේ මානසිකත්වය කොහොම උනත් තමන්ගේ යුතුකම ඉටු කරන්නනයි හැමෝගෙම වුවමනාව තියෙන්නේ'. ඒ සඳහා එන බාධක ඔවුන් දකින්නේ ඒ කෙනාගේ පෞද්ගලික වරදක් විදිහට. එය විවිධාකාරයෙන් ප්‍රකාශයට පත් වෙනවා. සුදුපුංචිත් ඒ ප්‍රකාශනයන්ගේ වින්දිතයෙක්ද?

"අරෙහෙන් උත්තරයක් අහලා එවලා තියෙනවා. මොකද කියන්නේ කියලා යවන්න වෙයි" එයා හොඳයි. කියන්න තරම් වරදක් ඇත්තෙත් නෑ. ඒත් දෙන්නෙක් අතරේ විවාහයක් සඳහා ඒක පමණක් ප්‍රමාණවත්ද? අනෙක් සියලුම දේ ගැලපුනත් ඒ හිතේ ඇඳුණු රූපය නෙවෙයිනම් ඒක අපි දෙන්නගේ වරදක්ද? මිනිස්සුන්ගේ සිතුම් පැතුම් අදහස් එකිනෙකට වෙනස් ඒක ස්වාභාවිකයි. ඒ වෙනස තේරුම් ගන්න අනිත් අයට බැරි ඇයි?

අකැමැත්තෙන් වුණත් මම ඒ අවාසනාවන්ත පණිවිඩය කියලා ඉවර කරනවා. වැහි අන්ධකාරෙත් එක්ක එන ඒ අඳුරත් මන්දාරමත් මට පේනවා. වෙල් එළිය දිගේ ඇදිලා එන මූසල නිහඬකමින් ගේ පිරෙනවා. ඒ නිහඬතාවය අස්සෙන් මට ආයෙත් සුදුපුංචිගේ මූණ මැවිල පේනවා.

**සමන්ත ඒකනායක**
**කළමණාකරු**
**ලංකා බැංකුව**

## පොත් වසන්තය

ගොරහැඬි ධනීය ගෝපාලලාගේ
මහා පහයවල් හැඩ කරන
විසල් පොත් වීදුරුවකින් බැමි ලන
තවත් සුර සැපට දෙස් දෙන

ඉදින් සැප්තැම්බරය පැමිණ ඇත....
දුහුනන් අතර තෙරපි තෙරපී
අතගා බලා සුවඳම ඉඹින
කහවණු නැතත් මිල දී ගන්න
දැක ගැනුම පමණින්ම සැඳහෙන

ඉදින් සැප්තැම්බරය පැමිණ ඇත.....

මඩිය තර කරගන්න එකවර
බාල කොළ වුව ද වට කර
සෝබන පිට කවර දිදුලන
පරණ ඒවා අලුත් කරවන

ඉදින් සැප්තැම්බරය පැමිණ ඇත.....

අවුරුද්දක් පුරා බඩ ගා තැනින් තැන
දෙන්නම් කාසියට අස්සන ගසා ප්‍රකාශකයාට
අච්චු ගහගත්ත පොතේ හීනය
පපුතුරේ ඔජ වඩන දිරි දෙවන

ඉදින් සැප්තැම්බරය පැමිණ ඇත.....

**චම්පා කුමාරි දිසානායක**

## දැහැන් බිඳිණී

**නිමිත්ත -**
**දෙහිවල ලංකා බැංකුවේදී දුටු**
**අම්පාරේ පොඩි හාමුදුරුවෝ**

කසාවත පෙරවුව ද
සිඟිති වහන්දෑ
මතක කෙළිදෙළෙන්
ලොකු හාමුදුරුවන්ගේ
ඇකයෙහි සැතපී
සුව යහනක වැනි සෙව්වේ පිය සෙනෙහස
නොවෙ ද
යතිවර දිවි සැරියෙහි

**දුශානි තත්සරණී අපොන්සු**



## නැසී ගිය බිරියට

නැතිමුත් කිරි ගරුඬ දිලිසෙන මැණික්      කැට
මා හද ගැබත් සොහොනක් නුඹ නමට      කැප
එනමුදු ලොව පුරා ඒ ගැන පතළ      නැත
නුඹවත් දන්නෙ නෑ මගෙ ටජ් මහල      ගැන

කෙරුවත් මහල් පායක් ඔහු බිරිය      නමින්
මිණි කැට ඔබ්බවා කිරි ගරුඬ      ගලින්
ඇයගෙම නැගණි පවාගත් බිරිඳ      ලෙසින්
කෙලෙසද නොතේරේ අයදිම් කියන      ලෙසින්

නුඹ ගිය දා පටන් දෙව්ලොව සුවය      සොයා
මගේ ලොවට පැයූ හිරු මැකී      ගියා
නුඹ ගිය මගේ පියවර මත අඩුය      තියා
එන්නද මමත් අපි යමු එකටම එකතු      වෙලා

**මලිත් රත්නායක**

## දැඩි සත්කාර ඒකකයේදී

යන්නට පොරබදන
ජීවිතය අල්ලාගෙන
හිත හොඳ වයර්
සුසුම්ලයි

**ජයන්ත ජෝතියරත්න**

## රටේ හැටි

පැරදුණාම
දෙගුණ තෙගුණ වන
උද්යෝගය
දිනපු ගමන්
පල්ලම් බහින
ඉක්මන

**සන්තුස දිසානායක**

## දැකීම

සමහර හැඩ ලස්සන කළුවරට
ලොකු වැහි බින්දු පොළොවට
මොට්ටු තබන හැටි අරුම
ඇබ්බැහිකමේ හැඩ
බලන් කදිම

**ශාන්ත කුමාර අපෝන්සු**
රත්මලාන

## සත්‍යයේ හඬ

නැඟී සිටින්නට සත්‍යයට
ඇවැසි නැත මුක්කු කිසිවිටෙක
නුමුදු මුක්කු නොමැතිව
නැඟිටීමේ ශක්තියක්, කිසි විටෙකත්
නොමැත බොරුවට.

**ගාමිණී බණ්ඩාර ඉලංගන්තිලක**
මස්කෙළිය

## යහළුවන්ට

සිහ ධජයේ රන් අසිපත සිප ගමුද යහළුවේ
දඹුලු ලෙනෙන් බුදුරැස් දැක ගමුද යහළුවේ
කලා වැවේ දියරැළි මත සැනසෙමුද යහළුවේ
සීගිරියේ පිය ගැට නැග හිනැහෙමුද යහළුවේ

කුරුලු පාළුවේ විහඟුන් ගී අසමු යහළුවේ
සිරිපා සිඹ එන මඳනල අල්ලමුද යහළුවේ
මහ සෑයෙන් දම්සක් හඬ අසමු යහළුවේ
රන් අස්වනු නෙළනා අත් සිප ගමුද යහළුවේ

බිලිඳු තොලක හසරැල්ලට ගී ලියමු යහළුවේ
ගලා හැලෙන දිය ඇල්ලට පෙම් බඳිමු යහළුවේ
උස්මිටිකම් පා යට සඟවමුද යහළුවේ
මිනිසත්කම රජයන ලොවකට යමුද යහළුවේ

**ෂෙල්ටන් හෙට්ටිආරච්චි**
නුවරඑළිය

# හිමිදිරි පෙරදෙස



## වැදුණිම රස්නය කොල්ලෙක්ගෙ ළයට

කිරි නාවෙ දෙනතින් පිරිමිකමට
සෙනෙහස අඩු හින්දයි නුඹ හිතුවද
ඇට මිදුළු කිමිදී තිබේ පිතු පෙම
සුදෝවුන් රජු කීවේ බුදු සමිඳට

ප්‍රජාපතී නොවෙතැයි හීතියට
සුළු මවක් කැන්දුවේ නෑ පැළට
මල්වර වුණොත් වෙයි ලජ්ජාවට
මුදවන්නයි තනි කෙරුවෙ රෑට

ඒක දෙක කුරුළෑ මතු වෙද්දි
මයෙ හිතෙයි ලප කැළල් ඇන්දි
සැඟවුයේ හඬතැයි රිද්දී
ගැහුණි පපුව තටු සොලවද්දි

රහසින් ගියේ මෝචරි වැඩට
අපුලක් දැනේ හිතුණා නුඹට
මිනියක් වෙලා ආවේ ළඟට
දකින්නද බුදු කෙනෙකුන් ලෙසට

බොරුවටද දූ දැන්වත් කියන් මට
බයයි තාත්තෙ කීවෙ දුම්රිය හඬට
වැදුණිම රස්නය කොල්ලෙක්ගෙ ළයට
මැකුවද රස්නය තාත්තගේ තදට

**තැන්නහේනේ නාගිත හිමි**

## ත්‍රිකෝණ ආදරය

කඩඉම් ත්‍රිකෝණයෙ මුලු තුනකටම වෙලා
සිටිනා විටදි ඔවුනොවුන ගෙ මුහුණ බලා
තරමක් දුරට ජීවිතයට උරණ වෙලා
වරදට දඬුවමක් දෙයි තුන් සිතම පෙළා

සෙනෙහස ඔබට විතරයි මම සදහටම
කීවත් එලෙස දෙපසක සිටි දෙදෙනටම
තින් සිත තුළ උපන් සෙනෙහස නොවන නිම
වූවා සමච්ඡේදනයක් ඉබේටම

සිතුවද රැඳී ඉන්නේ පාදයෙ සිරස
හැම පාදයම සැකසී ඇත එක විලස
තුන් ඇඳුතුවටම අහිමියි තම නිවස
ජීවිත අම්බලම් තුනකය අද දවස

දහසක් චෝදනා එල්ලව අඩු නැතුව
අසතිය දනෝ එක එක විදිහට නඩුව
කීකරු කමක් නැති සිතකින් පෙම් වැඩුව
පාපෙට දඬුවමක් ඇත විඳවිය යුතුව

කකුළුව හැළිය තුළ දිය රත් වන තුරුම
මොහොතක වින්දනය ලබතිය දැනදැනම
සෙනෙහස වැඩුවෙ සිත ඉවසනු තැනම
දැන සිටියා නියත බව දඬුවම් විඳුම

ඇය මෙන් මැයද හැරදා යන්නට බැරිය
පෙම්වතියන් දෙදෙන නිති දෙනුවන් සරිය
කවුරුන් කියන මුත් මේ දෙය යුතු නැතිය
ඔවුන්ද මෙවන් දේ රහසින් කර ඇතිය

තුන් කෝණයේ පාදෙට වී තුන් මුල්ලේ
තනි වී විඳින විට දැවෙනා සිතිවිල්ලේ
ප්‍රේමයෙ ගීය ගයමින් දුක් ගැනවිල්ලේ
දැන දැන ඇයිද තව මෙලෙසින් ළතැවිල්ලේ

**ගාමිණී ලිවේරා**
මුන්දලම

## ඇයයි සීතා

සත්‍යාලය මෙයයි සීතා
වත් මත් ලෞකික ආලය නොවීලා
හදින් හද බැඳිලා සසර පුරා
එකිනෙක සැනසුම පතා වෙන්වීලා

දෙනෙත් අභියස දුක් ගී ම ගයාලා
වෙන්ව ගොස් කැපකලේ ආදරේ පතාලා
අන්හිතක සුව පිණිස ගියේ වන වැදීලා
නියම පතිනිය ඔබයි සීතා....

සියලු බාධක හමුවේ හැරනොගොස්
නිදයි ඈ තම ස්වාමියා ළඟ
දුරුකර දුක ඔහුගේ
නිවා සනසයි සිතම පවනින්

සියලු ලියනි ගන්න ආදර්ශයට
ඈ....
පතිවත රකින්නී.. සොවින් හද පුරන්නී
සීතා...

**දෙව්මි සූරියබණ්ඩාර**

## තනි තරුව

මන්දාකිනියම පුපුරා ඇදී
හැඟුමන් අතරමං වී ඉකිගසයි
බොඳ වූ සිහිනයක පාට සේදී
තරුවක් සුසුම්ලයි අනන්තයේ
පාළුව තනි රකී හුදෙකලාවට
ඇසෙයි ඉකිබිඳුමක් තරුවේ
අනන්ත විශ්වයේ දෝංකාරය දී
පලායන වලාපටින් එහා
සිතිජයට අතවනන මායිමේ
තරුව තවමත් බලාහිඳී
බොඳ වී වියැකෙන හැඟුමන් දෙස

**ජනත් පෙරේරා**



## මහ මඟට ඇද වැටිච්ච

ඉන්නට හරියට ගෙයක් දොරක් නැති වේච්ච
ගිණි ගහන අවුවටත් හොඳ හැටි හුරු වේච්ච
තෙමී ගෙන වැස්සටත් හොඳ හැටි හුරු වේච්ච
පෙර කල ඇති පවකට මහ මඟට ඇද වැටිච්ච

මට හැකිනම් හමේන් වැහිච්ච ඇතුලේ උනුවේන
හිත් පපු ඇති මගේ බුදු මහත්තරුන්ට පිං දෙන්නම්
කියක් හරි දීලා යන්න මහ මඟටවී මැරි මැරී ඉපදෙන
නෙමැරී උහුලන මේ කුස ගිණ්දර මට නිවා ගන්න

**කසුන් ලක්ප්‍රිය**
ගම්පොල,කහටපිටිය

# ඒ ඇස්වල කිසිම වෛරයක් තිබ්බේ නෑ

# MALENA





සිසිලියා නගරය මැද්දෙන් යුද ගිනි දැල් ප්‍රීතියෙන් ඉහළ නගිමින් තිබුනා. මිනිස්සු නගරය මැද්දට එකතුවෙලා මුසොලොනීට ප්‍රීතිඝෝෂා කරන්න පටන් ගත්තා. මිනිස්සුන්ට ඕනෑ යුද්ධය. මුසොලොනී නාසීන් එක්ක එකතුවෙලා උන්ට විරුද්ධ ඔක්කොටම එරෙහිව යුද්ධය ප්‍රකාශ කරලා. මිනිස්සුන්ට ඕනී යුද්ධය . මිනිස්සු ප්‍රීතියෙන් කෑ ගහනවා.

"මුසොලොනීට ජයවේවා ! ඉතාලියට ජයවේවා! "

ඒ නපුරු රාක්ෂයෝ අරක්ගත්ත පාප අඩවියේ මුහුදට යාබදව තිබ්බ මහ මූසල පාරේ මගේ අහිංසකාවිය, මගේ ප්‍රේමයේ අයිතිකාරිය , මගේ ආදර මලීනා හිමින් සැරේ ඇවිදගන යනවා. ඉරිසියාවෙන් පුපුරු ගහන ගෑනුන්ගේ ඇස්වලින් මලීනාගේ ඇස් පුච්චලා දැම්මා. ආශාවෙන් උමතුවෙච්ච පිරිමින්ගේ ඇස් මලීනාගේ ඇඟ හැමතැනකම එල්ලුණා.

අනේ මගේ සුන්දර මලීනා... මං කොයිතරම් ආදරෙයිද ඔයාට. මං ඇත්තටම ආදරෙයි ඔයාට. ඒත් මට ඕනී ඔයාව සිපගන්න. ඔයාගේ ශරීරයේ හැම තැනක්ම උමතුවෙන් සිපගන්න. මං ඉන්නේ උමතු වෙලා. ඒත් මං ඔයාට ආදරෙයි. මං මේ නගරේ ඉන්න අනිත් පිරිමි වගේ නෙවෙයි. මං ඔයාට ඇත්තටම ආදරෙයි. යුද්ධයට ගියපු ඔයාගේ මහත්තයට පස්සේ මේ ලෝකේ ඔයාට ඉන්නේ මං විතරයි......

දවසක් පිරිමි ආශාවෙන් බලාගෙන හිටපු ඒ නපුරු ආරංචිය නගරය හැමතැනකම පියාඹලා ගියා.

'මලීනාගේ මිනිහා මැරිලා'

ගෑහැනු තමන්ගේ පිරිමි දිහා සැකයෙනුත් භීතියෙනුත් බලාගන හිටියා. මේ අතර පිරිමි මලීනාගෙ සුන්දරත්වය ගැන හීන මැව්වා. සියල්ල වෙනස් වෙන්න ගියේ එකම එක හැන්දෑවක් විතරයි. ගොම්මන් වෙලාවක මලීනාගේ ගෙදරට ගියපු හමුදා නිලධරයෙක් නිසා මලීනා අල්තාරය ඉස්සරහට කැඳෙව්වා. ගෑහැනු බලාගෙන හිටියා මේ පව්කාරියට ගල් ගහන්න. ඒත් පිරිමි මලීනාගේ නාමය පවිත්‍ර කරන්න දිව් හිමියෙන් කැපවෙලා හිටියා. ඒ එකම එක හිලව්වකට . මලීනාගේ සුන්දර ශරීරය උන් ගාස්තුව වෙනුවෙන් ඉල්ලා හිටියා.....

සිසීලියාවට බෝම්බ වරුසාවල් වැටෙනකොට මලීනාගේ තාත්තා ස්වර්ගස්ථ වුණා. අහෝ අසරණ මලීනා. මලීනාට බඩගින්න වෙනුවෙන් තමන්ගේ ශරීරය උගස් තියන්න සිද්ද වුණා. මං ඒ හැමදෙයක් දිහාම වේදනාවෙන් බලාගන හිටියා. යුද්ධය එනකොට හිටපු නැති දෙවියෝ මලීනා වෙනුවෙන් එන්නේ නෑ කියලා මං දැනගත්තා. පාන් රාත්තලකට පිරිමි ඇවිත් මලීනාට ළං වුණා. ඒ වෙනුවෙන් මලීනා ඉල්ලුවේ එකම එක දෙයයි.

'හෙට එනකොට කන්න මොනවා හරි ගේන්න'

යුද්ධය ඉවර වුණා. මිත්‍ර හමුදාව සිසිලියාවට ආවා. එතකොටත් මිනිස්සු ප්‍රීතිඝෝෂා කරන්න පටන් ගත්තා. ඉරිසියාවෙන් ඇස් ගෙඩි ගින්දර වෙලා තිබ්බ ගෑනු මලීනාව නගරය මැද්දට ඇදගන ආවා. ඇගෙ රන්වන් කෙස් කලඹ උගුල්ලලා දැම්මා. ගෑනුන්ගේ පා පහරවල් වැදිලා රතුම රතුපාට ලේ නගරය මැද්දට හැලුනා. ගෑනු කේන්තියෙන් පහර දෙනකොට අඳුරේ පව්කරපු පිරිමින්ගේ ඇස් ඉබාගාතේ යන්න පටන් ගත්තා. මං කිසිම දෙයක් කරකියාගන්ට බැරුව බලාගන හිටියා....

එක රැක ශුද්ධවන්තයන්ගේ භූමිය අත්හැරලා පව්කාරිය පලා ගියා. තුවාල වෙච්ච මගේ හදවතත් එක්ක මං දිවා රෑ හඬා වැටුණා. ටික දවසකට පස්සේ නිනෝ මලීනාගේ ප්‍රියාදරයා නගරයට ආවා. අප්‍රිකාවේ මුසොලොනී වෙනුවෙන් ඉතාලිය වෙනුවෙන් ඉංග්‍රීසින්ට විරුද්ධව සටන් කරපු වීරයා තමන්ගේ ආදරවන්තිය හොයාගන තමා උපන් භූමියට ආවා. ඒත් යුද්ධය ඉල්ලපු කිසි මිනිහෙක්ට නිනෝගේ වටිනාකමක් තිබ්බේ නෑ. යුද්ධය ඉවරයි. දේශප්‍රේමය ඉවරයි. ඒත් මලීනා මං ඔයාට ඇත්තටම ආදරෙයි. මං නිනෝට පාර පෙන්නුවා ඔයා ඉන්න දිශාවට. ඔයා වෙනුවෙන් මට කරන්න පුළුවන් එකම දේ ඒක විතරයි. ....

ඊට හරියටම අවුරුද්දකට පස්සේ මලීනයි නිනෝයි ආපහු නගරයට ආවා. ඒ දෙන්නා හරිම ආදරයෙන් අත්වැල් අල්ලගෙන ඇවිද්ගන ආවා. මැරිලා ඉපදිච්ච මිනිස්සු ඔයත් එක්ක හිනා වුණා. මං දැක්කා ඔයාගේ ඇස් දෙක තාමත් ආදරෙන් දිලිසෙනවා. ඒත් ඒවා වේදනාවෙන් ගැහුණා.

එහෙත්

අනූ බණ්ඩාර

2020 සැප්තැම්බර් 19 සෙනසුරාදා කොළඹ ඩී.ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරන ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.